සාම විමර්ශ

13 වැනි වෙළුම 02 වැනි කලාපය / 2016 දෙසැම්බර්
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි



නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ජනතා සිහිනය සහ යථාර්ථය

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු / නීතිඥ එස්. ජී. පුංචිහේවා / ආචාර්ය ජයම්පති වික්‍රමරත්න / අමාත්‍ය රවුෆ් හකීම්
ධර්මලිංගම් සිද්ධාර්ථන් / නීතිඥ සුදර්ශන ගුණවර්ධන / අනුර දිසානායක

පුරවැසියා වෙබ් අඩවිය

පුරවැසි ජනජීවිතයට අදාළ,

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු සියලුම නීති, අණපනත් සහ රෙගුලාසි
- පුරවැසියාට අදාළ ඉහළ අධිකරණයෙන් විනිශ්චිත නඩු තීන්දු සහ අනෙකුත් වැදගත් නඩු තීන්දු
- රාජ්‍ය හා පොදු ආයතනයන්හි ආකෘති පත්‍ර
- පුරවැසි ක්‍රියාකාරීත්වයේ නවීන තොරතුරු
- මූලික අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්
- පුරවැසි ක්‍රියාකාරීත්වයෙන් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර
- පුරවැසි සභා - පිළිබඳ තොරතුරු

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව ත්‍රෛභාෂාවෙන්
පුරවැසියා වෙනුවෙන්ම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

වෙතින්

www.citizenslanka.org

සාම විමර්ශී

සංස්කරණය **ලයනල් ගුරුගේ**

ISSN 955-1800-0061

13 වැනි වෙළුම 02 වැනි කලාපය 2016 දෙසැම්බර්

දුරකථනය 94-1-2370801/4
ෆැක්ස් 94-1-2370802
ඊ-මේල් cpa@cpalanka.org
වෙබ් www.cpalanka.org

රටට ඔබින නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ වගකීම මේ මොහොතේ තිබෙන වැදගත්ම කථිකාවයි.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සාධනීය අවසානයක් කරා ගෙන යාම රටට යහපත් අනාගතයක් උදාකරලීමේ අවශ්‍යතාවය තිබෙන සැමගේ පරම අපේක්ෂාවයි. මේ අපේක්ෂාව කඩතොලුවන සිදුවීම් පෙනෙන්නට තිබීම කණගාටුදායකය. එමෙන් ම මේ ඓතිහාසික වගකීම ඉටුකිරීම සඳහා ප්‍රතිඥා දුන් නායකත්වය ඒ පිළිබඳ කුකුසකින් පසුවන්නේ ද යන සැකය මෝදුවෙමින් පැවතීම ද හානිකර ය. වැඩි මහජනතාවක් අවදානම් සහගත මොහොතක ආණ්ඩු වෙනසක් ඇති කිරීම සඳහා පැහැදිලි ජන වරමක් ලැබිණ. ඒකාධිපතිත්වයට පාර කැපූ තිස් අට අවුරුද්දක් පැරණි ව්‍යවස්ථාව වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී යහපාලනයට තුඩු දෙන නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට ආණ්ඩු වෙනසට මුල් වූ ජන නායකයන්ගේ මූලික පොරොන්දුව විය. එහෙයින් ජනවාරි 8 ජන වරම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා ලද ප්‍රබල ජන වරමකි. සාධාරණ සමාජයක් සඳහා වූ සමාජ ව්‍යාපාරයක් සඳහා නායකත්වය දුන් මාදුළුවාවේ සෝපිත හිමියන්ගේ ප්‍රධාන අරමුණ වූ විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින් ම අහෝසි කොට නව ව්‍යවස්ථාවක් නිර්මාණය කරන බවට නාහිමියන්ගේ දේහය අභිමුඛව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රතිඥා දුන්නේ ය. 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කොට 19 ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම ජනාධිපතිවරයා ගත් නිර්භීත පියවරකි. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමහර ඇමතිවරු 72 ව්‍යවස්ථා සම්පාදනයේ මූලයක් මත රැඳීමත් ජනාධිපතිගේ අධිෂ්ඨානය පලුදු වූ ආකාරයත් පෙනෙන්නට තිබේ. 1972 දීත් 1978 දීත් ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියෙන් දෙමළ දේශපාලන නායකත්වය පිටමං කෙරිණ. කිසියම් සාධනීය සාකච්ඡාවකින් අනතුරුව 2000 දී චන්ද්‍රිකා කුමාරතුංග නායකත්වයෙන් ගෙනෙන ලද 2000 ව්‍යවස්ථා කෙටුම්පත ද කඩාකප්පල් කිරීමට එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ එක්ව කටයුතු කරන ලදි.

වත්මන් ආණ්ඩුව නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ආරම්භ කරන ලද්දේ 30 අවුරුදු යුද්ධයෙන් පස්සේ පෑරුණු හදවත් වලට සංහිඳියාවේ හුස්ම වැටිය යුතු අවස්ථාවක දී ය. මහජන අදහස් විමසීම සඳහා ලාල් විජේනායක මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටු වාර්තාවද එළි දක්වා ඇත. මෙම ක්‍රියාවලියට බහුතර මහජනතාවක් සහභාගි නොවූනද එහි අන්තර්ගත සාධනීය යෝජනා රැසක් ඇතුළත් වී තිබේ. ඒ අනුසාරයෙන් පාර්ලිමේන්තු අනු කමිටු වාර්තා 6ක් ප්‍රකාශයට පත් වී තිබේ.

එහෙත් ඒ අතර තුර රට බෙදීමේ ව්‍යවස්ථා භීතියක් රට තුළ ඇති කිරීමට පරාජිත දේශපාලන පාර්ශව ජාතිවාදී භික්ෂු කණ්ඩායම් සමග කටයුතු කර ඇත. මේ පරාජය කිරීමේ සංනිවේදන යන්ත්‍රණයක් රජයට නැත. එමෙන්ම නැගී එන ජන විරෝධය හමුවේ නව ව්‍යවස්ථා කෙටුම්පත ජනමත විචාරයෙන් පරාජයට පත්වේ යයි බියක්ද ආණ්ඩුවේ පාර්ශවයන්ගෙන් ඇහෙන්නට පටන් ගෙන ඇත. මේ නිසා ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය මන්දගාමී වී ඇත. ඇතැම් පිරිසක් ව්‍යවස්ථා සංශෝධන 3/2 ඡන්දයෙන් පමණක් වන මට්ටමට යා යුතු බවට සඳහන් කරයි.

ජනාධිපතිවරයා බලයට පත් වූයේ නව ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඥා ජනතාවට දීමෙනි. එහෙයින් තම පක්ෂය සවිමත් කර එය දිනවීම සහ ආණ්ඩු බලය රඳවා ගැනීම ඔස්සේ ව්‍යවස්ථා සම්පාදනය පසුපසට ගැනීමේ උත්සහයක් පෙනේ. ඒ ජනාධිපතිවරයාගේ දේශපාන සදාචාරය අර්බුදයට යවන්නකි. ප්‍රජාතන්ත්‍රවාදී රටක් නිර්මාණය කිරීමේ අවසන් අවස්ථාව ජනතාවට අහිමි කිරීමකි. ජනාධිපතිවරයාගේ හා අගමැතිවරයාගේ දේශපාලන ඉරණම වෙනස් කිරීමේ දේශපාලන කුණාටුවක් බවට පත්විය හැකි ය.

ඩිමොක්‍රසි රිපෝටින් ඉන්ටර්නැෂනල් (DRI) ආයතනය විසින් මේ සඟරාව මුද්‍රණය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මහජන අදහස් යෝජනාවලිය පිළිබඳ රට පුරා අවැසි රැස්වීම් සඳහා දායකත්වය සපයනු ලැබීය.

විවිධ සහාය **මහින්ද රත්නායක, ළහිරු කිතලගම**

පරිගණක අක්ෂර / පිට කවරය / පිටු සැලසුම **වාක්‍යා රූ දු.ඇ. 011-2708377** මුද්‍රණය **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 0777-315971**

"සාම විමර්ශී" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සාම හා ගැටුම් විශ්ලේෂණ ඒකකයේ සහ ප්‍රජා සහභාගිත්ව ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබූයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වු කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"සාම විමර්ශී" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.

වැඩිදුරට විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

සංස්කාරක, "සාම විමර්ශී"
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2081384/06 ෆැක්ස් 94-11-4714460 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

පටුන

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ජනමත විචාරණයක් අවශ්‍යයි. 3
ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

අපි කවරදා ගැතිකමෙන් නිදහස් වෙමු ද? 5
නීතිඥ එස්. ජී. පුංචිහේවා

විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීමට ජනාධිපති සහ අගමැති එකඟයි............. 7
ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

නොබෙදුණු රටක උපරිම ලෙස බලය බෙදීමක් අවශ්‍යයි 12
අමාත්‍ය රවුෆ් හකීම්

ෆෙඩරල් සහ ඒකීය යන කාරණා පිළිබඳව ජනතාව ඉන්නේ වැරදි අවබෝධයකයි 15
ධර්මලිංගම් සිද්ධාර්ථන්

මහජන අදහස් විමසීමෙන් පසු ජනතා අදහස්වලින් බිඳක් 18

සනත් ජයසූරිය සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව: සෝ ක්ලෝස්; සෝ ෆාර් 26
නීතිඥ සුදර්ශන ගුණවර්ධන

යහපත් ප්‍රතිසංස්කරණ සහිත ව්‍යවස්ථාවක් වෙනුවෙන් අපි සහාය දෙනවා 31
අනුර දිසානායක

අනු කමිටු වාර්තා .... 35 - 73

රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව 36

මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව 38

මධ්‍යම-පර්යන්ත සබඳතා අනුකාරක සභාවේ නිර්දේශ 41

මුදල් පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව නිර්දේශ: 48

අධිකරණය පිළිබඳ අනුකාරක සභා වාර්තාවේ සාරාංශය: 54

ජාතික හා මහජන ආරක්ෂාව සහ පොලීසිය හා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව 58

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලිය පිළිබඳ මහජන මත විමසුම 74

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ජනමත විචාරණයක් අවශ්‍යයි.

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වර්තමාන තත්ත්වය හා එහි යථා තත්ත්වය කුමක් ද?

මේ වන විට ව්‍යවස්ථා සභාවට සියලු ම අනුකමිටු වාර්තා සකස් කර භාර දී අවසන්. ඒවාට වඩා ප්‍රධාන වන්නේ මෙහෙයුම් කමිටු වාර්තාවයි. නමුත් තවම මෙහෙයුම් කමිටු වාර්තාව සකස් කර භාර දී නැහැ. රාජ්‍ය ඒකීය ද නැද්ද යන කාරණාව, බලය බෙදීම සහ මැතිවරණ ක්‍රමය යන කාරණා පිළිබඳ මෙහෙයුම් කමිටුවේ සාකච්ඡා වී තිබෙනවා. එම මාර්තෘකා පිළිබඳ තවම එකඟතාවක් නැහැ. යම් ප්‍රමාණයක් හෝ දැනට එකඟතාවයක් තිබෙන්නේ මැතිවරණ ක්‍රමයේ පමණයි. ඉදිරි සාකච්ඡාවලදී අනෙකුත් කාරණා පිළිබඳ එකඟතාවක් ලැබුණහොත් එම වාර්තාව ව්‍යවස්ථා සභාවට භාර දෙන්න පුළුවන්. ව්‍යවස්ථා සභාව එය සම්මත කලහොත් කැබිනට් අනුමැතිය ලබාගෙන ව්‍යවස්ථා කෙටුම්පතක් හැටියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තුනෙන් දෙකක අනුමැතිය ලබාගත හැකියි. ඉන් අනතුරුව ජනමත විචාරණයක් සඳහා ඉදිරිපත් කිරීමේ වැඩකටයුතු යෙදී තිබෙනවා.

newsin.asia

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ

සැබැවින් ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජය ගැනීමේ හැකියාව ආණ්ඩුවට තිබෙනවා කියා මා හිතනවා. ඒ සඳහා ආණ්ඩුවේ පක්ෂ දෙකම ජනතාවට කතා කළ යුතුයි. ඇයි අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍ය, එයට ඇතුළත් කර තිබෙන්නේ මොනවාද ආදිය පිළිබඳ පුරවැසියා දැනුවත් කළ යුතුයි.

දැන් තිබෙන ප්‍රශ්නය මේකයි, අපි හැමෝම දන්නවා ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂ දෙකම දැන් එතරම් ජනප්‍රිය නොවන බව. එම පක්ෂ අතර යම් යම් ගැටුම් තිබෙනවා. විශේෂයෙන් ම මා දන්නා හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනමත විචාරණයකට යන්න අකමැති බවයි පෙනෙන්නේ. හේතුව තමා නව පක්ෂයක් හැදෙමින් තිබෙනවා. රාජපක්ෂ කණ්ඩායමේ අය එයට එකතුවෙලා තියෙනවා. සමුපාකාර ඡන්දයෙන් අනතුරුව යම් භියක් හටගෙන තිබෙනවා, ඔවුන් තුන්වන තැනට තල්ලුවෙයි කියලා.

අනෙක තමා පළාත් පාලන මැතිවරණය තිබෙනවා. එහිදී පක්ෂ හැටියට තමා ඡන්දය ලබා දෙන්නේ. නමුත් ජනතම විචාරණයේදී එසේ වන්නේ නැහැ. බොහෝ දේවල් එයට අදාළ වේවි. බ්‍රිතාන්‍ය ජනමත විචාරණය, ඉතාලි ජනමත විචාරණය සහ කොලොම්බියා ජනමත විචාරණය ආදිය පැවැත් වුණා. ඒවායේ මුලින් කියලු දේවල් නොවේ අවසානයේ දී සිදු වුණේ. ඉතින් ඒ භිය මෙහෙත් තිබෙනවා.

නව ව්‍යවස්ථාව ගෙන ඒමේ දී පළමු වතාවට තමා ජනමත විචාරණය පිළිබඳ බියක් තිබෙන්නේ. කලින් භියක් තිබුණේ පාර්ලිමේනතුවේ තුනෙන් දෙකක් ලබා ගැනීම සම්බන්ධයෙන් පමණයි.

මෙවැනි තත්ත්වයක් හමුවේ ව්‍යවස්ථාව ජයගත හැකි ද? ජයගැනීම සඳහා ඇති අභියෝග මොනවා ද?

සැබැවින් ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජය ගැනීමේ හැකියාව ආණ්ඩුවට තිබෙනවා කියා මා හිතනවා. ඒ සඳහා ආණ්ඩුවේ පක්ෂ දෙකම ජනතාවට කතා කළ යුතුයි. ඇයි අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍ය, එයට ඇතුළත් කර තිබෙන්නේ මොනවාද ආදිය පිළිබඳ පුරවැසියා දැනුවත් කළ යුතුයි. එම සංවාදය තවමත් ජාතික මට්ටමෙන් සිදුවෙලා නැහැ. ආණ්ඩුව හා ජනතාව අතර එම සාකච්ඡාව අත්‍යාවශ්‍ය කාරණාවක්.

එසේ ම මෙම කාරණායේ දී පවතින ලොකුම අභියෝගය වන්නේ මෙම පක්ෂ අතර එකඟතාවක් නොමැතිවීමයි. පක්ෂ අතර එකඟතාවක් නොමැරතිව ජනතාවට කතා කළ නොහැකියි. නිදහස් පක්ෂයේ අතැමුන් කියනවා සංශෝධන කීපයක් ගේන්න පුළුවන්, ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය නැහැ කියලා.

මා තේරුම් ගත් හැටියට ජනමත විචාරණයක් අවශ්‍යයි. මොකද මැතිවරණ ක්‍රමය, ඒකීය රාජ්‍ය ක්‍රමය පිළිබඳ සංශෝධන ඇත්නම් සහ 13 වැනි සංශෝධනයෙන් එහා විසඳුමකය යෑම සඳහා ජනමත විචාරණයක් අවශ්‍යයි.

මෙහිදී 2015 ජනාධිපතිවරණයේදී ජනතාවට ලබා දුන් මැතිවරණ පොරොන්දුව අමතක නොකළ යුතුයි.

එම අභියෝග ජය ගැනීමට සිවිල් සමාජයට සහ ආණ්ඩුවට කළ හැක්කේ මොනවා ද?

මෙහිදී සිවිල් සමාජයට කාරණා දෙකක් තිබෙනවා. මෙම පක්ෂ දෙක එකතු කරලා එකඟතාවකට පැමිණිය යුතුයි. එකඟතාවයකට පැමිණීමෙන් පසුව මෙම සාකච්ඡාව රට පුරා ගෙනයෑම සඳහා සහාය ලබා දිය යුතුයි. සිවිල් සමාජයට මෙය තනිවම කළ නොහැකියි. නමුත් ආණ්ඩුනට සහය දෙන්න පුළුවන්. ඉහත කී කාරණා ආණ්ඩුව විසින් ඉටු කළ යුතුයි.

නව ව්‍යවස්ථාව ජය ගත නොහැකි වුවහොත් රටේ තත්ත්වය කුමක් ද?

මෙවර ව්‍යවස්ථාව නිර්මාණය කර ගත නොහැකි වුවහොත් ආණ්ඩුවට ලොකු ප්‍රශනයක් ඇති වෙනවා. මිනිසුන්ට ආණඩුව කෙරෙහි ඇති විස්වාය බිඳී යන්න පුළුවන්, ආණ්ඩුවට කී දේවල් කළ නොහැකියි කියලා. ආණ්ඩුව දූෂණ මැඩලීම සම්බන්ධයෙන් කී කාරණා පවා වෙලා නැහැ. කවුරුවත් හිරේට දාළ නැහැ, අත්අංගුවට ගන්න අය, අත්අංගුවට ගත් විගස ලෙඩ වෙනවා, ඊට පස්සේ රෝහල් ගත කරනවා. එච්චරයි වෙන්නේ.

නමුත් ආර්ථික තත්ත්වය දියුණු කරනවනම් ජනතා විශ්වාසය ගොඩ නගා ගන්න පුළුවන්. අවසනයේ මිනිසුන් බලාපොරෝතතු වෙන්නේ එයයි.

මෙහිදී ආණ්ඩුවක් හැටියට ජනමත විචාරණයකට යනවනම් ඒ අභියෝගය භාර ගෙන ජනමත විචාරණය ජයග්‍රහණය කළ යුතු යි.

සංවාදය
ළහිරු කිතලගම


ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(2015 මැයි මස 15 දින දක්වා සංශෝධිතයි)

ප්‍රතිශෝධිත මුද්‍රණය 2015

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශිතයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்
அரசியலமைப்பு

(2015,மே 15 ஆந் தேதி வரையிலான
திருத்தங்களுடன்)

மறுபதிப்பு 2015

பாராளுமன்றச் செயலகத்தால் வெளியிடப்பட்டது

අපි කවරදා ගැතිකමෙන් නිදහස් වෙමු ද?

නීතිඥ
එස්. ජී. පුංචිහේවා

අවුරුදු 310 ක් පෘතුගීසි ලන්දේසි පාලනයටද අවුරුදු 133ක් ඉංග්‍රීසිපාලනයට ද අප යටත් වුණේ, අපගේ භාෂාවත් සමග ය. එකල රාජ්‍ය භාෂාවන් වූයේ ආක්‍රමණිකයන්ගේ භාෂා ය. සිංහල දෙමළ ජාතික භාෂා හෙවත් විදේශිකයින්ගේ භාෂා වශයෙන් රැකී තිබුණේ භාවිතය නිසා ය. අනතුරුව 1948 දී අපි යම් දේශපාලන නිදහසක් ලැබීමු. එහෙත් යටත්විජිත ආකල්ප වලින් නිදහස් නොවීමු. ඒ නිසා ඉංග්‍රීසි පාලනයෙන් සිංහල දෙමළ භාෂා මර්දනය වුණාසේ ම 1956 සිංහල පාලනයෙන් දෙමළ භාෂාව මර්දනය විය. 1956/33 සිංහල රාජ්‍ය භාෂා පනත ඊට උදාහරණ වේ. භාෂා සටනින් ඇරඹුණු දෙමළ ජාතික විරෝධය කෙළවර වුයේ 26 අවුරුදු ප්‍රචණ්ඩ යුද්ධයකිනි.

අප්‍රමාණ භෞතික හා මානව සම්පත් විනාශකර ගනිමින් යුද්ධය කෙළවර වුවද, සිංහල දෙමළ දෙපාර්ශ්වයේම දේශපාලන ප්‍රජාව වෙත පැළපැදියම් වූ යටත් විජිත හෙවත්

ඉංග්‍රීසි ගැතිකම යුද්ධයේ පොකුරු බෝම්බවලින් වත් විනාශ නොවී ය. යටත් විජිත පාලන සමයේ සිට මතු වී තිබූ ස්වරාජ්‍ය සහ ස්වභාෂා සංකල්පය පසුව සිංහල සහ දෙමළ වශයෙන් බෙදාගෙන භාෂා අරගලයේ ස්වරූපයෙන් ඉදිරියට ගැනුණේ දේශපාලන බලය ගැනීමේ වුවමනාවට ය. දේශපාල ප්‍රජාව සිංහල දෙමළ භාෂා වෙනුවෙන් සටන් කළේ ඉංග්‍රීසියෙනි.

මුල් කාලයේ ඉංග්‍රීසි වැඩියෙන් දන්නා අය රාජ්‍ය පාලනයට පත්වුවද 'නිදහසින්' පසු සිංහල හෝ දෙමළ වැඩියෙන් දන්නා අය පත් වූහ. එසේ වුවද ඔවුන්ගේ ඉංග්‍රීසි හෙවත් යටත් විජිත ගැතිකම එසේම පැවතිණි. ඊට වෙනත් උදාහරණ අවශ්‍ය නැත. මෙය පමණක් ප්‍රමාණවත් ය. එනම්:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීති කෙටුම්පත් කිරීමේ - ලිවීමේ භාෂාව විය යුත්තේ සිංහල හා දෙමල භාෂා ය. (23 ව්‍යවස්ථාව) එහෙත් 2016 වනතුරුත් නීතිය ලියැවුණේ ඉංග්‍රීසියෙන් ය. පසුව රාජ්‍ය භාෂාවට පරිවර්තනය කැරිණ. මෙසේ වූයේ නීතිය ලිවීමට සිංහල, දෙමළ භාෂා පරිචයක් ඇති අය නැතිකම ද නැත්නම් ගැතිකම ද? ඉතින් අද වන විට අවුරුදු 38ක් ම සිදුවූයේ ව්‍යවස්ථා උල්ලංඝනයකි. ඉතින් පාර්ලිමේනතුවේ සිටි සිංහල දෙමළ මුස්ලිම් කිසිවකු මේතාක් ඒ උල්ලංඝනය ගැන වචනයක්වත් කතාකොට නැත. ඔවුන්ට දේශපාලන බලය ගැන්මට පමණක් භාෂාව වැදගත් ය. බලයට පැමිණි පසු ඉංග්‍රීසි වැදගත් ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීති කෙටුම්පත් කිරීමේ - ලිවීමේ භාෂාව විය යුත්තේ සිංහල හා දෙමල භාෂා ය. (23 ව්‍යවස්ථාව) එහෙත් 2016 වනතුරුත් නීතිය ලියැවුණේ ඉංග්‍රීසියෙන් ය. පසුව රාජ්‍ය භාෂාවට පරිවර්තනය කැරිණ. මෙසේ වූයේ නීතිය ලිවීමට සිංහල, දෙමළ භාෂා පරිචයක් ඇති අය නැතිකම ද නැත්නම් ගැතිකම ද? ඉතින් අද වන විට අවුරුදු 38ක් ම සිදුවූයේ ව්‍යවස්ථා උල්ලංඝනයකි. ඉතින් පාර්ලිමේනතුවේ සිටි සිංහල දෙමළ මුස්ලිම් කිසිවකු මේතාක් ඒ උල්ලංඝනය ගැන වචනයක්වත් කතාකොට නැත. ඔවුන්ට දේශපාලන බලය ගැන්මට පමණක් භාෂාව වැදගත් ය. බලයට පැමිණි පසු ඉංග්‍රීසි වැදගත් ය.

2016 වනතුරු අවුරුදු 38ක් වශයෙන් සඳහන් වුවද එය තව දුරටත් එසේ ම පවතින බව සනාථ වන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා නිර්දේශ කෙටුම්පත් වූයේ ද ඉංග්‍රීසියෙනි. පසුව සිංහලයට හා දෙමළයට පරිවර්තනය වී ඇත. එහෙත් එහි අන්තර්ගතය සිංහල දෙමළ පරිපාලනයට හිතවත් ය. ස්වභාෂාවන්ගෙන් පරිපාලනය විය යුතු බව අවධාරණය කර ඇති හෙයිනි. ඉංග්‍රීසිය ජාතික භාෂාවක් වශයෙන් සඳහන් වුව ද (ව්‍යවස්ථාවේ) තවමත් ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය භාෂාවක් වශයෙනි.

අපේ රටේ දැන්වීම් පුවරු, ලේබල්, ලිපි ලේඛන තවමත් ඉංග්‍රීසියෙන් මිස සිංහලෙන් හෝ දෙමළෙන් නැත්තේ ඉහත සඳහන් ව්‍යවස්ථා වංචාව නිසා ය. මෙය යටත් විජිත ගැතිකම ව්‍යවස්ථාගත කිරීමකි. දේශපාලන බලය උදෙසා පමණක් භාෂා ප්‍රේමිත්වය දක්වන රටක් පරිපාලනයේ දැක් වුවද සැබෑ ලෙස පරිපාලනයක් ස්වභාෂාවෙන් සිදුවීම ඇරැඹෙන්නේ තවමත් තිබෙන විදේශ ගැතිකම නැතිවූ විටය. අපට සැබෑ නිදහස ලැබෙන්නේ එම මානසිකත්වයනේ මිදී ඉංග්‍රීසි ඉගෙන ගැනීමට පටන් ගන්නා දිනක සිටය.



womenandmedia.org

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දේශපාලන ආර්ථික අයිතිවාසිකම් ඉල්ලා උද්ඝෝෂණයක නිරත සිවිල් ක්‍රියාධරයන්

විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීමට ජනාධිපති සහ අගමැති එකඟයි

ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අසන ලද ප්‍රශ්න කිහිපයකට ආචාර්ය ජයම්පති වික්‍රමරත්න දෙන ලද පිළිතුරු මෙසේ ය.

ආචාර්ය ජයම්පති වික්‍රමරත්න

ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේ ආරම්භය වෙන්නේ මොන ආකාරයට ද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටෙව්වෙ ඒකමතිකව. එම යෝජනාව සම්මත උනේ ඡන්දෙකින් තොරව, විරුද්ධ පක්ෂය පවා එයට සහයෝගය පල කළා. මුල් යෝජනාව සංශෝධනය කළා ශ්‍රිලනිප ඉල්ලීම අනුව. මුල් කෙටුම්පතේ තිබුනේ නව ව්‍යවස්ථාවක් කියලා. ශ්‍රීලනිප අය "නව" කියන කොටස ඉවත් කරල "ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ" කියලා වෙනස් කරන්න ඉල්ලීම් කළා. අලුත් ව්‍යවස්ථාවක් කියල දැන් ඒක වෙනස් වෙලා තියෙනවා. ජනාධිපතිතුමා කියන්නෙත් නව ව්‍යවස්ථාවක් කියලා. පසුගිය සැප්තැම්බර් මාසයේ කුරුණෑගල පැවැති ශ්‍රිලනිප සම්මේලනයේ දී යෝජනා කීපයක් සම්මත කර ගත්තා, නව ව්‍යවස්ථාවක් වෙනුවෙන්.

ඊට පසු මොනවා ද උනේ ?

ඉන් පසුව මෙහෙයුම් කමිටු පත් කිරීම සිදු උනා. හැම කමිටුවකම ඒකාබද්ධ විපක්ෂයේ අය දෙන්නෙක්වත් ඉන්නවා. නීතිය හා සාමය පිළිබඳ කමිටුවේ නාමල් රාජපක්ෂ, ශෙහාන් සමරසිංහ. මූලික අයිතිවාසිකම් කමිටුවේ පවිත්‍රා වන්නි ආරච්චි, වාසුදේව. යම් බලතල බෙදීමක් යටතේ සභාපති තනතුරු බෙදීමක් සිදු වුණා. රාජ්‍ය මූල්‍ය කමිටුවේ සභාපති බන්දුල ගුණවර්ධන. මූලික අයිතිවාසිකම් කමිටුවේ සභාපති මහින්ද සමරසිංහ. රවුෆ් හකීම් අධිකරණ. සාගල රත්නායක නීතිය හා සාමය යන කමිටුවේ සිටිනවා. සංකීර්ණ මාතෘකා කමිටුවලට දැම්මෙ නෑ. උදාහරණයක් ලෙස රාජ්‍යයේ ස්වරූපය, විධායකය වගේ දේවල්. බලය බෙදා හැරීම පිළිබඳ මූලධර්ම ගැන සිද්ධාර්ථන්ගෙ කමිටුව විසින් සිද්ධ කරනවා, ආගම, ඉඩම් ප්‍රධාන කමිටුව මගින් සිද්ධ කරනවා. මුලදි විධායක ජනපති ක්‍රමය අහෝසි කරනවා ද කියන එක සම්බන්ධව ශ්‍රීලනිපය ඒකමති අදහසක හිටියේ නෑ. නමුත් ජනාධිපතිතුමා පදනම් ආයතනයේදි කරපු කතාවෙන් පස්සේ ඒ මතයන් වෙනස් උනා. මෑතකදී මෙහෙයුම් කාරකසභා අවස්ථාවකදී විධායක ජනපති ක්‍රමය අහෝසි කලයුතු ස්ථාවරයේ තමන් ඉන්න බවට ඩිලාන් පෙරේරා ප්‍රකාශ කළා. චම්පික එහෙම මොනව කරයිද කියලා අපි දන්නෙ නෑ. එයා රැස්වීම්වලට එන්නෙ නෑ දැන්.

මොන වර්ගයේ ආණ්ඩුක්‍රමයක් ද යෝජනා වෙලි තියෙන්නේ ?

ජනාධිපති ක්‍රමය අහෝසි කළයුතු යැයි ඒකමතික ස්ථාවරයේ ඉන්නවා. ඒ වෙනුවට ගේන්නෙ මොකක්ද කියල තවම තීරණයක් අරන් නෑ. එකක් තමයි වෙස්මිනිස්ටර් ක්‍රමය, පාර්ලිමේන්තුවේ වැඩිම සහයෝගය තිබෙන මන්ත්‍රී අගමැති ලෙස පත්කිරීම. ස්ථාවර ආණ්ඩුවක් පත් කර ගැනීමට ඒ ඒ පක්ෂවලට තමන්ගේ අගමැති අපේක්ෂකයා නම් කරන්න පුලුවන්. ඒ අනුව පත්වෙන ආණ්ඩුව අවු 2 ක කාලයකට පෙරලන්න බැරි ක්‍රමයක් ඉදිරිපත් වෙලා තියෙනවා.

මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් මොනවගේ අදහසක් ද තියෙන්නේ ?

දැන් මැතිවරණ කොට්ඨාස ක්‍රමය සම්බන්ධ සෑහෙන ප්‍රගතියක් දක්නට ලැබෙනවා. මූලික වශයෙන් ප්‍රශ්න තිබෙනවා. අවසාන වශයෙන් සමානුපාතික ක්‍රමය ඇතුළට ආසන ක්‍රමය යෙදීමක් සිද්ධවෙනවා. උදාහරණයක් හැටියට ටී.එන්.ඒ එකට

ශිරාණී තිලකවර්ධන එක් නඩු තීන්දුවක කියනවා, සෑම ආගමකටම සම තැනක් හිමිවෙනවා කියලා. මල්වතු නායක හාමුදුරුවෝ කියන්නෙ බුද්ධාගමට තියෙන තැන එහෙමම තියන්න කියලා.

මන්නාරමේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

සීයට ගාණක් හැටියට ආසන 14ක් හම්බ වෙන්න ඕන. නමුත් ඔවුන් කොට්ඨාස වලින් දිනනවා 13ක් ඉතුරු 1 අර ලැයිස්තුවට ලබාදෙනවා. ආසන වලින් තේරීපත්වන අය 140 ක් වගේ. ඉතිරි 93 ලැයිස්තුවට හිමිවෙනවා. බැලූබැල්මට ඒ ක්‍රමය හොඳයි, සමහරවිට පොඩි විකෘතිවීමක් සිද්ධ වෙන්නත් පුලුවන්. මේ ක්‍රමය ගිය ඡන්දෙදි ක්‍රියාත්මක උනා නම් ජේ.වී.පී එකට ආසන 12ක් හම්බවෙන්නත් ඉඩකඩ තිබුණා. පාර්ලිමේන්තුවේ ආසන 235 වගේ තමයි අපි බලාපොරොත්තු වෙන්නෙ. මෙම ක්‍රමය කුඩා පක්ෂවලට වාසි සහගතයි. මේ සම්බන්ධ ප්‍රශ්න පැන නැගිය හැකියි, ඒ ගණනය කිරීම සිදුවන්නේ ජාතික මට්ටමකින් ද පළාත් මට්ටමෙන්ද කියන එක ගැන. ටී.එන්.ඒ එක ඇතුලු අනෙක් ඔක්කොම කියන්නෙ ජාතික මට්ටමෙන් ගණනය කරමු කියලා. ජාතික මට්ටමෙන් ගණනය කරනකොට තියෙන ආසන ප්‍රමාණය වැඩියි. මේ දෙකේ ඒතරම් වෙනසක් නෑ. එක් එක් පක්ෂය පළාතකින් ලබාගන්නා ඡන්ද ප්‍රතිශතය අනුව අමතර ආසන බෙදීමක් සිදුවෙනවා. ඒකට හුඟක් අය කැමතියි. එතකොට හැම පළාතකම වෙනම ලේඛනයක් තියෙනවා. ඒක වෙනස් කිරීමේ හැකියාවක් නෑ. එහි අනුපිළිවෙල කලින් ප්‍රකාශයට පත් කරන්න ඕනි. ජාතික මට්ටමෙන් හෝ පළාත් මට්ටමෙන් ගණනය කරනවාදැයි නිශ්චිත නිගමනයකට එන්න ඕන. ඒක විසඳෙයි කියල අපි හිතනවා. අවම ඡන්ද ප්‍රමාණය තිරණය කලයුතුයි. ඒ ඒ පක්ෂය ගන්නා ඡන්ද ප්‍රමාණය මත ආසන බෙදීමක් සිද්ධවිය යුතුයි. සියලුම පක්ෂ එකඟ උනා 72 හා සෝල්බරි ව්‍යවස්ථාවල වගේ කුඩා ආසන හැදීමට ඉඩ දිය යුතුයි කියලා. යම්කිසි කුඩා කණ්ඩායමක් හෝ ජනවර්ගයකට අවස්ථාවක් ලබා දිය යුතුයි කියන මතය. ලංකා ඉතිහාසේ බහු ආසන ක්‍රමය සෑහෙන දුරට ක්‍රියාත්මක වෙලා තියෙනවා. හාරිස්පත්තුව, බේරුවල වගේ. එකම එක අවස්ථාවක් තියෙනවා බහුතර ආසනයක් හදලා අරමුණ ඉටු උනේ නැති. ඒ 1970 මඩකලපුවෙ. ඒක බහු ආසනයක් කලේ මුස්ලිම් හා දෙමල නියෝජනයක් තියෙන නිසා. නමුත් ඒ වෙලාවෙ මුස්ලිම් අපේක්ෂකයෝ වැඩියෙන් ඉල්ලුවා. ඒ අය වැඩි ඡන්ද ගත්ත හින්ද වැඩි ආසන ප්‍රමාණයක් හිමි උනා. ප්‍රධාන පක්ෂ දෙක ටිකක් අකමැති මේකට. අනෙක් පක්ෂ කැමතියි.

බලය බෙදීම ගැන මොනවගේ තත්ත්වයක් ද තියෙන්නේ ?

තවම බලය බෙදා හැරීම සම්බන්ධව ලොකු ප්‍රශ්න මතුවෙලා නෑ. විපක්ෂයෙන් මේකට සහභාගි වෙනවා. ප්‍රසන්න රණතුංග බලය බෙදීමකට කැමතියි. මොකද එයා පළාත් ප්‍රධාන ඇමති වෙලා හිටපු හින්දා. නමුත් දේශපාලනිකමය වශයෙන් තීන්දුවක් ගන්නකොට මේක වෙනස් වෙයි. ජනාධිපතිතුමා එක්ක කතාකරනකොට එතුමත් ප්‍රකාශ කලේ ප්‍රසන්නටත් දේශපාලන තීන්දුවක් ගන්න වෙලාවක් එනව, එක නිසා වැඩිය විශ්වාස කරන්න එපා කියලා. ප්‍රධාන වශයෙන් බලය බෙදීමක් ගැන කතා කරල නෑ නමුත් ටී.එන්.ඒ එක මේ ගැන කතා කරල තියෙනවා. ඒ අය කියන්නෙ උතුර නැගෙනහිර වෙන් කළේ දේශපාලන නඩු තීන්දුවකින් කියලා. ඒ නිසා ඒක හදල පටන් ගන්න ඕනි කියලා ඔවුන් කියනවා. වර්තමාන ව්‍යවස්ථාවේ තියෙනවා පළාත් දෙකකට හෝ තුනකට එක් වීමේ හැකියාවක් තියෙනවා. නමුත් ඒකට පාර්ලිමේන්තුවෙන් ගේන නීතියක් තියෙන්න ඕනි. නමුත් අද එවැනි නීතියක් නෑ. ටී.එන්.ඒ එකත් එකඟත්වය දක්වන නිසා ඒ වගන්ති එහෙමම තියමු. මම ඒකට අතුරු යෝජනාවක් දැම්මා, ඒ ඒ පළාතේ ඒ ඒ ජනයාගේ කැමැත්ත ඒකට තිබිය



ජනාධිපති ක්‍රමය අහෝසි කළයුතු යැයි ඒකමතික ස්ථාවරයේ ඉන්නවා. ඒ වෙනුවට ගේන්නෙ මොකක්ද කියල තවම තීරණයක් අරන් නෑ. එකක් තමයි වෙස්මිනිස්ටර් ක්‍රමය, පාර්ලිමේන්තුවේ වැඩිම සහයෝගය තිබෙන මන්ත්‍රී අගමැති ලෙස පත්කිරීම. ස්ථාවර ආණ්ඩුවක් පත් කර ගැනීමට ඒ ඒ පක්ෂවලට තමන්ගේ අගමැති අපේක්ෂකයා නම් කරන්න පුලුවන්. ඒ අනුව පත්වෙන ආණ්ඩුව අවු 2 ක කාලයකට පෙරලන්න බැරි ක්‍රමයක් ඉදිරිපත් වෙලා තියෙනවා.

අනුරාධපුරයේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

මෙම වගකීමෙන් කියනවා මූලික අයිතිවාසිකම් වාර්තාව ඉතාම හොඳයි. ඒකෙ සිවිල් සහ ආර්ථික අයිතිවාසිකම් වගේම සාමාජීය පසුබිම සම්බන්ධයෙන් කතා කරන්න අවස්ථාව උදාවෙලා තියෙනවා, සමාජ ආර්ථික අයිතිවාසිකම්වලට එ.ජා.පයේ විරෝධයක් එයි කියලා මං හිතනවා.

යුතුයි කියල. පාර්ලිමේන්තුව එවැනි කටයුතු වෙනුවෙන් නීති හැදිය යුතුයි. මධ්‍යම පළාතේ අයටයි ඌව පළාතේ අයටයි එකතු වීමේ අවශ්‍යතාව තියේ නම් ඒකට අවස්ථාව ලබාදිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදීව ඒකට ඉඩදිය යුතුයි. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳව තමා ලොකු ගැටලු මතුවෙන්නෙ. අපි දන්නා විදියට මහින්ද රාජපක්ෂ බලන් ඉන්නේ ඒක පාවිච්චි කරන්න. ඒකීය රාජ්‍ය කියල කතා කරාට පොදු මතයක් නෑ. පාරට ගිහින් පලවෙනි සිංහල මිනිස්සු දහදෙනාගෙන් අහන්න ඒකීය රාජ්‍යක් ඕනිද කියලා. 10 දෙනාම කියයි ඕනි කියලා. ඒකිය කියන්නෙ නොබෙදිය යුතුයි කියන එක. මහින්ද රාජපක්ෂල මේක තමයි අවුස්සන්නෙ.

ආගම සම්බන්ධයෙන් තිබෙන අදහස කුමක් ද?

වාමාංශිකයෙක් හැටියට මම දකින්නෙ කිසිම ආගමකට සුවිශේෂී තැනක් දියයුතු නෑ. අනාගමික රාජ්‍ය පිළිබඳ ව ලොකු සාකච්ඡාවක් පවතිනවා. ශිරාණි තිලකවර්ධන එක් නඩු තීන්දුවක කියනවා, සෑම ආගමකටම සම තැනක් හිමිවෙනවා කියලා. මල්වතු නායක හාමුදුරුවෝ කියන්නෙ බුද්ධාගමට තියෙන තැන එහෙමම තියන්න කියලා. අපි සාකච්ඡා කරලා ඒකමතික තීරණයකට එන්න ඕනි.

එතකොට කමිටු වාර්තා ලැබෙන්නේ කවදා ද?

අනුකමිටු 6යේ ම වාර්තා ඇවිත් තියෙනවා. බන්දුල ගුණවර්ධන රාජ්‍ය මූල්‍ය පිළිබඳ කමිටු වාර්තාව අත්සන් කරලම තියෙනවා. වාසුදේව ඉන්නෙ මූලික අයිතිවාසිකම් කොමිටි එකේ, එයා ඔක්කොටම සහභාගි වෙලා ඇතැම් ඒවට විරුද්ධයි කියලා අත්සන් කරන්න බෑ කිව්වා. තව සති දෙකකින් වාර්තා ඉදිරිපත් කරනවා. මම ඉන්නෙ මූලික අයිතිවාසිකම් කමිටුවේ. ඒකෙ තියෙන්නෙ මොනවද කියල කියන්න මට අවසර නෑ. මම වගකීමෙන් කියනවා මූලික අයිතිවාසිකම් වාර්තාව ඉතාම හොඳයි. ඒකෙ සිවිල් සහ ආර්ථික අයිතිවාසිකම් වගේම සාමාජීය පසුබිම සම්බන්ධයෙන් කතා කරන්න අවස්ථාව උදාවෙලා තියෙනවා, සමාජ ආර්ථික අයිතිවාසිකම්වලට එ.ජා.පයේ විරෝධයක් එයි කියලා මං හිතනවා. ඒගොල්ලො ඉන්නෙ තවම පනස් ගණන්වල මානසිකත්වයෙන්. ලෝකේ අලුත් ව්‍යවස්ථා හැම එකකම මේ ඔක්කොම ඇතුළත් වෙනවා. නේපාලයේ, දකුණු අප්‍රිකාවේ, නැගෙනහිර ටිමෝරයේ වගේ රටවල සිවිල් සහ ආර්ථික අයිතිවාසිකම් වගේම සාමාජීය පසුබිම ඇතුළත් වෙනවා. මගේ පොඩි පැමිණිල්ලකුත් තියෙනවා සිවිල් සමාජය එක්ක. ඇයි සිවිල් සමාජය මේ සම්බන්ධව ප්‍රශ්න මතු කරන්නෙ නැත්තෙ. ඒ අය මේ ප්‍රශ්නවලට මැදිහත් වෙනවා මදි. සමාජ අයිතිවාසිකම් පිළිබඳව කතා කරන සී.පී.ඒ එක අද පස්ස ගහල ඉන්නේ. දක්ෂිණාංශික කොටස් සමාජ ආර්ථික අයිතිවාසිකම් ඇතුළත් කිරීමට විරුද්ධව කටයුතු කරගෙන යන බව අපට පේනවා. අපි ලොකු මැදිහත්වීමක් දක්වනවා වෘත්තීය සමිති අයිතිවාසිකම් හා වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න. නමුත් ඒ අයගේ කිසි මැදිහත්වීමක් නෑ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ගුරුවරුන් අධ්‍යාපන අයිතිවාසිකම් ගැන කතා කරන්නෙ නෑ. සෞඛ්‍ය අංශයේ වෘත්තිය සමිති ඒ ගොල්ලන්ගෙ අයිතිවාසිකම් ගැන කතා කරන්නෙ නෑ. කුඩා කණ්ඩායමක් ඉන්නවා ජනතා සෞඛ්‍ය සංගමය කියල ඒ අය තමා මැරිල කෑගහන්නෙ. ව්‍යවස්ථාව හදන්න සාමාන්‍ය ජනතාවගේ සහයෝගය අවශ්‍යයි. තව සති දෙකකින් කමිටු වාර්තා පිටවෙනවා. එතකොට මම කියන්නෙ

www.gosip99.com

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සෝභිත හිමියන්ට අවසන් ගෞරව දක්වමින්

අපි විශාල ව්‍යාපාරයක් කරන්න ඕනි මේක ජනගත කරන්න. අන්තර් වාර්තාව මෑතක දී ඉදිරිපත් කරනවා. මේ පිළිබඳව නොයෙකුත් සැකයන් තියෙනවා. නමුත් රටේ ප්‍රධාන පුරවැසියන් දෙදෙනාත් එක්ක මම සාකච්ඡා කළා. ඒ අය මේ සම්බන්ධයෙන් පැහැදිලි උනන්දුවකින් පසුවෙනවා.

බලය බෙදීම තුළ පොලිස් හා ඉඩම් බලතල පිළිබඳ විසඳන්නේ කොහොම ද?

පොලිස් බලතල සම්බන්ධව පැහැදිලිව ව්‍යවස්ථාවේ දක්වන්න අපි බලාපොරොත්තු වෙනවා. නඩු පැවරීමේ බලතල පොලීසියට හා නීතිපති දෙපාර්තමේන්තුවට හිමිවෙනවා. ඒ ගැන ඇඟිලි ගහන්න කාටවත් බෑ. මාරු කිරීම් උසස්වීම් කරන්නෙ ස්වාධීන කොමිසමකින්. ඒවගේ ස්වාධීන පොලිස් කොමිසම් පළාත්බදව හදන්න අපි යෝජනා කරල තියෙනවා. සරත් ෆොන්සේකා හිරේ ඉන්නකොට ,ජේ.වී.පී පෙලපාලියක් ගියා. ඒ ඔක්කෝටම ප්‍රහාර එල්ල උනා. ඒත් ඔවුන් කියන්නෙ පොලිස් බලතල මධ්‍යම ආණ්ඩුවට පමණක් දියයුතුයි කියන එක. වාමාංශිකයන් හැටියට මේ අයගෙන් හැමදාම අපි ගුටිකෑව. ගෝඨාභය නීතිය හා සාමය හරියට ක්‍රියාත්මක කළේ නෑ. සමහර පළාත් සභාවලට පොලිස් බලතල දුන්නනොත් නිවැරදිව ක්‍රියාවට නංවයි කියල අපි හිතනවා.

1991 පණත සම්මත වුණ වෙලාවෙ ඉඩම්, පොලිස් බලතල දුන්නා නම් මේ තරම් ගැටලු ඇති වෙයි කියල මම හිත්න්නේ නෑ. අපි පුලුවන් තරම් ආරක්ෂක විදිවිධාන මේවට ඇතුළත් කරන්න උත්සාහ කරනවා. මෙම ස්වාධීන කොමිසම් හදන්න ඕනි පළාත්සභා වල මධ්‍යම ආණ්ඩු වල ඔක්කොම ඇතුළත්ව.

රාජ්‍ය නායකයා පත්කරන්නේ කොහොම ද?

විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සම්බන්ධව රටේ ප්‍රධාන පුරවැසියන් දෙදෙනාම ඉන්නෙ එය අහෝසි කළයුතුයි යන අදහසින්. ඒ අය මට කීවෙ ඒක අහෝසි කළයුතුයි කියල. ඒ ගැන මට සැකයක් නෑ. විධායකය තියෙනව විධායක ජනාධිපති ධූරයක් නෑ. ජනාධිපති පත්කිරීමට ඡන්දයක් තියන්න ඕනි නෑ. ජනාධිපති පත්කිරීම සම්බන්ධව සාකච්ඡා කරමින් පවතිනවා. ඒ සඳහා යෝජනා 3ක් තියෙනවා. පාර්ලිමේන්තුවෙන් පත්කල යුතුයි කියන අදහස එකක්. දෙවනි මන්ත්‍රි මණ්ඩලයක් පත්කළ යුතුයි කියන අදහසකුත් තියෙනවා. පාර්ලිමේන්තුවයි දෙවෙනි මන්ත්‍රී මණ්ඩලයයි එකයි එකතුවෙලා electroal college එකක් හදල පත්කරන්න අදහස් වෙලා තියෙනවා. පළාත් සභා ඇතුළත් කරල ඒ අයගේ ඡන්දෙකින් ජනාධිපති පත් කරන්න. නාම මාත්‍රික ජනාධිපති නම් එහෙම අවශ්‍ය වෙන්නෙත් නෑ.



alchetron.com

ඒ. එච්. එම්. අෂ්රෆ් මහතා වර්ෂ 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් කළ අවස්ථාවේ පාර්ලිමේන්තුව අමතමින්

නොබෙදුණු රටක උපරිම ලෙස බලය බෙදීමක් අවශ්‍යයි

අමාත්‍ය රවුෆ් හකීම්
අධිකරණ අනුකාරක සභාවේ සභාපති

ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කළ යුතුයි කියන විෂය පථය අපි දැන් 1980 ගණන්වල සිට සාකච්ඡා කරන මාතෘකාවක්. විශේෂයෙන් ම 13වෙනි සංශෝධනය ඉදිරිපත් වුවාට පසුව එය ක්‍රියාවට නංවලා දැන් වසර 30ක පමණ අත්දැකීමක් අපිට තිබෙනවා. ඉතින් මේ කාලසීමාව තුළ දී බලය බෙදා හැරීම උපරිම ලෙස භුක්ති විඳිමට සුළු ජන කොටස් ඒකරාශි වී ජීවත්වන ප්‍රදේශවල ඉන්න ජනතාවට නොයෙකුත් ගැටලුවලට මුහුණ පාන්න සිදුවුණා. විශේෂයෙන්ම මධ්‍යම රජය තමන්ගේ බලය බෙදා හැරීමේ දී නොයෙකුත් සීමා පනවමින්, ඒ වගේම අනිසි ලෙස බලය උදුරා ගනිමින්, පළාත් ආණ්ඩු වලට පැවරිලා තිබුණු බලතල නොදිමෙන් ඒ ගැන විවේචන තිබුණා. ඒ වගේම අවිනිශ්චිත දේවල් පිළිබඳව, විශේෂයෙන් මේ සමගාමී ලැයිස්තුව කියන එක මත නොයෙකුත් කඹ ඇදිලි තිබුණා. මේ සියල්ල අපි නිරාකරණය කළයුතු වකවානුවක් දැන්

කාටවත් උවමනාවක් නෑ මේ රට බෙදීමට හෝ බෙදුම්වාදී සංකල්පයකට ඉඩ දීමට. අපි කවුරුත් කියා සිටින්නේ නොබෙදනු රටක උපරිම ලෙස බලය බෙදාහැරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි කියලා. ඒකට අවශ්‍ය ක්‍රමවේදයන් රාශියක් තිබෙනවා.

පැමිණ තිබෙනවා. ඒක ඇත්ත වශයෙන්ම ගිය මහ මැතිවරණයේ දි අපි ලබා දුන්නු පොරොන්දුවක්. විශේෂයෙන්ම වර්තමාන ජනාධිපතිතුමා අති බහුතරයක් මේ රටේ සුළු ජාතින්ගේ ඡන්දයෙන් පත් වූ කෙනෙක් හැටියට එතුමාටත් ඒ වගකීම තිබෙනවා.

ඒ ඡන්ද ව්‍යාපාරය මෙහෙය වූ නායකයින් හැටියට අපි බැඳී සිටිනවා මේවා සාර්ථක කරගන්නට. ඒ සමගම ඉතාම හැඟීම්බර වගේම, ආවේගශීලී වාර්තා පලවෙනවා මේ දවස්වල. විශේෂයෙන්ම රාජ්‍යයේ ස්වාභාවය වෙනස් කරන්නට යනවා කියලා. ඒ වගේම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාමුව රට බෙදීයෑමට තරම් තුඩුදෙන ආකාරයට වෙනස් කරන්නට යනවා කියන පදනමින් නොයෙකුත් පදනම් විරහිත චෝදනා එල්ල වෙනවා. කාටවත් උවමනාවක් නෑ මේ රට බෙදීමට හෝ බෙදුම්වාදී සංකල්පයකට ඉඩ දීමට. අපි කවුරුත් කියා සිටින්නේ නොබෙදනු රටක උපරිම ලෙස බලය බෙදාහැරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි කියලා. ඒකට අවශ්‍ය ක්‍රමවේදයන් රාශියක් තිබෙනවා.

අනිත් එක රාජ්‍යයේ ස්වභාවය පිළිබඳව සඳහන් නොකර උපරිම ලෙස බලය බෙදා හැරීමක් සිදුකළ රටවල් ගණනාවක් තිබෙනවා. ඒ පූර්වාදර්ශයත් ලබාගෙන අපි මේ රට ඒකීය ද, නැත්නම් එක්සත් ද, නැතිනම් ෆෙඩරල් ද, කියන ඒ සංකල්පය නොකියා ජනතාවට උවමනා උපරිම බලය ප්‍රාන්තවල බුක්ති විඳීමට හැකි වන ලෙස අපිට ව්‍යවස්ථාවක් හඳුන්වා දෙන්නට පුළුවන්. ඒකෙ ඒ නිසා ගැටළුවක් නෑ. නමුත් වචන වලට පමණක් සීමා වූ වාද පිළිබඳව විශාල ලැදිකමක් පෙන්වන සුළු පිරිසක් සිටිනවා. ඒ පිලිබඳව අවිශ්වාසයක් තිබෙන බවද අප පිළිගත යුතු යි. මේ රටේ බෙදුම්වාදී අරගලයක් තිබුණා කියන ඒ හීතිකාව මත නැවත ඒක හටගැනීමට ඉඩ සැලසෙන ආකාරයට නොකළ යුතුයි කියන පදනම මත ඒ අය කථා කරනවා නම් ඒක අපිට පිළිගන්නට පුළුවන්. ඒ නිසා මේ රට නොබෙදෙන, එක රටක් හැටියට එක දේශයක් හැටියට, අපිට හඳුන්වා දෙන ක්‍රමයක් අවශ්‍යයි. ඒකට කිසි ගැටලුවක් මෙන්ම බාධාවක් ද නැහැ.

ඒ වගේම සමහරු ප්‍රචාරය කරනවා, මේ බුද්ධාගමට තියෙන මුල් තැන අහිමි වෙයි කියලා. අනිත් ආගම් තිබුණාට මේ රට බෞද්ධ රටක් නොවිය යුතුයි, නැතිනම් බෞද්ධ කියන ඒ තත්ත්වයෙන් ඉවත්විය යුතුයි කියන තදබල ඉල්ලීමක් කාගෙන්වත් ඉදිරිපත් වී නෑ. නමුත් හැම ආගමකටම තියෙන ඒ නිදහස තමන්ගේ ආගම ඇදහීමට තියෙන වට පිටාව 7 ව්‍යවස්ථාව හරහා මූලික අයිවාසිකම් හැටියට කලින් එකම පිළිඅරන් තිබුණත්, නොයෙකුත් අපේ පරිපාලනමය ක්‍රියාදාමයන් හරහා හෝ නැතිනම් අපේ දේශපාලනික හේතු මත නොයෙකුත් අසාධාරණයන් සිදු වී තිබෙනවා. ඒවා නැවත සිදු නොවීමට වගබලා ගැනීම සඳහා මේ පිළිබඳව අවශ්‍ය සඳහනක් අපට ඇතුළත් කරගැනීමට හැකිවී තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නොයෙකුත් විෂයන් පිළිබඳව තනි තනි කමිටු පත් කළා. ඒකෙන් අධිකරණ ක්‍රියාදාමය පිළිබඳව, ඒ වගේම යුක්තිය පසිඳලීමේ කමිටුවක් මගේ සභාපතිත්වයෙන් පත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මීට පෙර සිදු වූ නොයෙකුත් අනිසි ක්‍රියාවන් වැලැක්වීම සඳහා අපි ඒ ස්වාධීනත්වය රැකදීම සඳහාත්, වෙනස්කම් රාශියක් යෝජනා කර තිබෙනවා. මේ පිළිබඳව අපේ රටේ නීතිඥ සංගමය, අග්‍ර විනිශ්චයකාරතුමන් ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරුන් මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්, ඒ වගේම සිවිල් සංවිධාන කිහිපයක් එක්ක අපි සාකච්ඡා කළා. සාකච්ඡා කරලා අපි යෝජනා කිහිපයක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයේදී ඇතිවන ප්‍රමාද දෝෂයන්, ක්‍රියාදාමයට අවශ්‍ය වූ පරිපාලනමය බඳවා ගැනීම් පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සඳහා අපි යෝජනා රාශියක්

සමාජ හා ආර්ථික අයිතිවාසිකම් පිළිබඳව තිබෙන ප්‍රඥප්තිය රටක් හැටියට අපි පිළිගත්තු එකක්. ඒකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියට අත්සන් කරලයි තියෙන්නේ. ඉතින් ඒ ප්‍රඥප්තිය එක්කම සිවිල් දේශපාලන අයිතීන් තිබෙන ප්‍රඥප්තියට විතරයි මුල්තැන දීලා තියෙන්නේ.

ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණයේ නඩු ගොඩගැසී, ඒවා අවුරුදු ගණන් ගතවන ප්‍රමාදය වැලැක්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනට විනිශ්චයකරුවන් 11දෙනෙක් පත් කරන එක විනිශ්චයකරුවන් 15දෙනෙක් දක්වා වැඩි කරන්නටත්, ඒ වගේම අභියාචනාධිකරණය කොළඹ දී පමණක් නොව ප්‍රාන්තවල ගිහින් වාඩිවීමටත්, විනිසුරුවන් 3දෙනෙකුගෙන් සමන්විත විනිසුරු මඬුල්ලක් ප්‍රාන්තවල වෙන වෙනම වාඩි වීම සඳහා ඉඩ කඩ වෙන්කරලා තියෙනවා. ජනතාවට සමීපව අභියාචනා කටයුතු කිරීමටත් අපි යෝජනා කරලා තියෙනවා. නමුත් මහාධිකරණයට තිබුණු බලතල විශේෂයෙන්ම අපරාධ නඩුවලට පමණක් සීමා කරන්නටත්, අපි යෝජනා කර තිබෙනවා. මක්නිසා ද යත් දැන් තියෙන පළාත්බද මහාධිකරණවලට අනෙකුත් සිවිල් නඩු, අනෙකුත් දිස්ත්‍රික් උසාවි වලින් යන අභියාචනා ඒකට ඉදිරිපත් වෙලා ඒකෙන් තවත් ඇපිල් එකක් ශ්‍රේෂ්ඨාධිකරණයට එන තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ඉතින් මේක මෙහෙම අදියර කිහිපයකින් අභියාචනා කරන්න පුලුවන් තත්ත්වයක් උඩ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තවත් ව්‍යාකූල වෙනවා. ඉතින් ඒවා වැලැක්වීම සඳහා අපි කාලයක් තිස්සේ ඒ පිළිබඳව කතා කරලා තිබෙනවා. පුලුල් වශයෙන් එකගත්වයකුත් තිබෙනවා. විශේෂයෙන්ම නීතිඥ ප්‍රජාව අතරෙත් විනිශ්චයකාරවරුන්ගේ නොයෙකුත් සංගම් අතරෙත් මේ පිළිබඳව පිළිගැනීමක් තියෙනවා.

ඉතින් ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහාත් ඒ වගේම විනිශ්චයකාරවරුන්ගේත් විනය පිළිබඳව පාර්ලිමේන්තුවට දෝෂාභියෝගයක් එල්ල කරන්න තියෙන අවස්ථාව උඩ විශාල විවේචන තිබුණා. එදා සිටි අග්‍රවිනිශ්චයකරතුමියට විරුද්ධව යෝජනාව සම්මතවීමත් එක්කම ඇති වූ එවැනි සිදුවීම් නැවත ඇති නොවීම සඳහා වග බලාගැනීමට අපි අදහස් කර තිබෙනවා. පාර්ලිමේන්තුවට අවසන් යෝජනාව ඒමට පෙර ඒ පිළිබඳව විශ්‍රාම ගිය අග්‍ර විනිශ්චයකාරවරුන්, ඒ වගේම තවත් ස්වාධීන අයගෙන් සමන්විත කමිටුවක් හරහා ඒ විභාගය සිදුවිය යුතුයි. ඉන් පසුව තමයි ඒ නිර්දේශ අපි පාර්ලිමේන්තුව අනුමත කලාට පස්සේ ව්‍යවස්ථාදායක සභාව ඕනෑම විනය ක්‍රියාමාර්ගයක් පිළිබඳ තීරණයක් අනුමත කළ යුතු වන්නේ. දේශපාලන හේතු මත මොනවත් නොකිරීමට අපි වග බලාගැනීමට යෝජනා ඉදිරිපත් කරනවා.

සමාජ හා ආර්ථික අයිතිවාසිකම් පිළිබඳව තිබෙන ප්‍රඥප්තිය රටක් හැටියට අපි පිළිගත්තු එකක්. ඒකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියට අත්සන් කරලයි තියෙන්නේ. ඉතින් ඒ ප්‍රඥප්තිය එක්කම සිවිල් දේශපාලන අයිතීන් තිබෙන ප්‍රඥප්තියට විතරයි මුල්තැන දීලා තියෙන්නේ. වැඩියෙන්ම මූලික අයිතිවාසිකම් නැත්නම් විනිශ්චය කළ හැකි මූලික අයිතිවාසිකම් හැටියට අපි ව්‍යවස්ථාවේ ඇතුළත් කර තිබුණේ ඒ දේ පමණයි. ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් පිළිබඳව තිබෙන කොටස විනිශ්චය කළ හැකි මූලික අයිතිවාසිකම් හැටියට පත්කිරීම පිළිබඳ ප්‍රතිපත්ති තීන්දුවක් ගත යුතුයි. විශේෂයෙන්ම මේ පිළිබඳ කථිකාවේදී දියුණු වූ රටවල් එය වැඩියෙන්ම පිළිගන්නා තත්ත්වයක් දකින්නට පුලුවන්. තුන්වෙනි ලෝකයේ සමහර රටවල් අතරින් ඒ වගේ අයිතිවාසිකම් මූලික අයිතිවාසිකමක් හැටියට පිළිගැනීම පිළිබඳ අකමැත්ත පළවෙලා තිබෙනවා. ඒවා දියුණුවන ලෝකයේ පුළුවන් තරම් ජනතාවගේ ආර්ථික සමාජීය අයිතිවාසිකම් පිළිබඳව වූ ප්‍රඥප්තියේ ඇතුළත් කරලා තිබෙන කරුණු විනිශ්චයට භාජනය කළ හැකි මූලික අයිතිවාසිකම් හැටියට පත් කිරීම පිළිබඳව මගේ පුද්ගලික අදහස නම් ඒක හොඳ දෙයක්, ඒක කළ යුතුයි. ඒවා කෙටුම්පතේ ඇතුළත් කළ යුතු ද නැද්ද යන්න පිළිබඳ ගැඹුරු සාකච්ඡාවක් තාම කෙරී නෑ. යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. සාකච්ඡාවක් ඇතිවන විට ඒකට පක්ෂව කතා කිරීමට මම අදහස් කරනවා.

ෆෙඩරල් සහ ඒකීය යන කාරණා පිළිබඳව ජනතාව ඉන්නේ වැරදි අවබෝධයකයි

මධ්‍ය - පර්යන්ත සබඳතා
අනු කමිටුවේ සභාපති
ධර්මලිංගම් සිද්ධාර්ථන්

ආණ්ඩුකම ව්‍යවස්ථා සම්පාදනයට අදාළ අනුකමිටු වාර්තා සම්පාදනයේ දී මහජන අදහස් ලබා ගැනීමේ කමිටු වාර්තාව (PRC Report) ද එක් අංගයක් ලෙස භාවිත කළෙමු. අපගේ මධ්‍ය පර්යන්ත කමිටුව බලය බෙදීම පිළිබඳ ව අදහසක් මේ ඔස්සේ ඉදිරිපත් කර නොමැත. නමුත් ඇතැම් පක්ෂ බලය බෙදීම පිළිබඳ යෝජනා අප කමිටුවට ඉදිරිපත් කළේ ය. අප ඒකී යෝජනා පාර්ලිමේන්තු තේරීම් සභාවට යොමු කළෙමු. තව ද පළාත් පාලන ක්‍රමය, දිස්ත්‍රික් පාලන ක්‍රමය හා පළාත් වැනි කාරණාවලට අදාළ ගැටලු සහ පරතරයන් පිළිබඳ සොයා බලා වාර්තා කළෙමු. මෙම වාර්තාව පිළිබඳ අග්‍රාමාත්‍යතුමන් අදහස් දැක්වීමේ දී මෙම අනුකමිටු වාර්තාවන්වල අඩංගු සියලු කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වේද නැද්ද යන ප්‍රශ්නය මතු කළේ ය. මෙම අනු කමිටු වාර්තාව සම්පාදනය කිරීමේදී අප කමිටු නියෝජිතයින් අතර විවිධ මත දරන්නන් සිටිය ද

srilankabrief.org



උතුරු පළාත් මහ ඇමති සී. විග්නේෂ්වරන්

ෆෙඩරල් යන අදහස පිළිබඳ ව සිංහල සහ දෙමළ පුරවැසියන් සිටින්නේ අන්ත දෙකක ය. එය කාලයක් තිස්සේ පවතින්නකි. මේ කාරණය පළිබඳව අන්තවාදීව කටයුතු නොකර සුළුතර හා බහුතර දෙපිරිස ම නිවැරදි ක්‍රියාමාර්ගයක් පිළිබඳ ව හඳුනා ගැනීම ඉතා වැදගත් ය. පසු ගිය අවුරුදු 60 ක පමණ කාලය තිස්සේ අප එය අත්දැක්කෙමු.

කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට වග බලා ගත්තෙමු. අප කණ්ඩායමේ, මහජන අදහස් ලබා ගැනීමේ කමිටුවේ නියෝජිතයින් සිටීම නිසා බොහෝ කාරණා පිළිබඳව අධ්‍යයනය කිරීම පහසු විය. තව ද මෙම ක්‍රියාවලියට විද්වතුන්, පළාත් පාලන නියෝජිතයින්, මහ ඇමතිවරු, විපක්ෂ නායකයන්, පක්ෂ නායකයින්, වෙනත් පක්ෂ නියෝජිතයින් සහ බුද්ධිමතුන්ගේ අදහස් ද ඇතුළත් වී ඇත. අප කිමිටුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ බොහෝ කාරණා ඉතා ගැඹුරෙන් අධ්‍යනය කළ අතර එහි ආණ්ඩුකාරවරයාගේ අධික බලතල නිසා පළාත් සභාවේ ක්‍රියාකාරිත්වයන්ගේ බොහෝ ගැටළු ඇති බව හඳුනා ගැනුණි.

තවද ග්‍රාම රාජ්‍ය පිළිබඳ සංකල්පයක් මෙම වාර්තාවේ ඇතුළත් වී ඇති අතර ඒ ක්‍රමවේදය පවතින පාලන ක්‍රමයේ සිව්වන පාලන ක්‍රමයක් බවට කිසිදු අවස්ථාවක පත් විය යුතු නැත. එසේ ම පළාත් පාලන හා පළාත් සභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වයන්ට එකී ග්‍රාම රාජ්‍ය සංකල්පය ගැටලුවක් නොවිය යුතු ය. එකී අදහස මහජන අදහසක් හැටියට අප භාර ගන්නා අතර බලය බෙදීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා මහජනයා අතට බලය ලැබීමට ක්‍රමවේදයක් ලෙස මෙය හඳුනා ගත්ත ද එය කුමන ආකාරයට තෝරා පත් කර ගන්නේද යන්න, එහි නිලධාරීන් කවුරුන්ද, ඡන්දයක් නොමැතිව ඔවුන් තෝරා පත් කරගන්නේ කෙසේද ආදී කරුණු සහ ප්‍රායෝගික තත්ත්වයේදී මෙය කෙතෙරම් දුරට සාර්ථක වේද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැත.

මැතිවරණ ක්‍රමය ඔස්සේ ජනතාවගේ පරාමාධිපත්‍ය තහවුරු කර ඇත. නමුත් ජනතාව එය නිවැරදිව භාවිත කරනාවාද යන්න ගැටලුවකි. වර්තමානයේ පළාත් පාලන ඡන්දයක් මහ මැතිවරණයක් සේ ප්‍රමුඛකොට පැවැත් වේ. ඒ නිසා පළාත් පාලන ක්‍රමය ද විනාශ මුඛයට පත්ව ඇත. මෙහිදී කොට්ඨාස ක්‍රමය අගය කළ යුතු ය.

ෆෙඩරල් යන අදහස පිළිබඳ ව සිංහල සහ දෙමළ පුරවැසියන් සිටින්නේ අන්ත දෙකක ය. එය කාලයක් තිස්සේ පවතින්නකි. මේ කාරණය පළිබඳව අන්තවාදීව කටයුතු නොකර සුළුතර හා බහුතර දෙපිරිස ම නිවැරදි ක්‍රියාමාර්ගයක් පිළිබඳ ව හඳුනා ගැනීම ඉතා වැදගත් ය. පසු ගිය අවුරුදු 60 ක පමණ කාලය තිස්සේ අප එය අත්දැක්කෙමු. අනාගතයේ දී අන්තවාදීව කටයුතු නොකළ යුතු ය. දීර්ඝකාලීනව සිතා විධිමත් ක්‍රියාවලියක් හඳුනා ගැනීමට මෙය උචිත අවස්ථාවකි. මෙම අවස්ථාව මගහැරියහොත් මින් පසුව මෙවැනි තත්ත්වයක් ඇතිවේද යන කාරණය ප්‍රශ්නාර්ථයකි. එම නිසා මෙම ක්‍රියාවලියට සියලු දෙනා සහයෝගය ලබා දිය යුතු ය. විශේෂයෙන් ම කිසිදු වෙනසක් නැති (1978 වැනි) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට පිළිගත නොහැකි ය. ෆෙඩරල් යන්න අපගේ අදහසයි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එකී අදහස ඇතුළත් වන්නේ ද යන්න ඉවසීමෙන් යුතුව බැලිය යුතු ය. පුරවැසියන් බොහෝමයක් ෆෙඩරල් යනුවෙන් අදහස් කරන්නේ රට බෙදනවා යන්නයි. ඒකීය රජයක් යනුවෙන් සුළුතර ජනයා අදහස් කරන්නේ ඔවුන්ගේ අයිතීන් විනාශ කරන ක්‍රමවේදයක් හැටියට ය. මේවා නිසි ආකාරයට අර්ථකථනය කර ගත යුතු ය.

ලාංකේය ආණ්ඩුව ඒකීය පාලනයක් යන අදහසේ දැඩිව සිටිය ද ෆෙඩරල් ක්‍රමයේ ලක්ෂණ සහ ඒ පිළිබඳ ව යෝජනා කිසිවක් අවසානය තෙක් අපට අත් හල නොහැකි ය. විශේෂයෙන් ලාංකේය ඉතිහාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය යන පක්ෂයන් මාරුවෙන් මාරුව ෆෙඩරල් ක්‍රමය පිළිබඳ ගිවිසුම් ඇති කළ අතර ඒ පක්ෂම එකී ගිවිසුම් විනාශ කර ඇත. ඒ නිසා සම්මුති ආණ්ඩුව ඔස්සේ මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑම අගය කළ යුතු කාරණයකි. ෆෙඩරල් ක්‍රමයක් ඔස්සේ සියයට සියයක වෙනසක් ඇති කළ හැකිද යන්න විශ්වාස කළ නොහැකි නමුත් කාලයත් සමඟ එය ක්‍රියාත්මක වනු ඇත.

සිංහල ජනතාව දෙමළ ජනතාවට බලය වැඩි පුර ලබාදුන හොත් එයට විරුද්ධ විය හැකි ය. ඒ නිසා ජනමත විචාරණයේදී ගැටලුවක් ඇති විය හැකි ය. මෙය ඉතා දුෂ්කර ක්‍රියාවකි. ජනමත විචාරණය ජය ගත හොත් එය සියලු පුරවැසියන්ට සුබවාදී වේ. නමුත් එය නිශ්චිතව කිව නොහැකි ය. බොහෝ මිනිසුන් අන් අයගේ කට කතා අනුව කටයුතු කරයි. ඒ නිසා සමාජයට මඟ පෙන්වන පිරිස් නිවැරදි මාවත පෙන්වා දිය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේදී පක්ෂ භේදයකින් තොරව අපි කටයුතු කළෙමු. මේ ක්‍රියාවලිය ඉදිරියට පවත්වාගෙන යාමට පසු ගිය ආණ්ඩුවේ දකුණේ සිටි නියෝජිතයින් සහ වර්තමාන ආණ්ඩුවේ නියෝජිතයින් බොහෝ දෙනෙකුට මේ ක්‍රියාවලිය පිළිබඳ අදහසක් නොමැත. ඇතම් පාර්ලිමේන්තු නියෝජිතයින් අනාගතයේ නැවතත් පාර්ලිමේන්තුවට ඇතුළු වීමට හා තමන්ගේ ධුරය පවත්වාගෙන යාම සඳහා වැඩි අවධානයක් ලබා දෙයි. යුද්ධය හමාරවීමෙන් පසු ලංකාවේ ප්‍රශ්න කිසිවක් නැති බව බහුතරයගේ අදහසක් වේ. අවුරුදු 30ක යුද්ධයක් නිමා කළ නිසා හිටපු ජනාධිපති සහ එම ආණ්ඩුවට අදටත් කලගුණ සැලකිය යුතුයැයි බොහෝ අය කල්පනා කරති. කුමන බාධාවන් ආවත් මෙම ක්‍රියාවලිය දිගින් දිගට ම පවත්වාගෙන ගොස් ක්‍රියාත්මක කළ යුතු ය. දෙමළ ජනයා බොහෝ කලක සිට බලාපොරොත්තු වෙන විසඳුමක් ඇත. ඊට අඩු විසඳුමකට කිසිම අවස්ථාවකදී සහයෝගය ලබා දිය නොහැක. එසේ ම සිංහල ජනතාව දෙමළ ජනතාවට බලය වැඩි පුර ලබාදුන හොත් එයට විරුද්ධ විය හැකි ය. ඒ නිසා ජනමත විචාරණයේදී ගැටලුවක් ඇති විය හැකි ය. මෙය ඉතා දුෂ්කර ක්‍රියාවකි. ජනමත විචාරණය ජය ගත හොත් එය සියලු පුරවැසියන්ට සුබවාදී වේ. නමුත් එය නිශ්චිතව කිව නොහැකි ය. බොහෝ මිනිසුන් අන් අයගේ කට කතා අනුව කටයුතු කරයි. ඒ නිසා සමාජයට මඟ පෙන්වන පිරිස් නිවැරදි මාවත පෙන්වා දිය යුතු ය.

සංවාද සටහන
ජේ. සුරේෂ් කුමාර්

athavansrilanka.com

උදය ගම්මන්පිල හා විමල් වීරවංශ

srilankabrief.org

විපක්ෂ නායක ආර්. සම්බන්ධන්

මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාව පිළිබඳ යාපනයේ විශ්ව විද්‍යාලයේ පැවති සාකච්ඡාව

මහජන අදහස් විමසීමෙන් පසු ජනතා අදහස්වලින් බිඳක්

හැඳින්වීම

නව ආණ්ඩුක්‍රම ව්‍යව්‍යස්ථව නිර්මාණය කිරීමේ කාර්යයට පුරවැසියන් සක්‍රියව දායක කරගත යුතු බව ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පුමුඛ 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ' අදහස විය. ඒ නිසාවෙන් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පුරවැසියන් දැනුවත් කිරීමේ කාර්යය ආරම්භ කෙරිණි. එය සාර්ථකව දිවයිනේ විවිධ ප්‍රදේශවල පැවැත්වෙන අතරවාරයේදී ම ආණ්ඩුව විසින් නීතිඥ ලාල් විජේනායක මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව' පත් කෙරුණි. පසුව ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය පුරවැසියා දැනුවත් කිරීමේ කාර්යේදී මහජන අදහහස් විමසීමේ කමිටුව සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව ද දැනුවත් කළේ ය. එහිදී දිවයින පුරා පුරවැසි ජනතාව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුතු යැයි ඔවුන් විශ්වාස කරන බොහෝ අදහස් හා යෝජනා ලබා දුන්හ.

මහජන අදහස් හා යෝජනා ලබා ගැනීමෙන් පසුව ලාල් විජේනායක කමිටු වාර්තාව එළිදැක් වූ නමුත් ඒ පිළිබඳ පුරවැසින්ගේ දැනුම අල්ප විය. එකී කමිටු වාර්තාව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය වන පාර්ලිමේන්තුවට ලබා දී තිබුණ ද අදහස් හා යෝජනා ලබා දුන් පුරවැසියන්ට වාර්තාව පිළිබඳ දැනුවත් වීමේ අවස්ථාව නොලැබුණි.

පුරවැසියන්ට කමිටු වාර්තාව ගැන දැන ගැනීමට අවස්ථාව හිමි වූයේ වාර්තාව මිළ දී ගැනීමෙන් හෝ අන්තර්ජාලයේ ඇති මෘදුකාංග පිටපත ලබා ගැනීමෙන් පමණි. නමුත් එය සියලු දෙනාට ම පහසුවෙන් සිදු කළ හැකි කාර්යයක් නොවීය.

මේ හේතුව නිසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා අදහස් හා යෝජනා ලබා දුන් පුරවැසියන් ඔවුන්ගේ අදහස් සහ යෝජනාවලින් සැදුම්ලත් කමිටු වාර්තාව පිළිබඳ දැනුවත් විය යුතු බව ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ අදහස විය. ඒ නිසා දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි මහජන අදහස් විමසීමේ කමිටුවාර්තාව පිළිබඳ මහජන අසංවාද පැවැත් වීම සිදු විය. එහිදී මහජන අදහස් විමසීමේ කමිටුවට අදහස් දුන් නොදුන්, මේ වෙනුවෙන් සක්‍රීයව කටයුතු කරන පුරවැසි කණ්ඩායම් සහභාගී කර ගැනුණි. එම පුරවැසි දැනුවත් කිරීමේ වැඩසටහන් අදියර කීපයක් යටතේ දිවයිනේ සියලු ම දිස්ත්‍රික්ක නියෝජනය වන ලෙස සිදු කළ අතර විශ්වවිද්‍යාලවල තරුණ කණ්ඩායම් ද සහභාගී කර ගැනුණි.

එහිදී කමිටු වාර්තාවේ ඇතුළත් නිර්දේශන්හි සාරාංශයක් මෙන් ම නීතිඥ එස්.ජී. පුංචිහේවා විසින් පරිවර්තනය කළ ව්‍යවස්ථා සම්පාදනයට අදාළ ග්‍රන්ථ හතෙන් යුත් කට්ටලයක් ලබා දුන් අතර එය පුරවැසියන් ට ව්‍යවස්ථා සම්පාදන කාර්යය පිළිබඳවත්, තමන්ගේ යෝජනාවලින් යුත් නිර්දේශ ව්‍යවස්ථාවකට ඇතුළත් කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳවත් දැනුවත්වීමට මහඟු පිටිවහලක් විය.

මෙම සංවාද මාලාවේදී ලයනල් ගුරුගේ, එස්.ජී. පුංචිහේවා යන මහත්වරුන් කමිටු වාර්තාව ගැනත් එහි නර්දේශ ගැනත්, මේ මොහොතේ පුරවැසියාගේ කාර්යය භාර්යය ගැනත් සඳහන් කරමින් පුරවැසියන් දැනුවත් කළ අතර ඇතැම් සංවාද සඳහා මහජන අදහස් විමසීමේ කමිටුව නියෝජනය කරමින් එහි සභාපති නීතිඥ ලාල් විජේනායක මහතා, ආචාර්ය විජේචන්ද්‍රන් සහ තවරාසා මහතා යන කමිටු නියෝජිතයෝ ද සහභාගී වූහ.

මහජන අදහස් විමසීමේ කමිටුවාර්තාව පිළිබඳ පසුකථනයහිදී වඩාත් සාධනීය අදහස් පළ වූ අතර අතැම්හු නැගූ ප්‍රශ්න කීපයක් කැපී පෙනුණි. ඒවා නම්,

ඇතැම් පුරවැසි අදහස් වාර්තාවට ඇතුළත් නොවීම.

ඇතැම් නිර්දේශ පිළිබඳ තෘප්ත නොවීම.

උතුරු නැගෙනහිර සැබෑ අදහස අන්තර්ගත නොවීම.

පුරවැසියන් සහභාගීකරගෙන සිදු කරන නව ව්‍යවස්ථා සම්පාදනය සාධනීය කාර්යයක් බැවින් උක්ත ප්‍රශ්න නිකරුණේ බැහැර කිරීමට නොහැකි ය. ඒ නිසා මෙම කාරණා පිළිබඳව මජහන සංවාදයක්, සමාජ කතිකාවතක් ඇති කළ යුතු ය. විවිධ දිස්ත්‍රික්කවලදී

මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාව පිළිබඳ සාකච්ඡාවට හම්බන්තොට රන්න ප්‍රදේශයේ ජනතාව එක් වෙමින්

අනුරාධපුර ප්‍රදේශයේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

පුරවැසියන් ඉදිරිපත් කළ අදහස් මජන අදහස් විමසීමේ කමිටු වාර්තාවේ අන්තර්ගත වූ ඒවා ද විය. අප මෙහි දක්වන්නේ අනුකමිටුවලට ද ඇතුළත් වී නොමැති, උතුර සහ දකුණේ පුරවැසියන් පොදුවේ ඉදිරිපත් කළ කරුණු ය. ඔවුන් බොහෝ කරුණු ඉදිරිපත් කළ ද වඩාත් වැදගත් අත්‍යාවශ්‍යම යෝජනා මෙසේ දක්වනු ලැබේ. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා මෙය යම් බලපෑමක් කරනු අත.

ආගමික සහජීවනය

ආගම යන්න පුරවැසියන්ට වඩාත් සංවේදී කාරණාවකි. උතුරු නැගෙනහිර මෙන් ම දකුණේ සමාජයේ තත්ත්වය ද සමාන ය. එම නිසා මේ පිළිබඳ පළ වූ පුරවැසි අදහස් පොදුවේ ගොනු කළ හැකි ය.

ව්‍යවස්ථානුකූලව ආගම්වලට සම ස්ථානයන් ලබාදීම,

අනෙකාගේ ආගමට ගෞරව කිරීම,

මෙහිදී ව්‍යවස්ථාව මූලික නෛතික ලියවිල්ල ලෙස සැලකිය යුතු මුත් සමාජීය වශයෙන් ආගමික සහජීවනය ගොඩ නැගෙන ක්‍රමවේදයක් ඇති කිරීම වැදගත් ය.

ආගමික සහජීවන ඇතිකිරීම සඳහා ජාතික සංහිඳියා කොමිසසක් පත් කළ යුතු ය.

ඉඩම් පිළිබඳ ගැටලුව

ලංකාවේ සියලු ම ප්‍රදේශවල ඉඩම් පිළිබඳ තත්ත්වය පොදු ය. උතුරු නැගෙනහිර ප්‍රදේශවල හමුදාව භාරයේ ඇති පුරවැසියන්ගේ ඉඩම් නැවත අදාළ හිමිකරුවන්, මුල් පදිංචිකරුවන් සොයා ලබා දිය යුතු ය.

ඉඩම් පිළිබඳ ව විද්‍යාත්මක ගවේෂණයක් සිදු කළ යුතු ය,

ඉඩම් බෙදී යෑම පිළිබඳ සාධාරණ වූත්, විධිමත් වූත් ක්‍රමවේදයක් යටතේ සිදු විය යුතු ය,

නොයෙක් ආයෝජකයින්ට ඉඩම් ලබාදෙන්නේ නම්, විශේෂයෙන් ම විදේශ ආයෝජකයින්ට, දේශපාලඥයින්ගේ හෝ ඉහළ නිලධාරීන්ගේ තනි මතයට ක්‍රියා නොකළ යුතු අතර ජාතික මට්ටමේ ප්‍රතිපත්තිවලට අනුකූලව ඉඩම් ලාබදීම සිදු විය යුතු ය.

ඉඩම් සම්බන්ධව ඇති ප්‍රතිපත්ති කාලයෙන් කාලයට ආණ්ඩුමාරුවන විට වෙනස් නොවිය යුතු අතර සෑම කාලයට ම පවතින ජාතික ප්‍රතිපතතියක් ඇති කළ යුතු ය. ව්‍යාපාරික මට්ටමින් ඉඩම් වෙන්දේසි කිරීම, අලෙවිකිරීම වැනි ක්‍රියා පිළිබඳ නිසි අධීක්ෂණයක් පැවතිය යුතුය ඒ සඳහාත්, ඉඩම් සම්බන්ධව සිදුවන සියලු අක්‍රමිකතා දුරු කිරීම සඳහාත් ස්වාධීන කොමිෂන් සභාවක් පත් කළ යුතු ය.

ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ පුළුල් සංවාදයක් ඇති කිරීම.

නව ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් නෙමැත්තේ ඒ පිළිබඳ මනා සංවාදයක් සමාජයේ ඇති නොවීම නිසා ය. ඒ නිසා ආණ්ඩුව මැදිහත්වී හෝ මෙම සංවාදය වඩාත් පුළුල්ව රට පුරා පැවැත්විය යුතු බව සියලු පුරවැසියන්ගේ මතය වේ.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ඇති සංවාදය දකුණේ සමාජයට ගෙන යා යුතු බව උතුරේ පුරවැසියන්ගේ අදහසයි. උතුරේ පුරවැසියන් බලය විමධ්‍යගත කිරීමේ අදහස අනුව සිටිය ද දකුණේ සිංහල සමාජයේ ඒ පිළිබඳ තැකීමක් නොමැති නිසා මෙම සංවාදය දකුණේ දියත් කිරීම වඩාත් යෝග්‍ය බව ඔවුහු පවසති.

මෙහිදී උතුරු නැගෙනහිර සමාජයට දෙමළ විද්වතුන් ඔස්සේ ද දකුණේ සමාජයට සිංහල විද්වතුන් මගින් ද මෙම සංවාදය රැගෙන යා යුතු අතර භාෂා ප්‍රතකිපත්තිය සුරැකෙන සේ එහිදී කටයුතු කළ යුතු ය.

භාෂා ප්‍රතිපත්තිය සුරැකීම.

භාෂා ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම සඳහා ඒ වෙනුවෙන් ම පිහිටුවා ඇති අමාත්‍යාංශයක් සහ වෙනත් ආයතන ඇති මුත් තවමත් දිවයින පුරා එකී ප්‍රතිපත්තිය නිසි ආකාරයෙන් සුරැකෙන්නේ නැත. එම නිසා තව දුරටත් මෙය නොවිසඳුණ ගැටලුවක් ව පවතියි. එම නිසා භාෂා ප්‍රතිපත්තිය ආරක්ෂ කාරීම කඩිනම් කළ යුතු අතර පහත අංශ කෙරෙහි සැලකිලිමත් වීම වඩාත් යෝග්‍ය වේ.

භාෂා කොමිසම පාර්ලිමේන්තුවට පමණක් වග කියන, භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝණය වූ අවස්ථාවකදී නිසි පියවර ගැනීම සඳහා බලතල සහිත ස්වාධීන කොමිසමක් බවට පත් කිරීම,

පාසල්වල මෙන්න ම උසස් අධ්‍යාපන ආයතනවල ද තමන්ගේ මව් භාෂාවෙන් හෝ තමන්ට කැමති භාෂාවකින් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ශිෂ්‍යයින්ට හිමි වීම.

ණය සහ වෙනත් මූල්‍ය ගනුදෙනු

රාජ්‍ය සහ පෞද්ගලික සමාගම් මඟින් ණය ප්‍රදානය කිරීම් සහ එවැනි වෙනත් මූල්‍ය ගනුදෙනුවලදී සිදුවන අක්‍රමිකතා වළක්වා ගැනීම සඳහා එම ක්‍රියාවලීන්ට අදාලව පොදු ප්‍රතිපත්ති සකස් කළ යුතු ය.

එසේ ම කුමන ආයතනයක් ඔස්සේ එවැනි ගනුදෙනු සිදු වුව ද ඒවා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පාලනය වීම සහ ඒවා ට මහ බැංකුවේ අනුමැතිය ද හිමි විය යුතු ය.

නීති සහ ප්‍රතිපත්ති සම්පාදයේ දී ජනතා අදහස් විමසීම

පාර්ලිමේන්තු පනත්, පළාත් සභා ප්‍රඥප්ති සහ පළාත් පාලන අයාතනවලින් සම්මත කෙරෙන අතුරු නීති ආදී කුමන නීතියක් සම්පාදනයේ දී වුව මහජනතාවගේ අදහස් විමසීම අනිවාර්යය විය යුතුය.

අදාළ නීතිය සකස් කර ඊට අදාළ කෙටුම්පත් සාකච්ඡාවට ගැනීමට කලියෙන් එවැනි නීතියක් සම්පාදනය වන බවත්, ඒ සඳහා ජනතා අදහස් අවැසි බවත් දන්වමින් ජනතාවගේ අදහස් ලබා ගත යුතු ය.

මහනුවර ප්‍රදේශයේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය, පළාත් ලේකම් සභා ලේකම් කාර්යාලය හා පළාත් පාලන ලේකම්වරුක් ඔස්සේ හෝ එවැනි ව්‍යුහයක් ඔස්සේ නව නීති සම්පාදනයන් පිළිබඳ පුරවැසියන් දැනවත් කිරීම සහ මහජන අදහස් ලාබා ගැනීමට පියවර ගත යුතුය.

පුරවැසියන් ට වඩාත් යෝග්‍ය නීති සම්පාදනය කර ගැනීම සහ දේශපාලනඥයින්ටත්, ඉහළ රාජ්‍ය නිලධාරීන්ටත් ඔවුන්ගේ අභිමතය අනුව කටයුතු කිරීම වළක්වාලීම මෙහිදී සිදු විය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ භාෂා අයිතිය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ පුරවැසියාට නිවැරදි අවබෝධයක් නොමැතිකම නිසා පුරවැසියා නිර්දේශපාලනික සත්ත්වයකු මෙන් දේශපාලනඥයින්ගේ අතකොළු බවට පත් ව තිබේ. මේ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් දරුවන්ට කුඩා කල සිට අවබෝධයක් ලබා දිය යුතු අතර ඒ ඔස්සේ පරිපූර්ණ පුරවැසියෙකු ගොඩනැගනීමට කටයුතු කළ යුතු ය.

තුන හතර ආදී පංතිවල සිට ජාතික ධජය, ජාතික කොඩිය, ජාතික ගීය ආදිය මෙන් ම ඉතා සරළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දරුවන්ට දැනුම දීම සඳහා පාසල් විෂය නිර්දේශයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ව්‍යවස්ථාව හා පුරවැසියා අතර ඇති සම්බන්ධතාව සහ භාෂා අයිතිය සුරැකීම සහ අනෙකාගේ භාෂාවට ගරු කිරීම පිළිබඳ පාඩම් මාලාවක් ඇතුළත් කළ යුතු ය.

අධ්‍යාපන විශේෂඥයින් විසින් ඉතා සරළව සකස් කරන ලද පාඨමාලාවන් මෙසේ ඇතුළත් කළ යුතු අතර අපොස සාමාන්‍ය පෙළ විභාගයේ දී එකී පාඨමාලාව පාදක කර ගනිමින් ද ප්‍රශ්න පත්තර සැකසිය යුතු ය. ඒ සඳහා සුදුසු විෂයකට ව්‍යවස්ථා අධ්‍යාපනය සහ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ පාඨමාලාව ඇතුළත් කළ යුතු යුතු ය.

මැතිවරණ කොමිසම බලතල තවත් පුළුල් විය යුතු ය.

වත්මනේ කොමිෂන් සභා ස්වාධින ආයතන ලෙස පැවතිය ද ඇතැම් අවස්ථාවල ඒ ඒ විෂයයන්ට අදාළ අමාත්‍යාංශවලින් හෝ වෙනත් ඉහළ ආයතනවලින් බලපෑම් ඇතිවීම මුසාවක් නොවේ. ඒ නිසා මැතිවරණ කොමිසම පාර්ලිමේන්තුවට පමණක් වගකියන ස්වාධීන කොමිසමක් වන අතර ඒ ඔස්සේ පහත කාරණා පිළිබඳව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය බලතල ප්‍රදානය කළ යුතු ය.

පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම මෙහි දී වැදගත් ය. බොහෝ පක්ෂ ව්‍යවස්ථාවන්ට අනුව ඒවායේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නොරැකේ. ඒ ඔස්සේ අගතියක් සිදු වන්නේ පක්ෂ සාමාජිකයන්ට ය. එනම් පුරවැසියන්ට ය. පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය අරක්ෂා කිරීම කෙරෙහි අවවාද උපදෙස් ලබාදීමට කොමිසමට බලය හිමි විය යුතු ය.

බදුල්ල ප්‍රදේශයේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

යාපනය ප්‍රදේශයේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

එහිදී පක්ෂ අරමුදල් සම්බන්ධ විගණනයන් සහ අයවැය වාර්තා පක්ෂ සාමාජිකයින්ට ඉදිරිපත් කිරීම,

මන්ත්‍රීවරු නැවත කැඳවීම,

මැතිවරණ නීති උල්ලංඝන කළ හොත් ඊට දඬුවම් ලබාදීම,

ආදි කාරණා සම්බන්ධ කොමිසමට බලය හිමි විය යුතු ය.

පාර්ලිමේන්තු මැතිවරණයේ සිට පළාත් පාලන මැතිවරණ දක්වා තරඟ කරන අපේක්ෂකයෙකුට වියදම් කළ හැකි උපරිම මුදල සම්බන්ධයෙන් තක්සේරු කිරීමට සහ එකී තක්සේරුවට වඩා යම් අපේක්ෂකයෙක් විදයම් කර ඇත්නම් ඒ පිළිබඳ සොයා බැලීමට කොමිසමට බලතල හිමිවිය යුතු ය.

මේ ඔස්සේ අපේක්ෂා කෙරෙන්නේ අත්තනෝමතික ලෙස මුදල් නාස්තිය වළක්වා ගැනීම සහ මුදල් නාස්තිය ඔස්සේ සකස්ව තිබෙන ප්‍රතිපත්ති ගරුක නොව අශ්ශීල මැතිවරණ සංස්කෘතිය නවතා දැමීම

ග්‍රාම රාජ්‍ය සංකල්පය

දේශපාලන ක්‍රියාවලිය සඳහා පුරවැසියන් ඍජුව දායක කර ගැනීමත්, දේශපාලන ආයතනවල හා නිලධාරී තන්ත්‍රයේ අකර්මන්‍යතාව හා දූෂණය මඟහරවා ගැනීමටත් ග්‍රාම රාජ්‍ය සංකල්ය වඩාත් යෝග්‍ය ය.

මෙය ග්‍රාම නිලධාරී කොට්ඨාසකට එක බැගින් ස්ථාපිත කළ යුතු ය. මෙහිදී පළාත් පාලන අයාතනවල පමණක් නොව පළාත් සභා සහ පාර්ලිමේන්තුව ඔස්සේ සිදු කෙරන ව්‍යාපෘති සහ වෙනත් කටයුතුවලට ද උපදෙස් හා නිරීක්ෂණයන් සපයමින් අධීක්ෂණය කිරීමේ බලතල තිබිය යුතු ය.

ග්‍රාමීය රාජ්‍ය දේශපාලන පක්ෂ භේදයකින් තොරව ගම්මට්මේ සිවිල් ක්‍රියාකාරීන්ගේ නියෝජනයෙන් සකස් විය යුතු අතර එයට දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති හෝ න්‍යායන් ඈඳා නොගත යුතු ය.

මේ සඳහා ආදර්ශයක් වශයෙන් දැනටමත් උතුර, නැගෙනහිර, ඌව, මධ්‍යම සහ දකුණේ ගම්මානවල ක්‍රියාත්මක වන පුරවැසි සභා සංකල්යය කෙරෙහි අවධානය යොමු කිරීම යෝග්‍ය ය.

විවාහය සම්බන්ධ පොදු නීති

විවධ වාර්ගික කණ්ඩායම් සහ සංස්කෘතීන්ට අනුව විවාහය සම්බන්ධයෙන් නොයක් නීති සමාජගතව ඇති මුත් ඒවා ඇතැම්විට පුරවැසියන්ව මානසික ව හිංසනයට පත් කරන්නට සමත් වෙයි. කුලය, දෑවැද්ද ආදිය පදනම් කරගෙන ගොඩ නැගී ඇති සමාජ සම්ප්‍රදායන් නූතන ශිෂ්ට සම්මන්න සමාජයකට යෝග්‍ය නොව බැවින් ශ්‍රී ලාංකාවේ සියලු පුරවැසියන්ට අදාල වන පරිදි විවාහය සම්බන්ධ එක් නීතියක් පමණක් සකස් කළ යුතු ය. දික්කසායද ආදී කාරණා වඩාත් සරළාකාරයෙන් සිදුවීම ද නවතා දැමිය යුතු අතර ඒ සඳහා දෙපාර්ශ්වයේම කැමැත්ත හිමි විය යුතු ය.

මළවුන් සැමරීම

කුමන සමාජ සංස්කෘතියක වුව මළවුන් සැමරීම සිරිතක් වශයෙන් සිදු වන්නකි. කුමන හේතුව නිසා මිය ගිය ද එකී පුද්ගලයා මේ

කන්තලේ ප්‍රදේශයේ ජනතාව ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

මහ පොළවේ ජීවියෙකු වශයෙන් ජීවත්ව කුමන හෝ සමාජ, දේශපාලන කාරණයක් අරබයා මළ ගිය, ඔහු හෝ ඇය සැමරීම ඒ ඒ සමාජය සංස්ථාවන් සතු අයිතියකි.

එබැවින් 1971, 1989, තරුණ අරගලයේදීත් 2009 යුද්ධයේදීත් මිය ගිය සියලු පුරවැසියන් සැමරීමේ අවස්ථාව හිමි විය යුතු ය.

පැවති 30 අවුරුදු යුද්ධයට අදාළව සිංහල සමාජය රණවිරුවන් සමරන විට උතුරේ දෙමළ සමාජයට යුද්ධයට සම්බන්ධ වූ දෙමළ සටන්කාමීන් සැමරීමේ අවස්ථාව ලබා දිය යුතු ය. මන්ද ඔවුන් යම් දේශපාලන සංවිධානයක් නියෝජනය කරනු ලැබුව ද මේ රටේම උපන් පුරවැසියන් වන නිසා ය. එසේ මිය ගිය අයගේ දෙමාපියන්ට සහ ඥාතීන් ට එකී වඅස්ථාව ලබාදීම මානුෂිකව සළකා බැලිය යුතු කරුණකි.

මූල්‍ය කොමිෂන් සභාව

මූල්‍ය කොමිසම ස්වාධීන ආයතනයක් විය යුතු අතර මහ බැංකුවට හෝ මුදල් අමාත්‍යාංශයට නොව පාර්ලිමේන්තුවට පමණක් වග කිව යුතු ය.

සියලු ම පළාත්වල ස්වභාවයන් අනුව මුදල් බෙදී යෑම සිදු විය යුතු අතර ලබා දෙන මුදල් නිසි ආකාරයෙන් පළාත් සංවර්ධන කටුයතු සඳහා යොදා ගන්නේ දැයි අධීක්ෂණය කළ යුතු ය.

මෙහි ව්‍යුහය සකස් කිරීම සඳහා PRC කමිටු වාර්තාවේ 18 පරිච්ඡේදය යටතේ ඇති කොමිසන් සභා සම්බන්ධ කාරණා සැලකිල්ලට ගත හැකි ය.

පාසල් අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය

කිසිදු පාසලක් ජාතික පාසලක් හෝ පළාත් සභා පාසලක් ලෙස නම් නොකළ යුතු ය. මාර්ගික පදනම් මත පාසල් නම් කිරීම නොකළ යුතු ය. වාර්ගික මිශ්‍ර පාසල් ඇති කළ යුතු ය. සියළු අදාළ පාසල් එම පළාත් සභාවේ පරිපාලනයට යටත් විය යුතුයි. මධ්‍ය ආණ්ඩුව සහ පළාත් අමාත්‍යාංශ ඔස්සේ පවත්වාගෙන යන සියලු පාසල්වල කටයුතු විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යැමට කටයුතු කළ යුතු ය. සියලු ම පාසල්වට ඒ ඒ විෂයයන්ට අදාළ ගුරුවරු සිටීම සහ අවශ්‍ය සම්පත් පිළිබඳව අදාළ අමාත්‍යාංශ වගකිව යුතු ය. කිසිදු පාසලකට කිසිම ආකාරයක අවම සැළකිල්ලක් නොදැක්විය යුතු ය.

පෞද්ගලික ආයතනවලින් ක්‍රියාත්මක කරගෙන යන පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන වල ප්‍රමිතිය කෙරෙහි සැළකිලිමත් විය යුතු අතර ඒවා අධීක්ෂණය කිරීමට විධිමත් පිළිගත් ආයතනයක් පත් කළ යුතු ය.

කිසිදු පෞද්ගලික ආයතනයකට රිසි පරිදි පාසල් හෝ උසස් අධ්‍යාපන ආයතන පවත්වාගෙන යෑමට ඇති ඉඩ කඩ අහුරා දැමිය යුතු ය.

ආර්ථික හා සමාජීය අයිතිවාසිකම

මහජන අදහස් ලබා ගැනීමේ කොමිසම සහ මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව නිර්දේශ කර ඇති පරිදි සියලු ම අයිතිවාසිකම් සඳහා අවස්ථා හිමිවෙනවා මෙන් ම ආර්ථික හා සාමාජීය අයිතිවාසිකම ද පිළිගත යුතුය.

හදිසි නීතිය හා ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය

හදිසි නීතිය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ නැවත අධීක්ෂණයක් කළ යුතු ය. මන් ද පාලකයින්ගේ දේශපාලන උවමනාවන් මත ඕනෑම පුරවැසියෙකු හදිසි නීතිය හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය යටතේ අත්අඩංගුවට ගැනීම සඳහා ඇති ඉඩ කඩ වැඩි ය.

එම නිසා හදිසි නීතිය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය යටතේ පුරවැසියන් අත්අඩංගුවට ගත හැකි අවස්ථා පිළිබඳ නිසි අර්ථ නිරූපණයක් අවශ්‍ය වන අතර ඒ පිළිබඳ පුරවැසියා දැනුවත් කළ යුතු ය.

වතුකරේ ජනතා ගැටලු

වතු අධිකාරී බලය, වතු සමාගම් බලය සහ රජයේ වතු සමාගම් වල ක්‍රියාකාරීත්වය වතුකර ජනතාවට හානිදායක නොවන අයුරින් ක්‍රියාත්මක විය යුතු අතර වතුකර ජනතාවගේ අයිතිවාසිකම් ලබා දිය යුතු යතු ය. ඒවා සුරක්ෂිත කිරීමට ඒ ඒ වතු සමාගම් කටයුතු කළ යුතු ය.

පරිපාලනය

සියලු ම පරිපාලන ක්‍රමවේදයන් විධිමත් කළ යුතු ය. අකර්නම්‍යව ඇති රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට සහ නිකරුණේ රාජ්‍ය ආයතනවල සිටින අතිරික්ත සේවකයින් නිසි රාජකාරී සඳහා යෙදවිය යුතු ය.

එසේ ම විවිධ විෂයයන්ට අදාළව නිලධාරීන් බඳවා ගැනීමේ දී එම නිලධාරීන්ට අදාළ විෂය සම්බන්ධ මනා පරිචයක් සහ භාවිතයක් තිබිය යුතු ය. එසේ නොවීම රාජ්‍ය සේවයේ අක්‍රමිකතා සිදුවීමට බොහෝ විට බලපා තිබේ.

උතුරු නැගෙනහිර ජනතා අදහස් PRC වාර්තාවේ නොමැතිවීම.

උතුරු නැගෙනහිර ජනතා අදහස්, මහජන අදහස් ලබා ගැනීමේ කමිටු වාර්තාවේ නොමැති බව එකී ප්‍රදේශවල ජනයාගේ පොදු දෝෂාරෝපණයක් විය. ඒ කෙරෙහි ව්‍යවස්ථා සම්පාදනයේ දී අවධානය යොමු කළ යුතු ය.

බලය බෙදීම

බලය බෙදීම සම්බන්ධයෙන් උතුරු නැගෙනහිර පුරවැසියන්ට සහ දකුණේ පුරවැසියන්ට ඇත්තේ එකිනෙකට වෙනස් ආකල්පයන් ය. උතුරේ පුරවැසියන් බලය විමධ්‍යගත කරන අදහසේ සිටිමින් ෆෙඩරල් ක්‍රමයක් පිළිබඳ ව යෝජනා කරන විට දකුණේ පුරවැසියන්ගෙන් බහුතරයකගේ අදහස ඒකීය රාජ්‍ය ක්‍රමය පවත්වාගත යුතුය යන්න යි.

මෙහිදී බලය බෙදාදුනහොත් උතුරු නැගෙනහිර වෙනම රාජ්‍යයක් ඇතිවේවි යන අනිසි බියකින් දකුණේ පුරවැසියන් පසුවන අතර ඒකීය රාජ්‍යක්‍රමය තුළ සුළුතර ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් මර්දනය වේ යන්න දෙමළ පුරවැසියෝ කල්පනා කරති.

උතුරු නැගෙනහිර පළාත් සභාවන් ඒකාබද්ධකරන්නේ නම් එය ජනමත විචාරණයක් ඔස්සේ සිදු කළ යුතු ය.

අග්නිදිග විශ්ව විද්‍යාලයේ සිසුන් ව්‍යවස්ථා සංවාද ක්‍රියාවලියට සහභාගී වෙමින්

ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ රේණුකා හෝටලයේ පැවති සංවාදයට සහභාගි වූ අයගෙන් කොටසක්

සනත් ජයසූරිය සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
සෝ ක්ලෝස්; සෝ ෆාර්

1997 වසරේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී පැවැති ටෙස්ට් තරගයේදී ශ්‍රී ලංකා පිතිකරුවන් වූ රොෂාන් මහානාම සහ සනත් ජයසූරිය දෙවන කඩුල්ල සඳහා වාර්තාගත සම්බන්ධයක් ගොඩනැගූහ. කාගේත් නෙත් සිත් යොමුව තිබුණේ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමේ සුපිරි පිතිකරු බ්‍රයන් ලාරා විසින් එංගලන්තයට එරෙහිව ටෙස්ට් ලකුණු 375ක් ලබමින් තබා තිබූ ලෝක වාර්තාව සනත් ජයසූරිය විසින් බිඳ දමන ආකාරය දෙසය. පිතිකරුවන්ගේ පාරාදීසයක් බඳු බෙත්තාරාම තණතිල්ලේ ඉන්දියානු පන්දු යවන්නන් අන්ද මන්ද කරමින් පන්දුවට පහර දුන් සනත් ජයසූරිය වාර්තාව බිඳ දැමීම ගැන කිසිවෙකුගේ සැකයක් නොතිබිණි. සමාජ ජාල මාධ්‍ය නොපැවතුණු ඒ කාලයේදී සාම්ප්‍රදායික ජනමාධ්‍ය විසින් ලබා දුන් දිරිගැන්වීම හමුවේ “ඉන්දියාවට ගේමක් දී” ලෝක වාර්තා බිඳින්නට යන අපේ එකාට මොරාල් සපෝට් එකක් දීමට ක්‍රිකට් ලෝලීහු පමණක් නොව දේශප්‍රේමීහුද ක්‍රීඩා මණ්ඩපවලට පැමිණියහ.

නීතිඥ
සුදර්ශන ගුණවර්ධන

එහෙත් දඟ පන්දුකරු අනිල් කුම්බ්ලේගේ පන්දුවකට කඩුල්ල මුවා කිරීමේ වරදට හසුවූ රොෂාන් මහානාම ලකුණු 225කට දැවී ගිය අතර ඊළඟ ඕවරයේදී රාජේෂ් චවුහාන්ගේ පන්දුවකට සවුරව් ගංගුලි වෙත උඩ පන්දුවක් ලබා දුන් සනත් ජයසූරිය ලෝක වාර්තාව පෙනි පෙනී ලකුණු 340කට දැවී ගියේ සියළු ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන් වික්ෂිප්ත කරමිනි. ලෝක වාර්තාව බිඳ හෙළීමේ අත ළඟටම පැමිණි මොහොතක අත ළඟටම පැමිණ සුළු අතපසුවීමකින් එම අවස්ථාව අහිමි වූ මේ අවස්ථාව පිළිබඳව මේ අවස්ථාවේ විස්තර විචාරකයෙකු මෙසේ ප්‍රකාශ කළේය: "සෝ ක්ලෝස්; සෝ ෆාර්!"

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් ස්වකීය උප කාරක සභා හයක් විසින් නිකුත් කළ වාර්තා නොවැම්බර් 19 වන දින අග්‍රාමාත්‍යවරයා විසින් සභාගත කළ අතර, මෙහෙයුම් කාරක සභාවේ අතුරු වාර්තාව දෙසැම්බර් 10 වන දින සභාගත කිරීමට නියමිතය. එහෙත් සිවිල් සංවිධාන සහ පුද්ගලයන් රාශියකගේ ප්‍රධානත්වයෙන් පසුගිය වසරේ ආරම්භ කරන ලද "ආණ්ඩුක්‍රම වෙනසකට පුරවැසි ප්‍රයත්නය" වැඩපිළිවෙළ විසින් "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය" නමින් පසුගිය නොවැම්බර් 30 වන දින කොළඹ රේණුකා හෝටලයේදී පැවැත්වුණු සාකච්ඡාවේදී පැහැදිලි වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයද 'සෝ ක්ලෝස්; සෝ ෆාර්' බවයි.

ඒකමතිකභාවය හඳුනාගැනීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මෙහිදී පැවසූ අයුරින්ම උප කාරක සභා විසින් සිය වාර්තා ඉදිරිපත් කර තිබුණත්, රාජ්‍යයේ ස්වභාවය, විධායක ජනාධිපති ක්‍රමය, ඡන්ද ක්‍රමය ඇතුළු තීරණාත්මක කරුණු සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ ඒකමතිකභාවය හඳුනා ගත හැකි වනුයේ ඒ පිළිබඳව කටයුතු කරන මෙහෙයුම් කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් වීමත් සමග බවය. උප කාරක සභාවන්හි වාර්තා විමසන විට පෙනී යන්නේ ඒවා එකී කාරක සභා තුළ ඇතිවූ එකඟතාවයන් වුවද, අනෙකුත් කාරක සභාවන්හි සාකච්ඡා වූ විෂය පථය කෙරෙහි අවධානයකින් තොරව සකස් වූවක් බැවින් ඒවා සමෝධානිත වාර්තාවන් ලෙස සැලකිය නොහැකි බවය. කෙසේ වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව මහජනයා අතර සංවාදය ආරම්භ කළ හැකි වන්නේ ආණ්ඩුව විසින් නිල වශයෙන් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බව ආචාර්ය සරවනමුත්තුගේ මතයයි.

කෙසේ වුවද මෙහිදී ඉලංකෙ තමිළරසු කච්චි පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ එම් ඒ සුමන්දිරන් පැවසුවේ "අපට අවශ්‍ය සාධාරණ ව්‍යවස්ථාවක්!" බවයි. "ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා බලයට පත්වූයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට

සංවාදයට සහභාගී වූ නිසාම් කාරියප්පර්, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, නීතිඥ සුමන්තිරන් යන මහත්වරු

එසේ නම් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම නමැති තනි සටන් පාඨය මත පුළුල් ව්‍යාපාරයක් ගොඩ නගා ඒ සඳහා එකඟ වන පොදු අපේක්ෂකයෙකු ජනාධිපති ධුරයට පත් කරවා, ඔහු හෝ ඇය මගින් ජනාධිපති ධුරය අහෝසි කිරීමට "සාධාරණ සමාජයක් උදෙසා ජාතික ව්‍යාපාරය"ත්, ඒ හා බැඳුණු " පුරවැසි බලය" වැනි අනෙකුත් සිවිල් සමාජ ව්‍යාපාරත්, ඒ සමග ගිවිසුම් ගත වූ දේශපාලන් පක්ෂත් එහිදී කළේ "ඇන්දවීමක්" හෝ "කොළේ වසා ගැසීමක්" නොවේ නම්, එම අරමුණ ඉටු කරගැනීම සඳහා ජනමත විචාරණයකට යාම අනිවාර්ය වේ.

වූ පොරොන්දුව සමගය. එමෙන්ම ඡන්ද ක්‍රමය වෙනස් කිරීමටද ඔහු පොරොන්දු විය. මේ පොරොන්දු දෙක ඉටුකිරීමට වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පැලැස්තර ඇලවීමෙන් එය සිදු කළ නොහැකි අතර ඒ සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය වේ." යැයි නීතිඥ එම් ඒ සුමන්දිරන් පැවසීය.

ජනමත විචාරණයක් අවශ්‍යයි

"විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නම් ජනමතවිචාරණයක් අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය පවසා ඇත. දැනට බොහෝ දෙනෙකු විසින් එකඟ වී ඇති ආකාරයේ වෙනසක් ඡන්ද ක්‍රමය වෙනස් කිරීම සඳහා යෝජනා කළහොත් එයද ජනමත විචාරණයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

මේ රටේ විවිධ ජන ප්‍රජාවන් අතර විධිමත් සමාජ ගිවිසුමක් නැතිවීම බොහෝ ප්‍රශ්නවලට හේතුවකි. එම සමාජ ගිවිසුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. අප ආණ්ඩුවේ බලය බෙදා හදා ගැනීම සඳහා වෙහෙසෙන විට සමාජ ගිවිසුම ගොඩ නඟා ගැනීමේ වගකීම අප වෙතින් බැහැර වේ. පළමුව අප එම සමාජ ගිවිසුම සකස් කොට ගත යුතුය. අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙස අවධානය යොමු කරන්නේ එබැවිනි." යැයි මෙහිදී සුමන්දිරන් මහතා ප්‍රකාශ කළේය.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෙවත් දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේ වන විට වසර 38ක ඉතිහාසයක් ඇත. එය ලංකාවේ වැඩිම කලක් භාවිතා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෙසද සැලකිය හැකිය. එම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේදී පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතර ඡන්දයකින් සම්මත විය යුතුය. එහෙත්, මෙම ව්‍යවස්ථාවේ මුල් ගල් බඳුවූ වගන්ති ගණනාවක් ඇති අතර එම වගන්ති සංශෝධනය කිරීමේදී හෝ එම වගන්තිවල පැවැත්මට බලපාන ආකාරයට වෙනත් වගන්ති අංශෝධනයේදී හෝ පාර්ලිමේන්තුවේ 2/3 ක වැඩි ඡන්දයට අමතරව ජනතාව වෙතින් ජනමත විචාරණයකදී අනුමත විය යුතුය.

ව්‍යවස්ථාවේ මුල්ගල්

සුමන්දිරන් මන්ත්‍රීවරයා කියන ආකාරයට ජනමත විචාරණයක් පැවැත්වීම අනිවාර්ය වෙයි. එයට හේතුව ජනාධිපතිවරණයේදී ලැබුණු ජනවරමට අනුව විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම හෝ ඡන්ද ක්‍රමය වෙනස් කිරීමේදී එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුල් ගලක් වන් "පරමාධිපත්‍යය" පිළිබඳ වගන්තියට අදාළ වෙනස් කමක් සිදු වන බැවින් එහිදී ජනමතවිචාරණයකදී ජනතා අනුමැතිය අවශ්‍ය වීමයි. විධායක ජනාධිපති ධුරයට අසීමිත බලයක් තිබෙන බව සාමාන්‍ය ජනප්‍රිය විශ්වාසයයි. විධායක ජනාධිපතිවරයෙකුට කළ නොහැක්කේ "ගැහැණියක පිරිමියෙකු කිරීමත්, පිරිමියෙකු ගැහැණියක කිරීමත්" පමණක් බව ජනවහරේ කියැවෙන්නේ එබැවිනි. විධායක ජනාධිපති ධුරය සතු බලතල සීමා කිරීම 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදු කළ අතර, ඉන් පසු 18 වන සංශෝධනය මගින් එම සීමා කිරීම අවලංගු කොට එම තනතුර තවත් බලවත් කරගැනීමට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කටයුතු කළේය. කෙසේ වුවද 2015 ජනවාරි 08 වෙනසත් සමගම ප්‍රකාශ වූ ජනතා අපේක්ෂාව පරිදි විධායක ජනාධිපති ධුරයේ

ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ රේණුකා හෝටලයේ පැවති සංවාදයට සහභාගි වූ අයගෙන් කොටසක්

බලතල සීමා කිරීම සඳහා 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන ලදී. එහිදී ජනාධිපති ධුරයේ අසීමිත බලතල සෑහෙන පමණ සීමා කිරීමට යෝජනා කළ නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ යම් මට්ටමකින් ඔබ්බට ජනාධිපති ධුරයේ බලතල සීමා කිරීමට ක්‍රියා කරන්නේ නම් එය ව්‍යවස්ථාවේ මුල්ගලක් සමග ගැටෙන බැවින් ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය බවය. එබැවින් ආණ්ඩුව තීරණය කළේ ජනමත විචාරණයකට මුහුණ නොදී සිදු කළ හැකි සංශෝධන පමණක් යෝජනා කොට සම්මත කිරීමටය.

ඒ අනුව වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ධුරයේ බලතල සීමා කිරීම කළ හැකි උපරිම මට්ටමට පැමිණ ඇත. එහෙත්, විධායක ජනාධිපති ධුරය තවමත් පවතී. එසේ නම් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම නමැති තනි සටන් පාඨය මත පුළුල් ව්‍යාපාරයක් ගොඩ නගා ඒ සඳහා එකඟ වන පොදු අපේක්ෂකයෙකු ජනාධිපති ධුරයට පත් කරවා, ඔහු හෝ ඇය මගින් ජනාධිපති ධුරය අහෝසි කිරීමට "සාධාරණ සමාජයක් උදෙසා ජාතික ව්‍යාපාරය"ත්, ඒ හා බැඳුණු "පුරවැසි බලය" වැනි අනෙකුත් සිවිල් සමාජ ව්‍යාපාරත්, ඒ සමග ගිවිසුම් ගත වූ දේශපාලන් පක්ෂත් එහිදී කළේ "ඇන්දවීමක්" හෝ "කොළේ වසා ගැසීමක්" නොවේ නම්, එම අරමුණ ඉටු කරගැනීම සඳහා ජනමත විචාරණයකට යාම අනිවාර්ය වේ.

ඡන්ද ක්‍රමය වෙනස් කිරීම නම් විෂය සම්බන්ධයෙන්ද මෙය මේ සමානවම අදාළ වේ. දැනට පවතින්නේ සමානුපාතික නියෝජන ක්‍රමයයි. එය සකස් කොට ඇත්තේ විධායක ජනාධිපති ධුරය සමග එකට පවතින ආකාරයටය. විධායක ජනාධිපති ධුරය එලෙසම තිබියදී සමානුපාත නියෝජන ක්‍රමය වෙනුවට පැරැණි කොට්ඨාශ ක්‍රමයට වැඩි බර වැටෙන යෝජිත ඡන්ද ක්‍රමයට ගිය හොත් එය ඇති කරන්නේ විකෘතියකි. එවන් වෙනස් කමක් ජනමත විචාරණයකින් තොරව සම්මත කළ හැකියයැයි ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරතැයි සිතීම උගහටය. එබැවින් ඒ සඳහාද ජනමත විචාරණයක් අවශ්‍ය වේ.

එමෙන්ම ජනාධිපතිවරණයේදී ජනාධිපතිවරයාට සහය දුන් ඉලංකෛ තමිළ්අරසු පක්ෂය ප්‍රමුඛ දෙමළ ජාතික සන්ධානය මහ මැතිවරණයේදී උතුරු නැගෙනහිර පළාත්වල පාර්ලිමේන්තු ආසන අති බහුතරයක් ලබා ගත්තේ ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් වෙනුවෙන් පෙනී සිටිමිනි. ඒ අනුව ෆෙඩරල් ක්‍රමයක් සඳහා උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ජනවරමක් ලැබී ඇතැයි තර්ක කළ හැකිය. මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තවත් මුල්ගලක් වන ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයකි යන වගන්තියට ෆෙඩරල් අදහස බලපාන බැවින් ෆෙඩරල් ලක්ෂණ සහිත බලය බෙදා හැරීමක් යෝජනා කළහොත් එයටද ජනමත විචාරණයක් අවශ්‍ය වනු ඇත. එයට

ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ රේණුකා හෝටලයේ පැවති සංවාදයට සහභාගි වූ අයගෙන් කොටසක්

හේතුව ඒකීය රාජ්‍යයක සීමාව තුළ කළ හැකි උපරිම බලය බෙදීම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 1987 දී සිදු කොට තිබීමයි. එයින් ඔබ්බට යාමට අනිවාර්යයෙන්ම ජනමත විචාරණයක් අවශ්‍ය වේ.

ජනමත විචාරණය අද නොවේ, හෙට

මේ කරුණු පිළිබඳව විශාල විවාදයක් ඇති බවක් පෙනෙන්නට නැත. ප්‍රශ්න මතු කරනුයේ මේ "මොහොතේ" ජනමත විචාරණයක් පවත්වා ජයග්‍රහණය කිරීමට ආණ්ඩුවට හැකිද යන්නයි. ආණ්ඩු බලය නොමැතිව ජනාධිපතිවරණය ජයග්‍රහණය කළ බලවේග යක්, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක සහ මුස්ලිම්, කඳුරට දෙමළ පක්ෂ එකතුව සකස් කරගන්නා ලද පාර්ලිමේන්තුවේ 2/3ක බලය හොබවන ආණ්ඩුවකට, ප්‍රධාන විපක්ෂය වශයෙන් කටයුතු කරන දෙමළ ජාතික සන්ධානයේද සහය ඇතිව ජනමතවිචාරණයක් ජයගැනීමට නොහැකි නම්, එයට සුදුසු අන් මොහොතක් උදා වනු ඇත්තේ "බාලගිරි දෝෂය" ගෙවී ගිය දවසටය. එනම් "අද නොවේ හෙට ය."

මෙම මතයට වෙනස් අදහසක් ප්‍රසිද්ධියේ පළ කොට ඇත්තේ ජාතික හෙළ උරුමය පක්ෂය විසින් පමණකි. ඔවුන් යෝජනා කරන්නේ වර්තමානයේ පවතින විධායක ජනාධිපති ධුරය එලෙසම තබා ගැනීමටය; පළාත් සභා සතු බලතල අඩු කිරීමය; ඡන්ද ක්‍රමය වෙනස් කිරීමටය. මෙය වනාහි 2015 මැද භාගයේදී පාර්ලිමේන්තුවේ බහුතර බලය එක්සත් ජනතා නිදහස් සන්ධානයට පැවැති අවදියේ කඩිමුඩියේ සම්මත කරගැනීමට තැත් කළ ඊනියා 20 වන සංශෝධනයේ තත්ත්වයයි. පළමුව 20 වන සංශෝධනය සම්මත කරගෙන ඉන් පසුව සෙසු සංශෝධන වලට යමු යැයි කෙනෙකු කියන විට මල්ලෙන් එළියට පනින්නේ මේ අදහසයි. අප ඒ අදහස මොහොතකට පිළිගත්තත්, හුදු ඡන්ද ක්‍රමය පමණක් වෙනස් කිරීමට ගෙනෙන යෝජනාවකට පාර්ලිමේන්තුවේ 2/3ක ඡන්දය ලබා ගන්නේ කෙසේද යන ප්‍රශ්නය පැන නඟී. විශේෂයෙන්ම දෙමළ ජාතික සන්ධානය හෝ මුස්ලිම් පක්ෂ, කඳුරට දෙමළ පක්ෂ හෝ ජනතා විමුක්ති පෙරමුණ පවා එවන් යෝජනාවකට සහය දිය යුත්තේ මන්ද යන ප්‍රශ්නය අප විසින් විමසිය යුතුවේ.

එසේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සිදු විය යුත්තේ සියළු ඉල්ලීම් සාධාරණව ඉටු වන ආකාරයට තනි ප්‍රතිසංස්කරණයක් ලෙසය. එවන් ප්‍රතිසංස්කරණයක් සඳහා ජනමතවිචාරණයක් මගින් ජනතා අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. ඒ සඳහා සටන් කිරීම මිස ඉන් මෙහා අතරමැදි සමාදානයක් නැත්තේය. දේශපාලන පක්ෂ වලට ඔවුන්ගෙ ්ම වූ න්‍යාය පත්‍රයන් තිබීම අපට තේරුම් ගත හැකිය. එහෙත් සිවිල් සමාජය කළ යුත්තේ එක් පක්ෂයක හෝ අනෙක් පක්ෂයේ ක්ෂමාලාපකයන් වීම නොව පරමාදර්ශී අරමුණක් වෙනුවෙන් සටන් කිරීමයි. අපට අවශ්‍ය "සාධාරණ ව්‍යවස්ථාවක්" යැයි සුමන්දිරන් මන්ත්‍රීවරයා කියන විට අප එයට එකඟ වන්නේ එබැවිනි.

උපුටා ගැනීම

රාවය - සමබිම අතිරේකයෙනි

යහපත් ප්‍රතිසංස්කරණ සහිත ව්‍යවස්ථාවක් වෙනුවෙන් අපි සහාය දෙනවා

ජනතා විමුක්ති පෙරමුණේ නායක
අනුර දිසානායක

තව මාසයකින් රාජපක්ෂ ආණ්ඩුව පරාජය කරලා අවුරුදු දෙකක් සම්පූර්ණ වෙනවා. ගෙවුණු අවුරුදු දෙක තුළ හිමිවූ දේවල් සහ හිමි නොවුණු දේවල් මොනවාද?

ජනවාරි 8 යම් හෙයකින් රාජපක්ෂ කඳවුර ජයග්‍රහණය කළා නම් ඇතිවිය හැකිව තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදය හැකිළුණු ඒකාධිපති වියරුවකින් පෙළුණු පවුල් පාලනයක්. 2014 අගභාගය වන විට එම තත්ත්වය පෙන්නුම් කරමින් තිබුණා. එම කඳවුර යළි ජයග්‍රහණය කළා නම් එහි තවත් තීව්‍රතම දිගුවක් වන බව නොඅනුමානයි. ජනවාරි 8න් පසුව ගොඩනැගුණු පාලනය නිසා එවැන්නක් වැළකුණා. නමුත් මේ පාලනයෙන් අපේක්ෂිත අරමුණුවල සීමාමායිම් පිළිබඳව මනා අවබෝධයක් අපිට තිබුණා. දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපට එවැනි සීමාමායිම් තිබුණත් පොදු ජනතාව මේ පාලනයෙන් ඊට වඩා වැඩි ජයග්‍රහණ අපේක්ෂා කළා.

එකම දේ කරමින් වෙනස් ප්‍රතිඵල බලාපොරොත්තු වීම විහිළුවක්. මහා ණය කන්දක රට හිරකරමින් කොන්ක්‍රීට් වනාන්තර ගොඩනැගීමේ, රාජ්‍ය ආර්ථික ක්‍රියාවලිය අත්හැරීමේ හා රටේ නිෂ්පාදනය වන ධනය කුඩා ප්‍රමාණයක් අත සංකේන්ද්‍රණය වීමේ ආර්ථික උපායමාර්ගය හැරුණු කොට ජනතාවගේ ජීවිතය හා ගැටගැසුණු ආර්ථික උපායමාර්ගයක් ගොඩනැගීමට මේ ආණ්ඩුවත් අසමත්

වී තිබෙනවා. අකාර්යක්ෂමතාව, වංචා දූෂණ, නාස්තිය පිරුණු පරපෝෂිත පාලනය වෙනුවට ජනතාවාදී පාලනයක් ගොඩනැගීමට මේ පාලනයත් අසමත්වී තිබෙනවා. හැබැයි, ජනවාරි 8 ගොඩනැගුණු බලවේගයන්ට මුළුමනින්ම පිටුපාමින් මේ ආණ්ඩුව කටයුතු කරන අතර යම් සීමාකාරී නිදහස් වටපිටාවක් ගොඩනැගී තිබෙන බවත් අවිවාදිතයි. එම වටපිටාව හැකිළීමට ඉඩ නොදී වර්ධනය කරගැනීමේ දිශාවට ජනතා බලවේග පෙළගැසිය යුතුව තිබෙනවා.

හිමි නොවුණු දේවල් හිමිකරදීම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණට තියෙන සැලසුම් මොනවාද?

තව අවුරුදු සීයක් මීමැස්සා මීවදය බැන්දත් මීවදයේ වෙනසක් දකින්න බැරුවා වගේම මේ පාලකයන් තව අවුරුදු සියයක් රට පාලනය කළත් වර්තමානයේ අත්කරදී තියෙන ප්‍රතිඵලය හැරුණු කොට වෙනත් කිසිවක් බලාපොරොත්තු වෙන්න බැහැ. නව ධනාත්මක කිසිවක් මෙම පාලනයන්ගෙන් ලබාගැනීමට හැකියාවක් තවදුරටත් නැහැ. ඉතිහාසයේ ඔවුන්ට පැවරී තිබුණු කාර්යභාරය දැන් අවසන් වෙලා තිබෙනවා. ඒ නිසා දැන් අපිට සැලසුම් දෙකක් තිබෙනවා. එකක් මෙම තත්ත්වය තවදුරටත් නරක දිසාවට තල්ලුවීම, උදාහරණයක් ලෙස කිව්වොත් සේවාවන් මුළුමනින්ම පෞද්ගලිකකරණය කරන, වරායවල්, තෙල් ගබඩා, ඛනිජ නිධි, ඉඩම් ආදි වටිනා සම්පත් බහුජාතික සමාගම්වලට ලබාදෙන උත්සාහයන් සහිත වංචාව දූෂණය, නාස්තිය පිරුණු පාලන ක්‍රමයට එරෙහිව අරගලයක් දියත් කළ යුතුව තිබෙනවා. අනෙක, මෙම පක්ෂ දෙකේ පාලනයන් තුළ තවදුරටත් අපේ රටට ගමනක් නොමැති හෙයින් නව පාලනයක් ගොඩනගා ගැනීම වෙනුවෙන් ජනතාව මතවාදීව ශක්තිමත් කොට බල හුවමාරුව වෙනුවෙන් කරන අරගලයයි.

දූෂණ සහ අපරාධවලට එරෙහිව නීතිය නිවැරදිව ක්‍රියාත්මක විය යුතු බව ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කරන තියුණුම සටන් පාඨයයි. පහුගිය සතියක පොලිස්පතිවරයාගේ හැසිරීමෙන් පෙනුණේ මේ පරීක්ෂණවලට බාධා එල්ලවන ආකාරයයි. එතැනින් තවත් කාරණයක් පෙනෙන්න තියෙනවා. ඒ දූෂිතයන් සහ වත්මන් ආණ්ඩුවේ නායකයන් අතර ඇති සම්බන්ධය. ඔබේ අදහස මොකක්ද?

දූෂිතයන්ට දඬුවම් දීම පිළිබඳව ජනතාවගේ අපේක්ෂාවන් වෙත එල්ලවූ පළමු ප්‍රහාරය වුණේ රාජපක්ෂ පාලනයේ දූෂණයන්ට හවුල්වූවන් සමග එක්ව රනිල් මෛත්‍රී ආණ්ඩුවක් පිහිටුවීමයි. ඒ දේශපාලකයන් විතරක් නෙවෙයි, ඩීල්කාරයෝ, දූෂිත රාජ්‍ය නිලධාරීන් මේ පාලනයේත් හවුල්කාරයන් වුණා. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ හා මෛත්‍රීපාල ජනාධිපතිවරයා අතර මතුපිටට නොපෙනෙන එහෙත් තීව්‍ර යටින් දිවෙන බල අරගලයක් නිර්මාණය වී තිබෙනවා. එහිදී රනිල් වික්‍රමසිංහගේ උපක්‍රමය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදීම අරමුණුකොටගෙන එම පක්ෂයේ එක බලකේන්ද්‍රයක් වන රාජපක්ෂ පවුල හා සමීපතමයන් ආරක්ෂා කිරීමයි. අනෙක් පැත්තෙන් මෛත්‍රීපාල ජනාධිපතිවරයාගේ අරමුණ රාජපක්ෂ පවුල් හැර අනෙක් සියල්ලන් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගීමයි. මේ අරමුණු නිසා නිරායාසයෙන්ම දූෂිතයන්ට ආරක්ෂාව සැලසී තිබෙනවා.

දූෂිතයන්ට දඬුවම් ලබාදිය හැක්කේ අදූෂිත පාලනයකට පමණයි. මේ ආණ්ඩුව බලය අත්පත් කරගෙන කෙටි කාලයක් තුළ මහා පරිමාණ දූෂණයන් සිදුකිරීමට පටන්ගත්තා විතරක් නෙවෙයි, ආණ්ඩුවේ ඉහළින්ම දූෂිතයන් ආරක්ෂා කරනවායැයි සංඥාව ලැබුණු විට දෙවන පෙළ සෘජුවම දූෂිතයන් ආරක්ෂා කිරීමටත් දූෂිතයන්ගෙන් යැපෙන්නටත් පටන්ගත්තා. ඒ වාගෙම වංචා දූෂණ විමර්ශනය සඳහා පිහිටුවූ ප්‍රධානතම ආයතනවූ එෆ්සීඅයිඩීය හා අල්ලස් කොමිසම මගින් සිදුකරන ධනවත් හා බලවත් පුද්ගලයන්ගේ පරීක්ෂණ අකර්මන්‍ය කරන්න, දුර්වල කරන්න ජනාධිපතිවරයා විසින්ම එම ආයතනවලට ප්‍රහාරයක් එල්ල කළා. අද එම ආයතනයන් මුළුමනින්ම දුර්මුඛවෙලා, දූෂිතයන්ගේ ප්‍රහාරයට පමණක් නොව පාලකයන්ගේ ප්‍රහාරයන්ටද නතුවෙලා අසරණභාවයට පත්ව තිබෙනවා. ඔබ කියන පොලිස්පතිවරයා හා සම්බන්ධ සිදුවීම මෙම සමස්ත තත්වයේ එක් ප්‍රකාශනයක් විතරයි.

රාවය සංවත්සරයේදී ඔබ කී දූෂිත වළල්ල ගැන තවත් විස්තර කරන්න පුළුවන්ද?

මේ ධනපති ක්‍රමය ඇතුළේ ජනතාව ආණ්ඩු පත්කළත් ආණ්ඩුව පාලනය කරන්නේ වෙනත් කණ්ඩායමක් විසින්. ඇමරිකන් එක්සත් ජනපදය ගත්තොත් එහි පාලකයන් තෙල් සමාගම්, මූල්‍ය සමාගම්, අවි සමාගම් ආදි සමාගම් වළල්ලක් විසින් මෙහෙයවනවා. ඒත් අපේ වගේ රටවල සමාගම් වළල්ලක් වෙනුවට දූෂිත වළල්ලක් විසින් තමයි පාලනය හසුරුවන්නේ.

එම දූෂිත වළල්ල විසින් රටේ මහාපරිමාණ වංචා දූෂණ හොරකම් සිදුකරමින් ඉන්නවා. මේ හොරකම් යනු එක් පුද්ගලයෙක් තව පුද්ගලයෙක් දෙයක් හොරකම් කිරීමක්, ඒ පිළිබඳව පරීක්ෂණ කිරීම හා දඬුවම් ලබාදීම වැනි සරල ක්‍රියාවක් නෙවෙයි. ඊට එහා ගිය මහා පරිමාණ ක්‍රියාවලියක්. මහජනයාගේ ධනය සොරකම් කිරීම ගැන විමර්ශනයන් සිදුනොවීම, අධිකරණයට ඉදිරිපත් නොවීම, අධිකරණයෙන් දඬුවම් ලබානොදීම මේ සියල්ල එකිනෙකට ගැටගැසුණු ජාලයක්. ඒවා පාලනය කරන්නේ දූෂිත වළල්ල විසින්. එම දූෂිත වළල්ල ඉහළම දේශපාලකයන්ගෙන්, රාජ්‍ය නිලධාරීන් ඉතා අතළොස්සකගෙන්, හමුදාවේ පොලිසියේ කුඩා පිරිසකගෙන්, කළු සල්ලි උපයාගත් ඩීල් ව්‍යාපාරිකයන් කණ්ඩායමකගෙන් වගේම සැබැවින්ම අධිකරණයේ කොටසකගෙන් සමන්විතවෙලා තියෙනවා. ඔවුන් ධනවතුන් සහ බලවතුන්. ඇතැම් අය මාධ්‍ය හිමිකරුවන්.

ඇතැමුන්ට නීතිවිරෝධී ගිනි අවි තිබෙනවා. නීතිඥයන් නඩු විසිවෙන විදියට පැමිණිලි ගොනුකරනවා. ඒ වගේම දඬුවම් නොලැබෙන ලෙස නඩු අහන්න පුළුවන්. ඝාතනයන් සිදුකරන්න පුළුවන්. මන්ත්‍රීවරු මිලට ගන්න පුළුවන්. ආණ්ඩුවක් මාරුවීමේදී මෙම වළල්ලෙන් කොටසක් එළියට වැටෙන අතර ඉතිරි වෙන කොටසක් නව කණ්ඩායමකුත් එකතුවී නව දූෂිත වළල්ලක් හැදෙනවා. මේ පාලනය ගත්තොත්, එළියට විසිවූ අයත්, නව දූෂිත වළල්ලට ඇතුළත් වූ අයත්, අලුතෙන් එකතු වූ අයත් නම්ගම් සහිතව කියන්න පුළුවන්.

බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් දැන් කතාබහක් නැති බවයි පෙනෙන්නේ. සිද්ධවෙන්නේ මොකක්ද?

බොහෝ හොරකම්වලදී හොරාකෑ දේපොළ තියෙන අතර හොරකම් කළ අය හොයාගන්න බැහැ. සීඑස්එන් නාලිකාව, මල්වානේ නිවස සහ ඉඩම, මාතර බ්‍රවුන්ස් හිල් ඉඩම ඒකට හොඳම උදාහරණයි. ඒ වගේම හොරකම තියෙනවා, දේපොළ හොයාගන්න බැරි අවස්ථාත් තිබෙනවා. උදාහරණ ලෙස කියනවා නම් මිග් ප්‍රහාරක ගනුදෙනුව, ගල් අඟුරු ගනුදෙනුව, අධිවේගී හොරකම්, බැංකු ගිණුම් වගේ දේවල්. නමුත් බැඳුම්කර ගණුදෙනුවේ විශේෂත්වය හොරාත් හොරාකාපු දේපළත් හෙළිදරව් වී තිබීමයි. කෝප් කමිටුව හරහා මෙම ගනුදෙනුවට සම්බන්ධ වූ දූෂිතයා අර්ජුන් මහේන්ද්‍ර බව හෙළිකරගත්තා. එම හොරකමෙන් උපයා ගන්නා ලද ධනය ඔහුගේ බෑනාගේ සමාගමේ වත්කම් ප්‍රකාශන මගිනුත් හෙළිදරව් වුණා. ඒ නිසා මෙය තවදුරටත් විශාල විමර්ශනවලට යායුතු ගනුදෙනුවක් නොවේ. කෝප් කමිටුවටත් පක්ෂයක් ලෙස අපටත් පැවරී තිබෙන්නේ මෙම ගනුදෙනු හෙළිදරව් කිරීමත් එම දූෂණයන්ට දඬුවම් දීමට බලකිරීමත්. එය විමර්ශනය කොට දඬුවම්දීමේ බලය තිබෙන්නේ ආණ්ඩුව අතේ. නමුත් එය හරියට හොරාගේ අම්මාගෙන් පේන අහනවා වගේ වැඩක්. අවම හෝ යමක් කරගත හැකි වන්නේ දූෂණයට එරෙහිව මහජන බලයක් ගොඩනැගීමෙන් පමණයි.

ඔබ යෝජනා කරනවා මේ මාවතේ ගමන් කළ හැකි දුර අවසානයි කියලා. අලුත් මාවත මොකක්ද? එයින් යා හැකි දුර කොපමණද?

අපගේ ප්‍රධාන අරමුණ වන්නේ මේ මාවතේ ගමන්කළ හැකි දුර අවසන් බව ජනතාවට ඒත්තු ගැන්වීමයි. ආර්ථිකය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ, නීතියේ හා විධානයේ ආධිපත්‍යයේ, අධිකරණයේ සාධාරණත්වයේ, දූෂිතයන්ට දඬුවම් දීමේ කිසිදු යහපත් ප්‍රතිසංස්කරණයක් මෙම මාවතේ තවදුරටත් ඉතිරිවී නැහැ. ඒ වගේම වංචා දූෂණ, නාස්තිය, අකාර්යක්ෂමතාව වැනි අයහපත් කිසිවක් මේ මාවතේදී අවම කිරීමට හෝ නැති කිරීමට හැකියාවක් නැහැ. ඒ හෙයින් මේ මාවතේ යා හැකි දුර අවසන්වී තිබෙනවා. සැලසුම් සහගත, ජනතාවගේ ජීවිත හා ගැටගැසුණු නව ආර්ථික සංවර්ධන උපාය මාර්ගයක් සහිත, අධිපරිභෝජනවාදයෙන් මිදුණු, මිථ්‍යාවෙන් අවිද්‍යාවෙන් මිදුණු සමාජයක් සහිත, දූෂණය නාස්තිය පරපෝෂිතභාවයෙන් මිදුණු ජනතාවාදී දේශපාලනයක් සහිත නව මාවතක් ගොඩනැගිය යුතුය යන්නයි අපේ ස්ථාවරය.

2020දී ජවිපෙ ආණ්ඩුවක් නිර්මාණය කිරීම ගැන කතාබහ කරනවා. එහෙත් ජනතාව නැවත හිටපු රාජපක්ෂලා බලයට පත්කිරීමක් ගැනත් කතාකරනවා. ජනතාව සිටින තැන එක්ක ඔබේ ඉලක්කයට යා හැකිද?

පරාජිත රාජපක්ෂ කල්ලිය මුගුරෙන් බැට කෑ සර්පයෙකු සේ ආවේග යෙන් කෝපයෙන් වෛරයෙන් දඟලමින් සිටිනවා. යමක් අහිමි වූ අතදරුවෙකු අතට හසුවූ සියල්ල පොඩිපට්ටම් කරන ආකාරයක් ඔවුන්ගේ හැසිරීමෙන් දක්නට ලැබෙනවා. ඔවුන්ට අලුතෙන් මේ සමාජයට ලබාදීමට හැකි කිසිවක් නැහැ. ඔවුන්ට යොදාගත හැකි අවසන් දේශපාලන තුරුම්පුව වන්නේ ජාතිවාදයයි. එම මතය රාජපක්ෂ කඳවුර වගේම විනාශකාරී එකක්. එහෙයින් ඔවුන්ට යළි බලය අත්පත් කරගැනීමට ඉඩ නොදිය යුතුයි. ඔවුන් බලය ලබාග ැනීම රඳාපවතින්නේ රාජපක්ෂ සාධකයත්, ඉක්මන් බලය කියන සාධකයත් මතයි. මේ කණ්ඩායමට ඉක්මන් බලයක් ලබාගැනීමට හැකියාවක් නැතිවා සේම රාජපක්ෂ කියන සාධකයත් වැහැරුණු නායකයෙක් බවටත් පත්වෙමින් යනවා. ඒ නිසා රාජපක්ෂ කල්ලිය හැකිළෙන බලයක් මිස වර්ධනය වන බලයක් නොවේ. ඒ වාගෙ ම ශ්‍රීලනිප එජාප හවුල් පාලනය අසාර්ථක බව දැන් තහවුරු වී අවසන්. ඒ නිසා රනිල් මෛත්‍රී කඳවුර වෙත තවත් බලයක් රටේ ජනතාව කුමක් අපේක්ෂාවෙන් ලබාදිය යුතුද? එහෙයින් රටේ ඉතා හොඳ අවස්ථාවක් තිබෙනවා නව ජනතා මධ්‍යස්ථානයකට. අපගේ අරමුණ වන්නේ ජනතා විමුක්ති පෙරමුණ සහ විවිධ බලවේග එක්රැස් කරගත් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීමයි. 2020දී බලය ලබාගැනීමට සමත් ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුයි. ජනතාව තීරණයක් ගත යුතුයි මේ සාම්ප්‍රදායික මජර දේශපාලනය තවදුරටත් ඉදිරියට ගෙනියනවාද නැතිනම් ගොඩනගන නව ව්‍යාපාරය වෙත බලය ලබාදෙනවාද යන්න.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේදී වැඩිපුර සාකච්ඡාවට ලක්වෙන්නේ බලතල බෙදීම පිළිබඳව. විශේෂයෙන් පහුගිය ජනාධිපතිවරණයේදී බලතල බෙදීම ගැන නිහ�ව ඉඳිමින් විධායක ජනාධිපති ක්‍රමය ගැන සාකච්ඡා කළත් හැමෝගේම ඇස් තිබුණේ බලතල බෙදීම ගැනයි. නව ව්‍යවස්ථාව පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණට ඇති නිශ්චිත අදහස මොකක්ද?

ව්‍යවස්ථාව යනු පවතින සමාජ ක්‍රමයක නීතිමය ආරක්ෂකයා. අපට මේ සමාජ ක්‍රමය වගේම ව්‍යවස්ථාව පිළිබඳවත් විවේචනයක් තිබෙනවා. කෙසේ වුවත් යහපත් ප්‍රතිසංස්කරණ සහිත ව්‍යවස්ථාවක් සම්මත කර ගත හැකි නම් ඒ සඳහා සහාය දෙන්න අපි සූදානම්. දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට ව්‍යවස්ථාව තුළින් පමණක් විසඳුමක් තිබෙන බව අපි පිළිගන්නේ නැහැ. එහෙත් එම ජනතාවගේ

අයිතීන් ආරක්ෂා වන නීතිමය රැකවරණයක් තිබීමත් වැදගත්. නව ව්‍යවස්ථාවක් ගෙනඒමේ ගැටලුව වන්නේ ශක්තිමත් ආණ්ඩුවක් නොමැති වීමයි. 1972 ව්‍යවස්ථාව ගෙනාවේ 2/3ක් සහිත ආණ්ඩුවක්. 1978 ව්‍යවස්ථාව ගෙනාවේ 5/6ක ආණ්ඩුවක්. යහපත් නීතිමය ප්‍රතිසංස්කරණයක්වත් කරගන්න බැරි තරමට දුර්වල වී තිබෙන පාලනයකට ව්‍යවස්ථාවක් ගෙන ආ හැකිදැයි සැකයක් මතුවෙනවා. කෙසේ වුවත් අපේ පාර්ශ්වයෙන් යහපත් ප්‍රතිසංස්කරණ සහිත ව්‍යවස්ථාවක් වෙනුවෙන් සහාය දෙන්න සූදානම්.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළයුතු බව ඔබේ පක්ෂය කියනවා. නමුත් පෙනෙන්නට තියෙන්නේ විධායක ජනාධිපති ක්‍රමය පවත්වාගෙන යෑමේ උත්සාහයකුත් තිබෙන බවයි. පක්ෂයේ ප්‍රතිචාරය මොකක්ද?

රනිල් වික්‍රමසිංහ මහත්තයා ඔහුගේ හැසිරීම අනුව තනි ඒකාධිකාරී බලයකට කැමැතියි. ඔහු විධායක ජනාධිපති ධුරට අහෝසි කිරීමට එකඟවන්නේ ඔහුට එම පුටුවේ වාඩිවීමට නොහැකි නිසායි. නමුත් මෙම නව ව්‍යවස්ථාවේදී ඔහු උත්සහයක් දරනවා විධායක අගැමැති ධුරයක් නිර්මාණය කරගන්න. ජනාධිපතිවරයා විධායක ජනාධිපති ධුරය පිළිබඳව කවර අදහසක් එළියේ ප්‍රකාශ කළත් ශ්‍රීලනිපය ව්‍යවස්ථාව පිළිබඳව සාකච්ඡාවන්හිදී හැසිරෙන්නේ විධායක ජනාධිපති ධුරය ආරක්ෂා කරගැනීමේ දිශාවටයි. මන්ද ඔවුන් හිතනවා රාජපක්ෂට 19 සංශෝධනය අනුව යළි විධායක ජනාධිපති ධුරයට තරඟ වැදීමට නොහැකි නිසා මෛත්‍රීපාල මහත්තයා කේන්ද්‍රකර ගෙන බලයක් ගොඩනැගීමට නම් විධායක ජනාධිපති ක්‍රමය තවදුරටත් පැවතිය යුතුයි කියලා. අපගේ ස්ථාවරය තනි පුද්ගලයෙකු මතට අසීමිත බලයක් නිර්මාණය වන තනතුරක් වෙනුවට යම් සභාවක් වෙත එම බලය පැවරීම අත්‍යවශ්‍ය බවයි. එහෙයින් නව ව්‍යවස්ථාවේදී විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා යෝජනා ඇතුළත් කිරීමට අපි අනිවාර්යයෙන් කටයුතු කරනවා.

මධ්‍යය සහ පරිධිය අතර බලතල බෙදීම කෙසේ සිදුවිය යුතුද?

බෙදුම්වාදී යුද පෙරමුණ අහෝසි වී ඇති තත්ත්වයක් තුළ ව්‍යවස්ථාව තුළ විධායක ජනාධිපති ධුරය අහෝසි වන තත්ත්වයක් තුළ හා ඉන්දියානු හා බටහිර රාජ්‍යයන්ගේ කලාපීය දේශපාලන වුවමනාවන් සැලකිල්ලට ගැනීමේදීත් රට තුළ විවිධ ජනකොටස් ව්‍යාප්තවී තිබෙන ආකාරය, ස්වාභාවික සම්පත් ව්‍යාප්තිය හා වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය වැනි සංකීර්ණතා සැලකිල්ලට ගැනීමේදීත් පරිධියේ පිහිටි ආයතනයන් වෙත බලතල බෙදීම පිළිබඳව සැලකිල්ලට ලක්කළ යුතුයි. ඒ පිළිබඳව නව මානයන්ගෙන් විවෘතව සාකච්ඡාවකට අපි ලෑස්තියි.

මැතිවරණ ක්‍රමය පිළිබඳ ගැටලුව ඔබේ පක්ෂයට ඉතා සංවේදී මාතෘකාවක් බවයි පෙනෙන්නේ. මැතිවරණ ක්‍රමය ගැන අදහස මොකක්ද?

ව්‍යවස්ථාව සකස් කිරීම සඳහා ගොඩනගා තිබෙන ස්ථාවර කමිටුව තුළ නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳව 90%ක පමණ එකඟතාවන්ට පැමිණ තිබෙනවා. ඡන්ද ක්‍රමයක් සකස් විය යුතු වන්නේ ජනතාවගේ කැමැත්ත එම ආයතන තුළ සාධාරණ ලෙස පිළිඹිබුවන ආකාරයටයි. ඒ වගේම සමානුපාතික ක්‍රමයේදී නියෝජනයන් නොලැබෙන කුඩා කුඩා දේශපාලන ධාරාවන්ටද නියෝජනයක් ලැබෙන ආකාරය පිළිබඳව සැලකිල්ලට ලක්කළ යුතුයි. කවර ඡන්ද ක්‍රමයක් විසින් හෝ වෙනස් දේශපාලන ධාරාවන් පිටමං නොකළ යුතුයි. එය අනිවාර්ය ලෙස වෙනත් ප්‍රතිඵල ගෙනත් දෙන බව නිසැකයි. මේ සියල්ල ආවරණය වන ඡන්ද ක්‍රමයක් පිළිබඳව මූලික එකඟතාවකට එන්න පුළුවන් වෙලා තිබෙනවා.

ඔබ කියා තිබුණා මනාප ක්‍රමය අනුවම පළාත් පාලන මැතිවරණය පැවැත්වුවේ නැත්නම් මැතිවරණයට ඉදිරිපත් නොවන බව. ඒ සීමා නිර්ණය කමිටුවේ ඔබේ පක්ෂය විසින් නම් කළ නියෝජිතයෙකුත් සිටියදීයි. ඔබේ පක්ෂය මනාප මැතිවරණ ක්‍රමය සාර්ථක බව විශ්වාස කරනවාද?

පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් පැවැති පාලනය තුළදී බැසිල් රාජපක්ෂ මහතා තනි හිතුවක්කාරී තක්කඩි ක්‍රියාවක් හරහා ඡන්ද ක්‍රමයක් සකස්කර තිබෙනවා. ඒ වාගේම ශ්‍රීලනිප සංවිධායකයන්ගේ නිවෙස් තුළ සාකච්ඡා කොට සීමා නිර්ණයක් ඇතිකොට තිබුණා. අපගේ විරෝධය තිබුණේ එම ඡන්ද ක්‍රමයටත් සීමා නිර්ණයටත් යන කරුණු දෙකටමයි. නව සීමා නිර්ණය කමිටුව මගින් සිදුවන්නේ සීමා නිර්ණයේ ඇති වී තිබෙන දුර්වලතා මගහැරීමයි. එයින් කිසිසේත්ම ඡන්ද ක්‍රමයේ විකෘතිය මගහැරෙන්නේ නැහැ. එම ඡන්ද ක්‍රමය රට ද්විපක්ෂ දේශපාලනයකට ඇදදමනවා. අනෙක් සියලු දේශපාලන පක්ෂ මැතිවරණයෙන් පිටමං කරනවා. ඒක විකෘති ඡන්ද ක්‍රමයක්. අප දැනදැන එම ඡන්ද ක්‍රමයට බෙල්ල දිය යුතු නැහැ. අපව පිටමං කිරීමම ඉලක්ක කොට තිබෙන මැතිවරණයකට තරග කළ යුතුදැයි අපි සිතා බැලිය යුතුයි. අපේ යෝජනාව, ව්‍යවස්ථා සම්පාදක කමිටුව තුළ පාර්ලිමේන්තු පළාත් සභා පළාත් පාලන යන ආයතන තුනටම ඡන්ද ක්‍රමයක් පිළිබඳව පුළුල් එකඟතාවකට එළඹ තිබියදී, මෙම පළාත් පාලන ආයතනවලට පමණක් මෙම ඡන්දයට පමණක් සීමා වන විකෘති ඡන්ද ක්‍රමයක් සමඟ ඡන්දය නොපැවැත්විය යුතු බවයි. ඡන්දය පවත්වන්න නම් එම ඡන්ද ක්‍රමය සඳහා සංශෝධන 57ක් අවශ්‍ය බව මැතිවරණ කොමසාරිස්වරයාම කියනවා. එහෙයින් අපගේ යෝජනාව වූයේ මෙම පළාත් පාලන ඡන්ද ක්‍රමයට පමණක් සීමාවන පරිදි පැරණි සමානුපාතික ඡන්ද ක්‍රමය යළි බලගැන්වීමයි.

උපුටා ගැනීම
රාවය පුවත් පත

අනු කමිටු වාර්තා

නව ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාව සම්පාදන කාර්යයට අදාළව අනු කාරක සභාවන් හයක් පත් කරෙුණි. එම අනුකාරක සභාවලදී පහත සඳහන් විෂයයන් පිළිබඳ අධ්‍යයනය කෙරුණි.

- මූලික අයිතිවාසිකම්
- අධිකරණය
- නීතිය හා සාමය
- රාජ්‍ය මූල්‍ය
- රාජ්‍ය සේවා
- මධ්‍ය-පර්යන්ත සබඳතා

මෙම අනුකමිටු වාර්තා ව්‍යවස්ථා සම්පාදන මණ්ඩයට ලබාදී ඇති අතර එකී වාර්තා පුරවැසියන් අතට පත් වීම කාලීන අවශ්‍යතාවකි. එම වාර්තා සම්පූර්ණයෙන් මෙහි දැක්වීම ප්‍රායෝගික නොවන කරුණක් බැවින් ඇතැම් වාර්තා අන්තර්ගතයට හානි නොවන පිරිදි සාරාංශ කෙරුණ අතර ඇතැම් වාර්තාවන්හි නිර්දේශ පමණක් මෙහි දැක්වුවෙමු. අධිකරණය පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව ඉතා කෙටි බැවින් එය පමණක් සම්පූර්ණයෙන් ම දක්වන්නට හැකි විය.

රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව

යෝජනා සම්බන්ධ සාරාංශයකි.

වඩාත් සඵලදායී, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා එම යෝජනා යොමු වී ඇත.

යෝජනා 1 - රාජ්‍ය පරිපාලනය සහ රාජ්‍ය සේවයට සම්බන්ධ නිර්වචන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතු ය.

1. රාජ්‍ය පරිපාලනය යනු : ව්‍යවස්ථාදායකයෙන් ප්‍රකාශ වන මහජන මතය ඇමතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සිදු කරන විධායක කාර්යයයි.

2. සන්නද්ධ බලකායන්, පොලීසිය, අධිකරණය හැර රජයේ කාර්ය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය යටතේ ඇති ආයතනවල තනතුරු දරන සේවකයන්ගෙන් රාජ්‍ය සේවය යුක්ත වේ.

රාජ්‍ය සංස්ථා රාජ්‍ය සේවය, රාජ්‍ය පරිපාලනය විෂයය යටතට ගත යුතු බව අලුත් යෝජනාවකි.

යෝජනා 2 - රාජ්‍ය පරිපාලනයේ වටිනාකම් සහ මූලධර්ම

ප්‍රජාතන්ත්‍රීය වටිනාකම් සහ යහපාලන මූලධර්ම අනුව රාජ්‍ය පරිපාලනය සිදුවිය යුතු ය.

1. ආයතන පිහිටුවා ඇති අභිමතාර්ථය අනුව ප්‍රතිඵල ලබා ගැනීම
2. පවරා ඇති කාර්යයන් සහ වගකීම් අනුව කාර්ය සාධනය
3. යහපාලන මූලධර්ම අනුව මාර්ගෝපදේශකත්වය
4. සේවක චර්යාව ඉහළ මට්ටමේ වෘත්තීය සම්මතයන්ට අදාළ වීම
5. ජනතාවගේ අවශ්‍යතා පිළිබිඹු කිරීම

යෝජනා 3 - ජාතික ක්‍රම සම්පාදන කොමිෂන් සභාව

1. ජනාධිපතිවරයා පත් කරන ජාතික කොමිෂන් සභාවක්, අලුත් යෝජනාවකි.

- තිරසාර ජාතික ප්‍රතිපත්ති හැදීම
- සියලු සම්පත් සැලසුම් කර භාවිත කිරීම
- ආර්ථික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම
- කීර්තිධර පුද්ගලයන් එකොළොස් දෙනෙකු කොමිෂන් සභාවට පත් කිරීම

යෝජනා 4 - ජනාධිපති කාර්යාල කාර්ය මණ්ඩලය

පවතින ක්‍රමය නොවෙනස්ව පවතී.

යෝජනා 5 - අමාත්‍ය මණ්ඩල ලේකම් සහ අග්‍රාමාත්‍ය ලේකම්

මේ පත්වීම් දෙකම ජනාධිපති විසින් කරනු ඇත. විධායක ජනාධිපති ක්‍රමය කෙරෙහි සිදු කරන වෙනස්කම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සලකා එම තනතුරු අගමැති විමසා බලා පත් කළ යුතු ය.

යෝජනා 6 - ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

1. අලුතෙන් එම කණ්ඩයම ඇතිකළ යුතු ය.

2. තෝරා ගැනීමේ නිර්ණායක රාජ්‍ය සේවා කොමිසමෙනි.

3. කාර්යක්ෂම සහ ඵලදායක, අපක්ෂපාත රාජ්‍ය සේවයක් නිර්මාණය සඳහා එම පත් කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් කළ යුතු ය.

යෝජනා 7 - තම නියෝගයන් ගැන මධ්‍ය සහ පළාත් අමාත්‍යවරුන්ගේ සහ ලේකම්වරුන්ගේ වගකීම

තමන් දෙන නියෝග ගැන මහජනයාට වගකීමට ඔවුහු බැඳී සිටිති.

යෝජනා 8 - රාජ්‍ය අංශ සමාලෝචන කමිටුව

අලුත් යෝජනාවකි.

අගමැති, රාජ්‍ය පරිපාලන ඇමති, විපක්ෂ නායක, කථානායක පත් කරන හය දෙනෙකු රාජ්‍ය පරිපාලනය, පෞද්ගලික අංශය, වෘත්තීයවේදීන්, සිවිල් සමාජය නියෝජනය කරන සාමාජිකයන් 15 දෙනෙකි. (ස්ත්‍රී, පුරුෂ, ජාතික බහුවිවිධත්වය සැලකිය යුතු ය.)

යෝජනා 9 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දැනට සිටින 9 දෙනා 11 දෙනෙකු විය යුතු ය.

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අතිරේක ලේකම්වරුන් පත් කිරීමේ උසස් කිරීමේ මාරු කිරීමේ, විනය පාලනයේ, ඉවත් කිරීමේ බලතල කොමිෂන් සභාව සතු විය යුතු ය. (වර්තමාන 55(2) ව්‍යවස්තාව එනම් එම බලතල අමාත්‍ය මණ්ඩලය සතු විය යුතු ය යනු අහෝසි වේ.)

යෝජනා 10 - රාජ්‍ය සංස්ථා සේවා කොමිෂන් සභාව

රාජ්‍ය සංස්ථා නීති රීති අනුව එම නිලධාරීන් පරිපාලනය සඳහා එම කොමිෂන් සභාවක් තිබිය යුතු ය.

යෝජනා 11 - ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභා කමිටුව

ඉහත කොමිෂන් සභාවල නිලධාරීන්ගෙන් යුත් කමිටුවකි. රාජ්‍ය සේවා, පළාත් රාජ්‍ය සේවා, පෞද්ගලික අංශය මෙම කමිටුවට නියෝජනය වනු ඇත.

යෝජනා 12 - ජාතික විගණන සේවා කොමිෂන් සභාව

එක් කෙනෙකු වෙනුවට තුන් දෙනෙකුගෙන් යුක්ත විය යුතු ය.

යෝජනා 13 - රාජ්‍ය පරිපාලනය පිළිබඳ ව්‍යවස්ථාදායක පාලනය

පාර්ලිමේන්තු විශේෂ කාරක සභා, රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව ආදිය මගින් පාලනයක් තිබිය යුතු ය.

යෝජනාව 14 සීමා නීර්ණය කොමිෂන් සභාව

අවශ්‍ය වූ විට පත් කරනු වෙනුවට පළාත්, මැතිවරණ කොට්ඨාස, පළාත් පාලන ආයතන, පරිපාලන ඒකක, දිස්ත්‍රික් ප්‍රා.ලේ. කාර්යාල සම්බන්ධ සීමා නීර්ණය සඳහා ස්ථිර කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු ය.

යෝජනා 15 - පරිපාලන සහ මූල්‍ය රෙගුලාසි ආයතන

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය කළමනාකරණ මණ්ඩලය, රාජ්‍ය කාර්ය සාධන සමාලෝචන කමිටුව, රාජ්‍ය ව්‍යවසාය සේවා කොමිෂන් සභාව යන ආයතනවල මූල්‍ය රෙගුලාසි සහ කාර්යයන් සඳහා පහසුකම් සැලසීම.

යෝජනා 16 - විශ්‍රාම වයසට වැඩි කාලයක් සේවා නියුක්ත කිරීම

කොන්ත්‍රාත් ක්‍රමයට හෝ කාර්ය සාධන ඇගැයීම් මත බඳවා ගැනීම කළ හැකි ය.

යෝජනා 17 - සලකා බැලීමට

1. පළාත් පරිපාලනයේ මෙහෙයුම් ඒකකයක්

2. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ගැන විශේෂ අවධානයක්

3. බලය බෙදීම සඳහා මිනිස් බලය, මුදල්, යන්ත්‍ර, උපකරණ සහ තාක්‍ෂණය පළාත්වලට අවශ්‍ය පරිදි බෙදීම

4. රාජ්‍ය සේවකයන් සහ පළාත් රාජ්‍ය සේවකයන්ට ඇති අභියාචනා වෙනස්කම් නැති කළ යුතු ය.

5. විශ්‍රාම වැටුප් සම්බන්ධ 1972 - 109(1) සහ (2) නැවත හඳුන්වා දිය යුතු ය. (109) 2 විශ්‍රාම වැටුප් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු ය.

පළාත් රාජ්‍ය සේවය

යෝජනා 18 - නව වැනි පරිශිෂ්ටයෙහි ලැයිස්තු ප්‍රතිශෝධනය කළ යුතු ය.

ලැයිස්තු 3 ලැයිස්තු 2ක් බවට පත් කළ යුතු ය.

යෝජනා 19 - එක් එක් පළාතට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් අවශ්‍ය ය. සාමාජිකයන් 7 දෙනෙකි.

යෝජනා 20 - පළාත් කාර්ය සාධන සමාලෝචන කමිටුව

පළාත් ආඥා පනතකින් පිහිටුවන සමාලෝචන කමිටුවකි.

යෝජනා 21 - ප්‍රාදේශීය පරිපාලනය

මේ සඳහා කාර්ය සංවිධානය හා ක්‍රියාත්මක කිරීම ප්‍රා. ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් යටතට ගත යුතු ය. ග්‍රාම නිලධාරීන්ට දැනට පැවරෙන කාර්යයන් එසේ ම පැවතිය යුතු ය.

යෝජනා 22 - පළෘතේ ආණ්ඩුකාරවරයා

සියලු ලේකම්වරුන්ගේ කාර්ය සාධනය සමාලෝචන, ස්ථාන මාරු, විනය පාලනය, ආණ්ඩුකාරවරයාට පැවරේ. අමාත්‍ය මණ්ඩලයේ අදහස් විමසා ක්‍රියා කළ යුතු ය.

යෝජනා 23 - ග්‍රාම රාජ්‍ය පිහිටුවීම

ජනතා සහභාගිත්ව ව්‍යුහයක් වන ග්‍රාම රාජ්‍ය ප්‍රාදේශීය පරිපාලනයේ කොට්ඨාස මට්ටමේන් පිහිටුවිය යුතු ය.

යෝජනා 24 - පළාත් පාලනය සහ පළාත් පාලන ආයතන

පළාත් පාලන නීතියට අනුව ක්‍රියාත්මක, ජනතා නියෝජිතයන්ගෙන් යුක්ත පළාත් පාලන ආයතන රජයේ තුන්වැනි ස්ථරය වේ.

යෝජනා 25 - පළාත් පාලන ආයතනවල කාර්ය සාධනය

විසුරුවා හැරීමේ බලය ද සහිත අධීක්‍ෂණ ක්‍රමයක් අවශ්‍ය ය.

යෝජනා 26 පළාත් පාලන අරමුදල්

ජාතික අය වැයෙන් ඒකාබද්ධ අරමුදලෙන්, සාධාරණ මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කිරීමට මුදල් කොමිෂන් සභාවට පැවරේ.

යෝජනාව 27 - පළාත් පාලන ආයතන සේවා

පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් පළාත් පාලන සේවා අනුකාරක සභා හරහා පළාත් පාලන ආයතන පරිපාලනය කළ යුතු ය.

1. රජයේ අසාධාරණ නීතිවලින් පළාත් පාලන ආයතන දුර්වල වන අවස්ථා ඇත. ඒ ගැන සැලකිලිමත් විය යුතු ය.

2. පළාත් පාලන ආයතනවල ආදායම් මාර්ග හීන වී ගොස් ඇත. එය වැළැක්විය යුතු ය.

3. ප්‍රාදේශීය දේශපාලනය හීන වීමට ඉඩ නොතැබීමට වග බලාගත යුතු ය.

මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව

යෝජනා සම්බන්ධ සාරාංශයකි.

හැඳින්වීමෙහි මුල් ආ.ක්‍ර. ව්‍යවස්ථා තුනේ මූලික අයිතිවාසිකම් ඇතුළත්වීම ගැන සඳහන් වේ. 1947 ව්‍යවස්ථාවේ සුළුතර අයිතිවාසිකම් 29(2)න්ද, 1972 "මූලික අයිතිවාසිකම් සහ නිදහස" පිළිබඳ පරිච්ඡේදය ද, 1978 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට සීමා වූ එහෙත් නීතියෙන් ක්‍රියාත්මක කළ හැකි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් විය.

සම්මත නොවූ 2000 ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ ජීවත්වීමේ අයිතිවාසිකම් ඇතුළුව වැඩි දියුණු කළ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් තිබිණ. ළමා අයිතිවාසිකම් සහ සමජ ආර්ථික අයිතිවාසිකම් ද මහජන අර්ථාදායක නඩුකරය ද එහි ඇතුළත් විය.

මෙම පරිච්ඡේදය සැකැසීමට දකුණු අප්‍රිකා ව්‍යවස්ථාව ඇතුලු වර්තමාන ලෝක ප්‍රවනතා ගැන අධ්‍යයනයක් කර ඇත. ලෝකයේ දකුණු රාජ්‍ය ගණනාවක අලුත් ව්‍යවස්ථා සම්මත කොට ඇත්තේ ගැටුමකට පසු ය. ඒ සෑම ව්‍යවස්ථාවකම පදනම වන්නේ, ශක්තිමත් අයිතිවාසිකම් පනතක් මගින් සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම ය. එම පනත්වලින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, ආර්ථික, සමාජ සංස්කෘතික අයිතිවාසිකම්, පරිසර සහ සංවර්ධන අයිතිවාසිකම් ද ඇතුළත් වේ. ද. අප්‍රිකා, කෙන්යා ව්‍යවස්ථා උදාහරණ වේ. එම අයිතිවාසිකම් අහිමිවීම ගැටුම්වලට මුල් වී ඇත. එහෙයින් නීතියෙන් ක්‍රියාත්මක කළ හැකි, සමාජ, ආර්ථික අයිතිවාසිකම් ව්‍යවස්ථාවට ඇතුළත්වීම ඉතා වැදගත් බව කමිටුව අදහස් කරයි.

යෝජිත මූලික අයිතිවාසිකම් සහ නිදහස කෙටියෙන් මෙසේ දැක්විය හැකිය.

පුද්ගලයාගේ නෛසර්ගික අයිතිය

1. සෑම තැනැත්තකුටම, ජීවිතයට, ගරුත්වයට, සමානත්වයට නිදහසට හා ශරීරයේ ආරක්ෂාවට,
2. නීතියේ දී පුද්ගලයකු ලෙස පිළිගනු ලැබීමට,
3. කිසිවකුගේ ජීවිතය අත්තනෝමතිකව අහිමි නොකරනු ලැබීමට අයිතිය තිබීම.

සැක කරුවන්, චූදියන්ගේ අයිතිවාසිකම්

1. නීතියට අනුව හැර, අත් අඩංගුවට, රඳවා තැබීමට, ශරීරික නිදහස අහිමි නොකළ යුතු ය.
2. එවැනි තත්වයේ සෑම කෙනකුට ම මනුෂ්‍ය ගරුත්වය හිමිවිය යුතු ය.
3. නීතියෙන් අවසර ගැනීම, වරෙන්තු නැතිව අත් අඩංගුවට නොගැනීම.
4. අත් අඩංගුවට පත් අයගේ අයිතිවාසකිම් ගැන දැනුම් දීම
5. අත් අඩංගුවට පත් අයගේ ඥාතීන්ට, හිතවතකුට දැනුම් දීම.
6. නීතිඥ සහාව ලබා ගැනීමට සැලසීම.
7. නිතිය පරිදි මිස අසාධාරණ කාලයක් රඳවා නොතැබිය යුතු ය.
8. ඇප මත මුදා හරිනු ලැබීමේ අයිතිය ඇත.
9. ප්‍රමාදයකින් තොරව චෝදනා ඉදිරිපත් වීම.
10. කරුණු ඉදිරිපත් කිරීමට හිමිකම.
11. අධි චෝදනා ඇතිවිට, අප්‍රමාදව, නිසි අධිකරණයකින්, සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම.
12. වරද ඔප්පු වනතෙක් නිර්දෝෂ බව.
13. පාපොච්චාරණයට බල නොකළ යුතු ය.
14. වරද කරන අවස්ථාවේ නැති දඬුවමක් නොපැනවීම.
15. වරදකරුවීම හෝ නිදොස් කොට නිදහස්වීම නිසා යළිත් එම චෝදනා නොකිරීම.
16. අධිකරණ නියොගයකින් පමණක් සිරගත කිරීම.
17. නීතියේ සීමාවන් නොපැනවිය යුතු අවස්ථා 7ක් දක්වා ඇත.)

පුද්ගල ආරක්ෂාව

1. ශාරීරික සම්පූර්ණත්වය අහිමි නොකිරීම, පර්යේෂණ සඳහා කැමැත්ත නැතිව ශරීරය භාවිත නොකිරීම

සමානාත්මතාවට සහ වෙනස්කොට නොසැළකීමේ නිදහස

1. නීතියේදී සමාන බව හා සමාන ආරක්ෂාව ලැබීම.
2. ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට සමාන අයිතිවාසිකම් හා යුතුකම් පැවතීම.
3. වර්ගය, ලිංගිකත්වය, ආගම, භාෂාව ආදී වෙනස් කොට නොසැලකිය යුතු ක්ෂේත්‍ර 18ක් දැක්වේ.

   රැකියා සාධාරණත්වය පැවතීම. (රාජ්‍ය සේවයේ අවශ්‍යතා දැක්වීම නීත්‍යානුකූලය)
4. පොදු ස්ථාන භාවිතයට සමාන අවස්ථා තිබීම.
5. වාසි සහ වරප්‍රසාද අහිමිවූවන්ට සැලකීම නීත්‍යානුකූලය.
6. ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය, මහජන සෞඛ්‍යය ආදී කරුණු උදෙසා නීති පැනවිය හැකි ය.

සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහස

1. ඇදහීමේ, සිතීමේ නිදහස ගැන සීමාවන් නොපැනවීම.

ප්‍රසිද්ධියේ ආගම ඇදහීමේ නිදහස

1. පෞද්ගලිකව හෝ සාමූහිකව ඇදහීම, භාවිතය, ප්‍රචාරණය හා ඉගැන්වීමේ නිදහස
2. ඇදහීමක් තෝරා ගැනීමට ඇති නිදහසට බාධා නොකිරීම.

ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය හැර මෙම අයිතිවාසිකම් ගැන සීමා පැනවිය නොහැකි ය.

මත දැරීමට ඇති නිදහස

එම අයිතිවාසිකම ගැන සීමා පැනවිය නොහැකි ය.

සංස්කෘතිය භුක්ති විඳීමට හා ප්‍රවර්ධනයට හා භාෂා භාවිතයට ඇති අයිතිය

- ඒ සඳහා කැමති භාෂාවක් භාවිත කළ හැකි ය.
- තම සංස්කෘතිය සාමූහිකව භුක්ති විඳිය හැකි ය.
- නීතිය හා සාමය, ජාතික ආගමික සහයෝගිතාව, මහජන සෞඛ්‍ය, සදාචාරය, පරිසරය, අන්‍යයන්ගේ අයිතිවාසිකම්, නන්වැදෑරුම් නිදහස ආරක්ෂා කිරීමට හැර සීමා පැනවිය නොහැකි ය.

ප්‍රකාශනයේ සහ තොරතුරු දැන ගැනීමේ නිදහස ඇතුලු කථනයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

1. වාචිකව, ලිඛිතව, මුද්‍රිතව, කලාවෙන්, මාධ්‍ය මගින් මත ප්‍රකාශයට හා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසකම ඇත.
2. යුද ප්‍රචාරය, ප්‍රචණ්ඩත්වය සඳහා එම නිදහස නැත.
3. නීතියේ සඳහන් සීමාවන් හැර වෙනත් සීමාවන් ගැන.

තොරතුරු වෙත ප්‍රවේශය

1. රජය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන ආදියට අදාළ තොරතුරු ලබා ගැනීමට සෑම පුරවැසියකුටම අයිතිවාසිකම් ඇත.

නීතිය මගින් නියම කොට ඇති සීමාවන් අදාළ ය.

සාමකාමීව රැස්වීමේ නිදහස

ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය ගැන පවතින නීතිවලට පටහැනි නොවන පරිදි රැස්වීමේ නිදහස ඇත.

නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක යෙදීමේ නිදහස තනිව හෝ සාමූහිකව පවතී.

කම්කරු අයිතිවාසිකම්

සාධාරණ වේතන, ආරක්ෂිත බව සහිතව නිසි විවේක කාලයන්ද සතුටුදායක සේවා තත්වයන් ද හිමිවේ.

වෘත්තීය සමිති අයිතිවාසිකම් සහතික වේ. නීතියේ ඇති සීමාවන් හැර, පිළිගත් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී සීමා නොතිබිය යුතු ය.

සූරාකෑමෙන් නිදහස

පුද්ගල ජාවාරමට, වහල්භාවයට, බලහත්කාර ශ්‍රමයට කිසිවකු ගොදුරු නොකළ යුතු ය. (අධිකරණයෙන් නියමිත ප්‍රජා සේවා මීට අයත් නොවේ.)

පුද්ගලිකත්වය සඳහා අයිතිය

පවුල් ජීවිතයට මැදිහත්වීම්, නිවස දේපළ සෝදිසියට, සන්තකයේ ඇති දෑ අත්අඩංගුවට නොගැනීම. පුද්ගලයාගේ ලිපි ලේඛන කෙරෙහි මැදිහත් නොවීම, නීතියේ සීමාවන් අදාළ වේ.

පවුල් අයිතිවාසිකම්

සුදුසු වයසේ දී විවාහවීමට, කලත්‍රයන්ගේ සමාන අයිතිවාසිකම්වලට හිමිකම ඇත. කැමැත්තෙන් තොර විවාහ සිදු නොවිය යුතු ය.

දේපළ හිමිකම

එකලාව හෝ අන් අය සමග දේපළ හිමිකම දැරීමට මෙන්ම නීත්‍යානුකූල දේපළ අහිමි නොකරනු ලැබීමට හිමිකම ඇත. පොදු කටයුතු සඳා දේපළ අත්පත් කර ගැනීමේදී සාධාරණ වන්දි ගෙවිය යුතු ය. සන්නද්ධ අරගලවල දී රජය අත්පත් කර ගන්නා දේපළ අප්‍රමාදව ආපසු පැවරිය යුතු ය.

අධ්‍යාපන අයිතිය

ප්‍රාථමික - ද්විතීයික අධ්‍යාපනය නොමිලේ රජයෙන් සැපයිය යුතු ය. නිදහස් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සියල්ලන්ටම අයිති වේ.

සෞඛ්‍ය අයිතිය

පුරවැසියන්ගේ ඉහළම ශාරීරික, මානසික සෞඛ්‍යය ආරක්ෂා කළ යුතු ය. හදිසි වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතික්ෂේප කළ නොහැකි ය.

සමාජ හිමිකම්

වෙනසක්, විශේෂයක් නැතිව ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන ප්‍රතිලාභ භුක්ති විඳීමට හිමිකම.

ප්‍රමාණවත් ආහාර, පිරිසිදු ජලය, නිවාස සහ සමාජ ආරක්ෂණය ලැබීමේ හිමිකම

සුදුසු රැකියාවක් ලැබීමට, නීතියෙන් අවසර ඇතිව මිස යමකු සිය නිවසින් පිටමං නොකළ යුතු ය.

පරිසරය හා ස්වභාවික සම්පත්

1. සියලුම ජීවීන්ට හිතකර පරිසරයක් පැවැත්විය යුතු අතර සෞඛ්‍ය සම්පන්න පරිසරයක විසීමේ හිමිකම.

2. පරිසර දූෂණය, විනාශය වැළැක්වීම, සංරක්ෂණය කිරීම තිරසාර සංවර්ධනයක් ලැබීමේ අයිතිය.

සියලු දෙනාටම ස්වභාවික සම්පත්වල හිමිකම ඇත. එය අනාගත පරපුරේ දායාදයක් ලෙස සැලකේ.

ළමා අයිතිවාසිකම්

අත්හැර දැමීම, වෙනස්කම්, ප්‍රචණ්ඩත්වය, පීඩාව, ලිංගික අපයෝජනය, අවභාවිතය ආදියෙන් මිදීමේ හිමිකම හැම ළමයකුටම ඇත. (එ.ජා. ළමා අයිතිවාසිකම් රැසක් ඇතුළත් වේ.) සන්නද්ධ අරගලවල දී භාවිත නොකරනු ලැබීමේ අයිතිය තිබිය යුතු ය. ළමයා යනු වයස 18ට අඩු තැනැත්තෙකි.

ජ්‍යෙෂ්ඨ පුරවැසි අයිතිවාසිකම් ද, විශේෂ අවශ්‍යතා ඇති අයගේ අයිතිවාසිකම් ද සියලු ඇප උපකාර ද හිමිවිය යුතු ය.

යුක්තිය වෙත ප්‍රවේශය

අධිකරණය හෝ වෙනත් ආයතන මගින් යුක්තිය ඉටුකරවා ගැනීමේ හිමිකම සමග අවශ්‍ය අයට නීති සහාය තිබිය යුතු ය.

සාධාරණ පරිපාලන ක්‍රියාකාරකම්

නීත්‍යානුකූල, යුක්ති සහගත, ක්‍රියා පටිපාටි කෙරෙහි පවතින හිමිකම

පාරිභෝගික සේවා

යහපත් භාණ්ඩ හා සේවාවන්ට, සත්‍ය තොරතුරුවලට අයිතිය ඇති අතර, අලාභහානි සඳහා වන්දි ලැබීමේ ක්‍රම තිබිය යුතු ය.

මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම

මෙම පරිච්ඡේදයේ කරුණු නිසි ලෙස ක්‍රියාත්මක කිරීම රජයේ ආයතනවලට පැවරේ.

හදිසි අවස්ථාවන්හිදී මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

හඳුනා ගනු ලබන අයිතිවාසිකම් කෙරෙහි අත්‍යවශ්‍යය අවම සීමාවන් පමණක් පැනවිය යුතු ය

ලිඛිත නීතිය සහ ලිඛිත නොවන නීතිය

පුද්ගල නීති හැර, අනෙක් නීති අනනුකූලවන ප්‍රමාණයට බලරහිත විය යුතු ය.

(මේ ගැන කොමිෂන් සභාවක් පත්කොට නිශ්චය කළ යුතු ය.)

මූලික අයිතිවාසිකම් කඩවීම ගැන ඥාතියකු හෝ මිතුරකු විසින් අයදුම් කිරීමක් කළ හැකි විය යුතු ය.

පුරවැසියන් නොවන අයගේ අයිතිවාසිකම්

නව ආ.ක්‍ර. ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන විට ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචිව සහ නීත්‍යානුකූලව පදිංචි අයට පුරවැසියන්ට සමාන අයිතිවාසිකම් හිමි වේ.

මූලික අයිතිවාසිකම් පැමිණිල්ලක් සඳහා මාස තුනක කාලයක් තිබිය යුතු ය.

ගිවිසුම් ඒකාබද්ධ කිරීම

සෑම මානව හිමිකම් ගිවිසුමක්ම අත්සන් කිරීමට පෙර එහි බලපෑම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

එම ගිවිසුම් අපරානුමත කිරීම නොපමාව පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු ය. වර්ෂ දෙකකට පසු එම ගිවිසුම් රටේ නීතිය බවට පත් විය යුතු ය.

භාෂා අයිතිවාසිකම

සිංහල හා දෙමළ රට පුරා පරිපාලන භාෂා විය යුතු අතර ඉංග්‍රීසි සම්බන්ධක භාෂාව වේ.

සිංහල හෝ දෙමළ සුළුතරය අටෙන් එක ඉක්මවන උප දිසාපති කොට්ඨාශවල සිංහල සහ දෙමළ භාවිත විය යුතු ය. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන කවර භාෂාවකින් හෝ ලිපි ගනු දෙනු කළ හැකි ය.

පාර්ලිමේන්තු පනත්, පළාත් සභා ප්‍රඥප්ති, අනු නීති සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් නීතිගත කළ හැකි ය. අධිකරණයේ භාෂාවද සිංහල සහ දෙමළ වේ. ජාතික භාෂාවකින් කළ හැකි බවට අධිකරණ ඇමතිවරයාට නියෝග කළ හැකි ය.

මධ්‍යම-පර්යන්ත සබඳතා අනුකාරක සභාවේ නිර්දේශ

පළාත් පාලන ආයතන : බලතල හා කර්තව්‍ය

1. පළාත් පාලන ආයතන

නිර්දේශ

1. පළාත් පාලන ආයතන පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන තුන්වන පාලන ස්ථරය ලෙස පිළිගැනීම.
2. පළාත් පාලන ආයතනවලට වඩාත් වැඩි බලතල හා අධිකාරී බලය පැවරීම - අනුයෝජිතතා මූලධර්මය, එනම් පහළම මටටමේ සිටින පාලන ආයතනයට හෝ ඒකකයට හැසිරවිය හැකි කවර දෙයක් වුව ද එම ආයතනයට හෝ ඒකකයට ලබාදිය යුතුය යන මූලධර්මය යොදාගත යුතු ය.
3. පළාත් පාලන ආයතන විසින් දැනටමත් පරිපාලනය කරනු ලබන විෂයයන්ට අමතරව පෙර පාසල්, විදුලිය බෙදාහැරීම හා ජල සම්පාදනය සහ සමාජ සේවා විමධ්‍යගත කළ හැකි ය. වෙනම පළාත් පාලන ලැයිස්තුවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගැනීමට ලක් කළ යුතු අතර එමගින් පළාත් පාලන ආයතනයට විමධ්‍යගත කරනු ලබන විෂයයන් (පරිපාලන කර්තව්‍යයන් පමණක් විමධ්‍යගත කරනු ලබන විෂයයන් ද ඇතුළුව) නියම කරනු ලැබිය යුතු ය. (මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාවෙහි නිර්දේශ අංක 9.2.2 (iv) (ඇ) මගින් පළාත් පාලන ලැයිස්තුවක් වෙත අවධානය යොමු කෙරේ.
4. පළාත් පාලන ආයතනවලට ඇතැම් නියෝජිතායතන කර්තව්‍යයන් හැසිරවීමට, එසේත් නැතිනම් මධ්‍යම රජයේ හා පළාත් සභාවල නීති රීති හා ව්‍යවස්ථාපිත, නිදසුනක් ලෙස පාරිසරික නීති, වෙරළ සංරක්ෂණය, සමෘද්ධි වැඩසටහන්, පතල් කැණීම්, පෙර පාසල් ආදිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වශයෙන් ක්‍රියා කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම බලය ලබාදිය යුතු ය.
5. පළාත් පාලන ආයතනවලට සිය වියදම් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් ද සහිතව ප්‍රමාණවත් ස්වාධීනත්වයක් ලබාදිය යුතු අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කරනු ලැබිය යුතු ය. ඒ අනුව, විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදානයන් ලබන අතරම ඔවුන් ස්වකීය ආදායම රැස් කිරීම සඳහා බලගැන්විය යුතු ය. මධ්‍යගත බදු එකතු කිරීමේ ක්‍රමයක් වඩාත් ප්‍රායෝගික යැයි සැලකේ නම් එවිට ඒ ඒ පළාත් පාලන ආයතනයට අරමුදල් සැණෙකින් අරමුදල් පැවරෙන බවට සහතික වෙමින් පළාත් සභාවලට එය හැසිරවිය හැකි ය.
6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව ඒකරූපීත්වය නියම කිරීමට කේන්ද්‍රයට හැකි වන අතර ම, පළාත් පාලන ආයතනවල මැතිවරණ, ස්වරූපය, ව්‍යුහය හා බලතල හා ජාතික ප්‍රමිතිවලට අනුකූලව පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම පළාත් සභාවල බලතල ඇතුළත විය යුතු ය.
7. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් දැනට ඇති ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් සංගෘහිත කරමින් පනතක් සම්පාදනය කළ හැකි අතර විවිධ පළාත් පාලන ආයතන ප්‍රභේද - වඩාත් රුචි ලෙස ප්‍රභේද දෙකක් සඳහා නිර්ණායක හා ඒවායේ එකිනෙකට වෙනස් බලතල හා කාර්යභාරයන් සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය. එම නිර්ණායක අවශ්‍යතා පදනම් කරගෙන විය යුතු අතර ඒවාට වෙනත් දේ අතර ජනගහනය, භූමි වර්ගඵලය, තිබෙන යටිතල පහසුකම් ආදිය ඇතුළත් විය යුතු ය. වඩාත් කුඩා පළාත් පාලන ආයතන වඩාත් සඵලදායී වනු ඇත.

8. නිමිත ඒකරූපී නිර්ණායකවලට අනුකූලව පළාත් පාලන ආයතන මායිම් යළි නිර්ණය කිරීම සඳහා පමණක් නොව එම ඒකරූපිත්වයට අනුවම ග්‍රාම නිලධාරී හා ග්‍රාම සේවා කොට්ඨාසවල මායිම් සමපාත වන බවට වගබලා ගැනීම සඳහා ද "මායිම් කොමිසන් සභාව" නමින් ආයතනයක් ද යෝජනා කර තිබේ.

9. වතුකරයේ ජනාවාස ගම්මාන පද්ධතියේ කොටසක් වශයෙන් හා පළාත් පාලන ආයතනවල කොටසක් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු ය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, විශේෂයෙන් ම එහි 2(1), 33, 19(xiv), 19(xxii) හා 134(4) වගන්ති අහෝසි කළ යුතු ය. (මහජන අදහස් පිළිබඳ වාර්තාවේ පිටුව 80, 10.2 කොටස බලන්න)

10. පළාත් පාලන ආයතනවල සංවර්ධන හා වෙනත් කටයුතුවල දී උපදෙස් දීමට, සහාය වීමට හා සම්බන්ධීකරණය කිරීමට ස්වාධීන ප්‍රජා මට්ටමේ ආයතන වශයෙන් ග්‍රාම රාජ්‍ය පිහිටුවීම.

2. ග්‍රාම රාජ්‍ය සංකල්පය

නිර්දේශ

1. ග්‍රාම නිලධාරී කොට්ඨාස 3කින් හෝ 4කින් සමන්විත ග්‍රාම රාජ්‍ය ආයතන ව්‍යවස්ථාපිත ලෙස ගම් මට්ටමෙන් ස්ථාපිත කළ හැකි ය. පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහාය, උපදෙස් හා නිරීක්ෂණය සපයමින් ඒවායේ ක්‍රියාමාර්ගවලට උත්තේජනයක් ලෙස ග්‍රාම රාජ්‍යවලට ක්‍රියාත්මක විය හැකි ය. එමෙන් ම සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට ද ග්‍රාම රාජ්‍යවලට පිළිවන. (මහජන අදහස් විමසීමේ කමිටුවේ වාර්තාව - නිර්දේශ අංක 10.2, 80 පිටුව)

2. පාර්ලිමේන්තුවට ඉහත කී අභිමතාර්ථ සඳහා ග්‍රාම රාජ්‍ය ආයතන පිහිටුවීම උදෙසා පනවනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

3. ග්‍රාම රාජ්‍ය ආයතන සම්බන්ධ රාමුව ජාතික නීතිය මගින් නියම කරනු ලැබිය හැකි අතර ම, එම නීතිය පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල බලය හීන නොකළ යුතු ය.

3. පළාත් විධායකය/විධායක කාරක සභා ක්‍රමය

නිර්දේශ

1. ඉහත කරුණු සලකා බැලීමේ දී කාරක සභාව අනිවාර්ය බහු පක්ෂ ක්‍රමයක් නිර්දේශ නොකරයි. (එනම් ඇමති මණ්ඩලය) විශේෂයෙන් ම එමගින් බෙදන ලද බලය අවතක්සේරු කිරීමක් එමගින් සිදුවන අතර එය මධ්‍යම රජය මගිනුත් පිළිගන්නා තත්ත්වයක් නැත. (PRC හි සාමාජිකයන් කිහිප දෙනෙක් පළාත්වල බහුපක්ෂ විධායකයන් පිළිබඳ නිර්දේශ කර තිබේ. නිර්දේශය 7.1.2 PRC වාර්තාවේ 34 පිටුව)

විද්වත් මතය

බහු පක්ෂ ක්‍රමය අනුමත කරමින් ප්‍රතිපාදන සකස් කරන්නේ නම් (පළාත් මට්ටමේ ඒකීය රජයක් සකස් වන අවස්ථාවක) තව අමතර ඇමතිවරු කිහිප දෙනෙක් පත්කර ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සැලසිය යුතු ය.

2. කෙසේ වෙතත් බහු පක්ෂ කාරක සභා ක්‍රමය (පාර්ලිමේන්තුවේ ස්ථාපිත කළ පසු සකස් කළ) උපදේශන භූමිකාවකට පමණක් සීමා නොකළ අධීක්ෂණ කටයුතු ඉටු කිරීම සඳහා ශක්තිමත් කළ යුතු ය.

4. ආණ්ඩුකාරවරයාගේ බලතල සහ ව්‍යවස්ථා සම්පාදනයේදී ඔහුගේ කාර්ය භාරය

නිර්දේශ

1. ආණ්ඩුකාරවරයාට තම අභිමතය අනුව කටයුතු කළ හැකිවීම බලාත්මක කර ඇති ප්‍රතිපාදන සංශෝධනය කළ යුතු ය. විශේෂයෙන් ම 154(C) සහ 154(F) (1)-(3) යන ව්‍යවස්ථා අවලංගු කළ යුතු අතර 1987 අංක 42 දරන පළාත් සභා පනත වෙනුවට නව පනතක් ඉදිරිපත් කළ යුතු ය. (PRC නිර්දේශ 9.2.2(i) (a-c) බලන්න.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව ආණ්ඩුකාරවරයා තම අභිමතය අනුව කටයුතු කිරීම අවශ්‍ය වන අවස්ථාවක හැර ආණ්ඩුකාරවරයා නාමික විධායකයකු ලෙස කටයුතු කළ යුතු බව නිර්දේශ කෙරෙන අතර ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත කටයුතු කළ යුතු ය.

(ආණ්ඩුකාරවරයාගේ තනතුර සම්පූර්ණයෙන් ම අහෝසි කිරීමටත් ප්‍රධාන අමාත්‍යවරයා ජනාධිපතිවරයා විසින් පතකළ යුතු බවත් උතුරු මැද පළාතේ මහ ඇමතිවරයා නිර්දේශ කර තිබේ.)

3. පළාත් රාජ්‍ය සේවය, ජාතික රාජ්‍ය සේවා කොමිසමට සමාන වන මට්ටමේ ස්වාධීන පළාත් රාජ්‍ය සේවා කොමිසමක් යටතට පත් කළ යුතු ය.

4. පළාත් පොලිස් සේවය ද ජාතික පොලිස් කොමිසමට සමාන වන මට්ටමේ පළාත් පොලිස් කොමිසමක් යටතට පත් කළ යුතු ය.

5. පළාත් සභාව විසින් සම්මත කරන ප්‍රඥප්ති සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය අවශ්‍ය වීම ඉවත් කළ යුතු ය. (PRC නිර්දේශ 9.2.2(i) (a-c) බලන්න. වර්තමාන පාර්ලිමේන්තුවේ අනුගමනය කරන ක්‍රියා කලාපය වන පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් කථානායකවරයා විසින් අත්සන් කිරීම පළාත් සභා සම්බන්ධයෙන් ද පළාත් සභාව සම්මත කරන ප්‍රඥප්ති සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කිරීම ලෙස යොදාගත හැකි ය.

6. කෙසේ වෙතත් මෙම ප්‍රඥප්ති ව්‍යවස්ථාදායක අධිකරණය විසින් අධිකරණමය සමාලෝචනයකට ලක් කළ යුතු ය. ඒ සඳහා එම ප්‍රඥප්ති එහි ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් ඉදිරියේ අභියෝග යකට ලක්කළ හැකි බව නිර්දේශ කරයි.

විද්වත් මතය

සමහර විද්වත්හු (5) සඳහා විකල්ප යෝජනා කර ඇත.

ආණ්ඩුකාරවරයාට යම් කිසි ප්‍රඥප්තියකට තම අනුමැතිය ලබාදීම හෝ එය නැවත සලකා බැලීම සඳහා ආපසු එවීමට නිශ්චිත කාල සීමාවක් (උදා : සති දෙකක්) ලබාදිය යුතු ය. නියමිත කාල සීමාව තුළ කිසිවක් නොකළේ නම් ප්‍රඥප්තියට අනුමැතිය ලබා දුන්නා සේ සැලකේ.

7. මූල්‍යමය ඇඟවීමක් සහිත ප්‍රඥප්ති සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය අවශ්‍ය බවට වන නිර්දේශය අහෝසි කළ යුතු ය. ඒ වෙනුවට ප්‍රඥප්ති පැනවීමේ දී මූල්‍යමය පනත් කෙටුම්පත් හඳුන්වාදීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු ය.

8. පළාත් ප්‍රඥප්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් මගින් පෙර හා පසු අධිකරණ සමාලෝචනයකට භාජනය කිරීම. (පොදුවේ අධිකරණ සමාලෝචන සම්බන්ධයෙන් උතුරු පළාතේ පළාත් සභාවේ ඉදිරිපත් කිරීම බලන්න) අධිකරණය පූර්ව සම්පාදන සමාලෝචන ක්‍රියාවලියේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පක්ෂව තීන්දු දීම යන කාරණය ඉන් පසුව එන පූර්ව සම්පාදන ක්‍රියාවලියේ දී බාධාවක් ලෙස කටයුතු නොකළ යුතු ය.

9. ප්‍රධාන අමාත්‍යවරයා සමග සාකච්ඡා කිරීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුකාරවරයාව පත් කළ යුතු ය.

විද්වත් මතය

වඩා හොඳ ක්‍රමය වන්නේ ප්‍රධාන අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට ජනාධිපතිවරයා විසින් ආණ්ඩුකාරවරයාව පත් කිරීමයි.

10. ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන තුළ ආණ්ඩුකාරවරයා තම පත්වීමට නිශ්චිත කාලයකට පෙර (උදා : වසර දෙකක්) දේශපාලනයේ ක්‍රියාකාරී භූමිකාවක නියැළුණ අයකු නොවිය යුතු අතර තනතුර දරන කාලසීමාව තුළ ද දේශපාලනයේ ක්‍රියාකාරී භූමිකාවක නොයෙදිය යුතු ය.

11. නාමික / නාම මාත්‍ර ආණ්ඩුකාරවරයෙක් පළාත් මට්ටමෙන් ලබාදෙන අතර පළාත තුළ නීතිය සහ සාමය කඩවන ආකාරයේ යම් කිසි සත්‍ය සිදුවීමක් සිදු වූ විට හෝ එවන් තර්ජනාත්මක තත්ත්වයක දී පළාත් සභාව මධ්‍යම ආණ්ඩුවේ සෘජු පාලනයට නතු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන සත්‍ය හෝ සමුපස්ථිත අන්තරාය තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශක්තිමත් කළ යුතු ය යන කාරණය වාස්තවිකව තක්සේරු කර බැලීම නිර්දේශ කෙරේ. කෙසේ වෙතත් එවන් තීරණ යම් කිසි නිශ්චිත කාලසීමාවක් තුළ අධිකරණමය සමාලෝචනයකට භාජනය කළ යුතු ය.

12. පාර්ලිමේන්තු පනත්වල පළාත් සභාවල කටයුතු සම්බන්ධයෙන් සඳහන් කෙරෙන අවස්ථාවල 'ආණ්ඩුකාරවරයා / අමාත්‍ය' යන නම් වෙනුවට අදාළ ප්‍රධාන අමාත්‍යවරයා හෝ අදාළ විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වන ආකාරයට සකස් විය යුතු ය.

5. ස්වාධීන රාජ්‍යසේවා කොමිසම/පළාත් වල පරිපාලන ව්‍යුහය

නිර්දේශ

1. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව මෙන් ස්වාධීන ආයතනයක් විය යුතු ය. එහි දී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයේ විනය කටයුතු සහ මානව සම්පත් සම්බන්ධ කටයුතු හැසිරවීමට හැකිවන අන්දමේ ඉහළ අවංකභාවයක් සහ අවශ්‍ය දැනුම සහ අත්දැකීම් සහිත විය යුතු ය.

2. පළාත් සභාවේ මහ ඇමතිතුමා සහ විරුද්ධ පක්ෂයේ නායකතුමා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරන පුද්ගලයන් ඒකාබද්ධව නම් කළ යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය එවන් නම් කිරීම් අනුමත කළ යුතු ය. ආණ්ඩුකාරවරයා එවන් පත් කිරීම් සිදුකළ යුත්තේ ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව ය.

3. ප්‍රධාන අමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකතුමාට එකඟත්වයකට පැමිණීමට නොහැකි වූ විට ප්‍රධාන

අමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකතුමා විසින් කරන නිර්දේශ පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කරන පත් කිරීම් සිදුකළ හැකි ය.

4. මහ ඇමතිවරයා සහ විපක්ෂ නායකවරයා ගේ නාම යෝජනා අතර පත් කිරීමට තරම් යෝග්‍ය නොවන සහ ප්‍රමාණවත් නොවන පුද්ගලයන් සිටින බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය කල්පනා කරන්නේ නම් සලකාබැලීම සඳහා නැවතත් නම් යෝජනා කරන ලෙස එයට ඉල්ලා සිටිය හැකි ය.

5. ඉන් පසු මහ ඇමතිවරයා සහ විරුද්ධ පක්ෂයෙන් නායකවරයා විසින් නම් කරන නාම යෝජනා අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය. (විද්වත් මතය : එම පුද්ගයන් පත් කිරීම සඳහා සුදුසු නොවන බවට ඔවුන් කල්පනා කරන්නේ නම් පත් කිරීම සඳහා ඔවුන්ට විකල්ප නම් යෝජනා කළ හැකි ය.) මෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ කළ පසු ආණ්ඩුකාරවරයාට එම පත්කිරීම් සිදුකළ හැකි ය.

6. පළාත් රාජ්‍ය සේවයේ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය ආදී කටයුතු සහ සේවයෙන් පහ කිරීම ආදිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යයන් විය යුතු ය. (උතුරු පළාතේ පළාත් සභාව සහ නැගෙනහිර පළාතේ මහ ඇමතිවරයා විසින් කරන ලද ඉදිරිපත් කිරීම් බලන්න.)

7. යම් කිසි බලයක් ප්‍රධාන ලේකම්වරයාට හෝ පළාතේ වෙනත් නිලධාරියෙකුට, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාරක සභාවකට හෝ පැවරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පිළිවෙළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු ය.

8. මධ්‍යම රජයේ සිදුවන ආකාරයට පළාතේ අමාත්‍ය මණ්ඩලයට පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ සිට එවන් නිලධාරීන්ගේ චර්යා ධර්ම පද්ධති සහ උසස්වීම් සහ මාරුවීම්වල දී අනුගමනය කළ යුතු මූලධර්ම ද ඇතුළත්ව සියළු කටයුතු තීරණය කිරීමේ බලය තිබිය යුතු ය. (මධ්‍යම පළාතේ මහ ඇමතිවරයාගේ ඉදිරිපත් කිරීම ද බලන්න.)

9. එක් එක් පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පළාත් පාලන ආයතන ද ඇතුළත් ව අදාළ පළාතේ සේවක අවශ්‍යතාව සහ එම පළාතට අවශ්‍ය වන දීප ව්‍යාප්ත සේවයන්හි සේවක සංඛ්‍යාව ආදිය නිර්ණය කිරීමට බලයක් තිබිය යුතු අතර එය සෑම පළාතකටම සාමාන්‍යයෙන් යොදාගන්නා නිර්ණායක මත පදනම් විය යුතු ය. (උතුරු පළාත් සභාව සහ උතුරු පළාත් මහ ඇමතිවරයාගේ ඉදිරිපත් කිරීම් බලන්න)

10. සියළුම දීප ව්‍යාප්ත සේවා පුද්ගලයන් නිදහස් කිරීම සහ මාරු කිරීම ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදේශනය සහිතව සිදුකළ යුතු ය.

11. මධ්‍යම මට්ටමේ සහ පළාත් මට්ටමේ වෘත්තීමය වශයෙන් ඉහළ ප්‍රමිතියක් තබා ගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අනෙකුත් පළාත්වල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සමග සම්බන්ධීකරණයක් තිබිය යුතු ය.

12. දීප ව්‍යාප්ත සේවය ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, රජයේ වෛද්‍ය නිලධාරී සේවාව, ශ්‍රී ලංකා පොලිස් නිලධාරී සේවය, ශ්‍රී ලංකා විද්‍යා නිලධාරීන් සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් දක්වා ඇති සේවාවන් කිහිපයකට සීමා විය යුතු ය.

කාරක සභාවේ සභික මන්ත්‍රී ගරු බිමල් රත්නායක මහතාගේ අදහස වන්නේ වර්තමානයේ පවතින දීප ව්‍යාප්ත සේවය එසේම තිබිය යුතු අතර එම සේවාවන්ට අයත් පුද්ගලයන් පළාත් පරිපාලන පද්ධතිය තුළට අන්තර්ග්‍රහණය කළ යුතු බවයි.

13. පළාත්වලට තමන්ගේ ම වූ පළාත් රාජ්‍ය සේවයක් නිර්මාණය කර ගැනීමටත් පළාතට වෙන් කොට ඇති සියළු විෂය කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය සියළුම සේවාවල සේවක සංඛ්‍යාවන් එයට අන්තර්ග්‍රහණය කිරීමටත් පළාත්වලට බලය තිබිය යුතු අතර එසේ කිරීමේ දී එවන් සේවකයන් විසින් ඔවුන්ව අන්තර්ග්‍රහණය කිරීමට ආසන්න පෙර අවස්ථාවේ ඔවුන් භුක්ති විඳි රැකියා කොන්දේසිවලට කිසිදු අඩුවක් නොවන මට්ටමේ කොන්දේසිවලට යටත්කළ යුතු ය.

14. පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්ට ජාතික රාජ්‍ය සේවයේ තම රැකියාව සුරක්ෂිත කර ගැනීමට හෝ ජාතික රාජ්‍ය සේවයට මාරුවීමට අවස්ථාව ලැබිය යුතු ය.

15. එක් එක් පළාතේ පළාත් පාලන ආයතනවලට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් එක්කෝ එම පළාතේ රාජ්‍ය සේවයට හෝ පළාත් පාලන ආයතනවල අවශ්‍යතාවට ගැළපෙන ලෙස එක් එක් පළාත් පාලන ආයතනවලට සකස් කළ සේවයකට අයත් විය යුතු ය.

16. පළාත් පාලන සේවයේ සිටින සේවකයන්ට පළාත් සේවයේ හෝ ජාතික මට්ටමේ රාජ්‍ය සේවයේ රැකියා ලබාගැනීමට

මාරුවීම්වලට අවස්ථාව ලැබිය යුතු ය.

17. දීප ව්‍යාප්ත සේවයට අයත් වන සමාන කාණ්ඩ සහ තනතුරුවල සිටින අයට සෑම අතින් ම සහ දීමනා ගෙවීම අතින් සමාන විය යුතු ය. කෙසේ වෙතත් මෙමගින් පළාත්වලට අමතරව දිරි දීමනා ලබාදීමට ඇති හැකියාව සීමා නොකෙරේ.

18. පළාත් රාජ්‍ය සේවයට සහ පළාත් පාලන සේවයට අයත් රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ පළාතට වැටුප් සහ සේවා කොන්දේසි ලබාදීමේ අයිතිය තිබේ.

19. මෙවන් අවශ්‍යතා අත්හැර දැමීමට අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඇති බලයට යටත්ව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගන්නා සෑම නිලධාරියෙක් ම එම පළාතෙන් වෙනත් පළාතකට මාරු වීමට පෙර අවම කාල සීමාවක් එම පළාතේ සේවය කළ යුතු ය.

20. පළාත් රාජ්‍ය සේවයට අයත් අගතියට පත් නිලධාරීන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ තීරණවලට හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තම අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය සභාවට පැමිණිලි කළ හැකි ය. (මධ්‍යම පළාතේ මහ ඇමතිවරයාගේ ඉදිරිපත් කිරීම ද බලන්න.)

21. පළාත් පරිපාලන කටයුතු ඉටු කිරීම සඳහා පළාත් කළමනාකරණ සේවයක් තිබිය යුතු අතර පළාත් කළමනාකරණ සේවයේ සාමාජිකයන්ට පළාත් අතර මාරුවීමට හැකියාව තිබිය යුතු ය. පළාත් රාජ්‍ය සේවයේ කොන්දේසි දක්වා ඇති සේවා අත්පොත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සබාවේ සාමාජිකයන්ගෙන් සමන්විත වන කමිටුවක් මගින් සිදුකළ යුතු ය. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුව අන්තර් පළාත් රාජ්‍ය සේවා විශේෂයෙන් ම පළාත් කළමනාකරණ සේවය අතර ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා උපරිම බලය සහිත කමිටුවක් තිබීම වැදගත් වේ.

22. බලය විමධ්‍යගත කිරීම ඵලදායී විය යුතුවාක් මන් ම ද්විත්වකරණයෙන් වැළැක්විය යුතු ය. මේ සඳහා පළාත් පරිපාලනයේ කොටසක් බවට පත් කරමින් දිස්ත්‍රික් පරිපාලනය ප්‍රතිව්‍යුහගත කළ යුතු ය. (මේ දක්වා එය බෙදුණු බලයක් විය.)

23. එමනිසා රජයේ නියෝජිතයන් සහ ප්‍රාදේශීය ලේකම්වරු දීප ව්‍යාප්ත සේවයකට අයත් විය යුතු අතර ඔවුන්ට පිළිවෙළින් අතිරේක ප්‍රධාන ලේකම්වරයකුගේ සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයකුගේ තත්ත්වය ලැබිය යුතු ය.

24. සියළුම ග්‍රාම නිලධාරීන් එම පළාතේ පළාත් රාජ්‍ය සේවයට ඇතුළත් කළ යුතු ය.

25. ප්‍රධාන ලේකම්වරයා සහ පළාත් අමාත්‍යවරුන්ගේ ලේකම්වරුන් මහ ඇමතිවරයාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු ය.(මධ්‍යම පළාතේ සහ නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරුන්ගේ ඉදිරිපත් කිරීම් බලන්න.)

26. සෑම පළාතකටම පළාත් අද්වකාත් දෙපාර්තමේන්තුවක් සහ පළාත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවක් තිබිය යුතු ය. (ඌව පළාතේ මහඇමතිවරයා විසින් යෝජනා කරන ලදි.)

විද්වත් මතය

ජාතික / මධ්‍යම වශයෙන් ලැයිස්තුගත විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සෑම පළාතක් තුළ ම මධ්‍යම ආණ්ඩුවේ කාර්ය මණ්ඩලයේ සිටීම අත්‍යාවශ්‍ය බව සමහර විද්වතුන්ගේ මතයයි. එම නියෝජිතයින්ට මධ්‍යම රජයට වාර්තා කරනු ඇත. මධ්‍යම රජය වෙනුවෙන් පමණක් ම කටයුතු කරන දිස්ත්‍රික් ලේකම්වරයෙක් ජාතික / මධ්‍යම ආණ්ඩුව සම්බන්ධ ලැයිස්තුවේ ඇති විෂයයන් සම්බන්ධයෙන් පමණක් මධ්‍යම රජයට වාර්තා කිරීම අවශ්‍ය වනු ඇත.

6. පළාත් සභා හා සම්බන්ධ දිස්ත්‍රික් ලෙකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය භාරය/ පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් නිශ්චිත විෂයයන් සම්බන්ධ පාර්ලිමේනතු නීති ක්‍රියාවට නැංවීම/ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ආකාරය

නිර්දේශ

1. බලතල බෙදීම ඵලදායී මෙන්ම ද්විත්වකරණය වීමෙන් තොර විය යුතු ය. (උතුරු පළාත් සභාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු බලන්න.) එම අවශ්‍යතාව ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිව්‍යුහගත කොට එය පළාත් පරිපාලනයේ කොටසක් බවට පත් කළ යුතු යැයි අප යෝජනා කර සිටිමු. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් අතිරේක ප්‍රධාන ලේකම් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ලෙස නම් කළ යුතු ය. පළාතක් තුළ සේවයේ යෙදී සිටින සියලු ග්‍රාම නිලධාරීවරුන් අදාළ පළාතේ රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කළ යුතු ය.

2. පළාත් තුළ සේවයේ නිරතව සිටින දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් (පිළිවෙළින් අතිරේක ප්‍රධාන ලේකම් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ලෙස තනතුරු නාමයන් වෙනස් කරන ලද) සහ ග්‍රාම නිලධාරීවරුන්හට මධ්‍යම රජයේ විෂය පථය යටතේ ගැනෙන කාර්යයන් ඉටු කිරීමට හැකිවන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන සැලසිය යුතු ය. උදාහරණ : ඡන්ද නාම ලේඛන හා ජාතික හැඳුනුම්පත් සකස් කිරීමේ දී අවශ්‍ය සහාය ආදිය

3. ප්‍රාදේශීය සභා සීමාවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවන් සමග සීමාන්තික විය යුතු ය.

7. ජාතික, පළාත්, දිස්ත්‍රික්,පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම සහ ආදායම් බෙදීම සඳහා වන සූත්‍ර ආදායම් වගවීම පිළිබඳ ද්විත්ව වාර්තාකරණය/ප්‍රතිපත්ති සම්පාදනය- ජාතික, පළාත්. දිස්ත්‍රික් හා පළාත් පාලන ආයතන

නිර්දේශ

1. මධ්‍යම - පළාත් සභා සබඳතා, රජයේ සෑම ස්ථරයක් ම සුවිශේෂී යන මූලධර්මය මත ක්‍රියාත්මක විය යුතුයි.

2. මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභාවලට මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා අවශ්‍ය අනිවාර්ය නිර්ණායක සකස් කිරීම සඳහා පාදක වන මූලධර්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පැහැදිලිව සඳහන් කළ යුතු ය. (උතුරු පළාත් සභාවේ අදහස් දැක්වීම බලන්න.) රජයේ ආදායමෙන් අවම වශයෙන් සියයට 40ක් පළාත් සභාව සඳහා වෙන් කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිශ්චය කළ යුතු බව කාරක සභාව නිර්දේශ කරයි. පළාත් සභා සඳහා සියයට 30ක් ද, පළාත් පාලන ආයතන සඳහා සියයට 10ක් (විශේෂඥ මතය : මේ සම්බන්ධයෙන් මහජන අදහස් විමසීමේ කමිටුවෙහි නිර්දේශයක් වන්නේ, යෝජනා කොට ඇති ප්‍රතිශතයන් සියයට 18 හා සියයට 7 මහජන අදහස් විමසීමේ කමිටුවෙහි වාර්තාව 16.2.7 (ආ) සලකා බැලිය හැකි ය.)

විශේෂඥ මතය

ජාතික ආදායම රජයේ ස්ථර තුන අතර සාධාරණ ලෙස බෙදීයාම තහවුරු කිරීම පිණිස මුදල් කොමිෂන් සභාව විසින් අනුගමනය කළ යුතු අනිවාර්ය මාර්ගෝපදේශයන් වෛකල්පිත වශයෙන් ඇතුළත් කළ යුතු බව ඇතැම් විශේෂඥයින් යෝජනා කරන ලදි.

මුදල් කොමිෂන් සභාවේ තීරණ බලාත්මක කිරීම රජය විසින් සිදුකළ යුතු ය. එය ජාතික ආදායම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සතු අවසන් පාලන බලයට අගතියක් සිදු නොවන ආකාරයෙන් සිදු විය යුතු ය.

(මුදල් කොමිෂන් සභාව අහෝසි කළ යුතු බවත්, අය වැය ප්‍රතිපාදන සෘජුවම අදාළ පළාත් සභාව වෙත ප්‍රේෂණය කළ යුතු බවත්, උතුරු මැද, නැගෙනහිර සහ වයඹ පළාත්වල ප්‍රධාන අමාත්‍යවරුන් විසින් යෝජනා කරන ලදි)

3. පළාත් නියෝජිතය ඇති කිරීම ස්වකීය නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩි බලතල ලබාදීම සහ පළාත් අතර පවතින දැඩි සංවර්ධන සහ ආර්ථික අසමතුලිතතාවන් තුරන් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව ප්‍රතිව්‍යුහගත කළ යුතු ය.

4. මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් සහ නිර්දේශ ඉහළ දැමීම සහ ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සතු අභිමතානුසාරී බලය සීමා කිරීමේ අවශ්‍යතාව ඉටු කිරීම සඳහා පළාත් සහ මුදල් කොමිෂන් සභාව අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු ය.

5. පළාත් සභාවට ප්‍රතිපාදන වෙන් කිරීමේ ජාතික අය වැය සමග පාර්ලිමේන්තුවේ සභාගත කොට පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු ය.

6. රජයේ ස්ථර තුනෙහි බදු අය කිරීම සහ ආදායම් එකතු කිරීම් පිළිබඳ බලතල සීමාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැහැදිලිව දැක්විය යුතු අතර බදු එකතු කිරීමේ පරිපාලන යාන්ත්‍රණයක් රජයේ එක් එක් ස්ථරයේ මූල්‍ය බලතල කප්පාදු නොකරන බවට එමගින් වගබලාගත යුතු ය.

7. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙන් කළ ලැයිස්තුවේ පළමුවන අංකය වන 'සියලු විෂයයන් සහ කාර්යයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය' ඉවත් කළ යුතු අතර ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී පළාත් නියෝජිතයින්ගේ සහභාගිත්වය තහවුරු කෙරෙන උපදේශකත්ව යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කළ යුතු ය.

(මීට සමාන අදහසක් බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදි. අමාත්‍ය මණ්ඩල තීරණ / චක්‍රලේඛ තුළින් පමණක් ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම නොකළ යුතු බව මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ප්‍රකාශ කරන ලදි.)

8.1 සමගාමී ලැයිස්තුව

නිර්දේශ

සමගාමී ලැයිස්තුව අහෝසි කොට විෂයයන් වෙන් කළ ලැයිස්තුවට ඇතුළත් කළ යුතු බව කාරක සභාව නිර්දේශ කරයි.

"සියලු විෂයයන් සහ කාර්යයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති" නම් මාතෘකාව වෙන් කළ ලැයිස්තුවෙන් ඉවත් කළ යුතු බවට ද කාරක සභාව නිර්දේශ කරයි.

කිසිදු ලැයිස්තුවක ඇතුළත් කොට නැති සියලු විෂයනන් සහ කාර්යයන් (පළාත් සහ වෙන් කළ ලැයිස්තු) පළාතේ විෂයයන් විය යුතු ය.

8.2 නීතිය හා සාමය සහ පොලිස් බලතල

නිර්දේශ

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරන්නෙමු.

නීතිය හා සාමය පළාත් සභාවල විෂයයක් විය යුතු ය. පොලිසිය පරිපාලනය කිරීම මධ්‍යම රජයේ මෙන් ස්වාධීන පළාත් පොලිස් කොමිෂන් සභාවක් තුළින් සිදුවිය යුතු ය. පරිපාලන කටයුතු සම්බන්ධයන් ප.පො.කො. ජාතික පොලිස් කොමිෂන් සභාව සමග සමීපව කටයුතු කළ යුතු ය. සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය හා ත්‍රස්තවාදය ආදි කරුණු ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂයයන් විය හැකි ය. පළාත් තුළ වැරදිකරුවන්ටහට නඩු පැවරීම සඳහා ස්වාධීන පළාත් අභිචෝදනා ජනරාල්වරයකු සිටිය යුතු ය.

8.3 ඉඩම්

නිර්දේශ

පළාතක් තුළ ඇති රජයේ ඉඩම්, අදාළ පළාතේ ව්‍යවස්ථාදායක සහ විධායක යාන්ත්‍රණය විසින් පාලනය කළ යුතු විෂයයක් බව අප නිර්දේශ කර සිටිමු. කෙසේ වෙතත්, වෙන්කළ ලැයිස්තුවේ සඳහන් පරිදි මධ්‍යම රජයේ යම් නීත්‍යනුකූල කාර්යයක් සඳහා රජයේ ඉඩමක් නිදහස් කරන ලෙස මධ්‍යම රජයට පළාත් විධායකයෙන් ඉල්ලා සිටිය හැකි අතර, තම පළාත තුළ පිහිටි එකී ඉඩම අදාළ කාර්යය සඳහා මධ්‍යම රජය වෙත නිදහස් කිරීම පළාත් විධායකයේ වගකීම වේ. කෙසේ වෙතත් තම බල ප්‍රදේශය තුළ තිබෙන රජයේ ඉඩම් භාවිතා කිරීමේ දී වන ආවරණය, අන්තර් පරම්පරා සාධාරණත්වය, කෘෂිකාර්මික තිරසාරභාවය, ඉඩම් කැබලි කිරීම හා ඉඩම් නොමැති බව ආදි කරුණු සම්බන්ධයෙන් නිසි උපයෝජන පිළිවෙත් අනුගමනය කිරීම සඳහා ඉඩම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන් පළාත් සභාව විසින් පිළිපැදිය යුතු ය.

රජයේ ඉඩම් කොමිෂන් සභාව තුළ මධ්‍යම රජයේ සහ පළාත් සභාවල බැඳියා නියෝජනය කිරීම සඳහා සාධාරණ සාමාජික සංඛ්‍යාවක් සිටිය යුතු අතර පළාත් සභා නියෝජනය කරන සාමාජිකයින්ගේ කැමැත්තෙන් තොරව කිසිදු තීරණයක් පළාත් සභාව වෙත ආරෝපණය කිරීමට නොහැකි වන සේ එම ආයතනයේ බලතල හා කාර්යයන් නිර්මාණය කළ යුතු ය.

එසේ ම දැනට පවතින පනත් යටතේ (උදා : මහවැලි පනත, නාගරික සංවර්ධන අධිකාරියේ පනත, වන ආඥා පනත, සංචාරක පනත ආදි) යම් රජයේ ඉඩමක් ප්‍රකාශයට පත් කිරීම හෝ පවරා ගැනීම අදාළ පළාත් සභාවේ අනුමැතිය මත පමණක් සිදු කළ යුතු ය. අන්තර් - පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ද ඒ හා සමාන වගන්ති ඇතුළත් කළ යුතු ය.

8.4 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

නිර්දේශ

පළාත් සභාව විසින් සම්මත කරන ලද ව්‍යවස්ථා සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහ අවසන් තීරණ සහිත නීති සභාගත කිරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ අවශ්‍යය යන වගන්ති ඉවත් කිරීම කාරක සභාව විසින් නිර්දේශ කොට ඇති අතර, පළාත් සභාව විසින් සම්මත කරන ලද ව්‍යවස්ථාවල පූර්ව සහ පශ්චාත් අධිකරණ සමාලෝචනයන් සිදු කිරීම සඳහා සහ පළාත් සභාවල විධායක බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභා සහ මධ්‍යම රජය අතර ඇති වන ආරවුල් නිරාකරණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් ස්ථාපිත කළ යුතු යැයි කාරක සභාව අදහස් කරයි.

එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ සංයුතිය රටේ පවතින බහු වාර්ගික ස්වභාවය සැලකිල්ලට ගනිමින් එයට සාධාරණ නියෝජනයක් ලැබෙන පරිදි ස්ථාපිත වන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව තහවුරු කළ යුතු ය. රටේ ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් ද එය එසේ විය යුතු ය.

මුදල් පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව නිර්දේශඃ

යහපත් රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් විද්වතුන්ගේ අදහස් සහ මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාව සැළකිල්ලට ගනිමින් රැස්වීම් වාර අටක් පමණ පවත්වා සාකච්ඡා කොට අනු කමිටුව පහත නිර්දේශ ඉදිරිපත් කරයි.

i. **<u>මුදල් විෂය අමාත්‍ය මණ්ඩලය තුළට පැවරීම</u>**

(1) රාජ්‍යයේ හෝ ආණ්ඩුවේ නායකයා අමාත්‍ය මණ්ඩලය තුළ මුදල් විෂය භාර අමාත්‍ය ධූරය නොදැරිය යුතු ය.

ii. **<u>තිරසාර වර්ධනය සහ සංවර්ධනය වෙත යොමුවීමක් පවත්වා ගැනීම</u>**

(2) ජනරජයේ ආණ්ඩුවේ සියළු ක්ෂේත්‍ර තුළ රාජ්‍ය මූල්‍ය ව්‍යවහාරයන් පහත දැක්වෙන මූලධර්මවලට අනුකූලව විය යුතුයි

- ආණ්ඩුවේ ක්ෂේත්‍ර තුළ මූල්‍ය වගකීම්වල පැහැදිලි බව
- ආණ්ඩුවේ ක්ෂේත්‍ර සහ පළාත් සභා සහ පළාත් පාලන ඒකක අතර කාර්යක්ෂම හා සාධාරණ ලෙස සම්පත් බෙදා ගැනීම
- වර්තමාන සහ ආනාගත පරපුර අතර සමානව සම්පත් බෙදා ගැනීම
- රාජ්‍ය මූල්‍ය භාවිතයේදී විනිවිදභාවය සහ වගවීම
- ඥානාන්විතව සහ වගකීම් සහිතව මහජන මුදල් භාවිතය
- මූල්‍ය වගකීම සහ වාර්තාකරණය

ඉහත දක්වා ඇති මූලධර්ම ජාතික ප්‍රතිපත්තිය මඟින් බලාත්මක කෙරෙනු ඇත.

iii. **<u>රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වගකීම</u>**

(3) පාර්ලිමේන්තුවේ අධිකාරය මඟින් හෝ යටතේ හැර කිසිදු බද්දක් පැනවීම නොකළයුතු ය.

(4) පාලනයෙහි පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රවලට ප්‍රමාණවත් ආදායම් ප්‍රභව කරා ප්‍රවේශය තිබිය යුතු ය.

(5) නිශ්චිත කාර්යන් වෙනුවෙන් නීති මඟින් යොමු කරනු නොලැබූ ජනරජයේ අරමුදල් එක් ඒකාබද්ධ ගිණුමක තිබිය යුතු අතර සියළු බදු, අය බදු, වරිපනම්, තීරු බදු සහ ගාස්තුවල ආදායම ජනරජයේ අනෙකුත් සියළුම ආදායම් සහ ලැබීම් එයට ගෙවිය යුතු ය.

(i) රාජ්‍ය ණය මත පොළිය, නිදන් අරමුදල් ගෙවීම්, පිරිවැය, ඒකාබද්ධ අරමුදලට මුදල් රැස්කිරීම, කළමානාකරණය හා ලැබීම්වලට අනුෂාංගික අයකිරීම් හා වියදම් හා පාර්ලිමේන්තුව තීරණය කරන්නා වූ වෙනත් කවර හෝ වියදම් ඒකාබද්ධ අරමුදලට අය කළ යුතු ය.

(ii) යම් නිශ්චිත කාර්යයක් වෙනුවෙන් ස්ථාපනය කරන ලද අරමුදලක්, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද්දේ නම් හැර වෙනත් කාර්යයක් වෙනුවෙන් භාවිත කළ නොහැකි ය.

(6) පළාත් සභාවක් වෙත ලැබෙන සියලු ආදායම්, එම පළාත් සභාවට උපචය වන සියලු ගාස්තු, එම සභාව ලබා ගන්නා සියලු ණය සහ එබඳු ණය ආපසු ගෙවීමේදී එම සභාව වෙත ලැබෙන සියලු මුදල් පළාතේ පළාත් අරමුදල ලෙස හැඳින්වෙන එක් අරමුදලක තිබිය යුතු ය.

(7) යම් පළාත් පාලන ආයතනයක, අදාළ නීතිය යටතේ සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ලැබෙන වරිපනම්, එම පළාත් පාලන ආයතනය එහි වගකීම් ඉටු කිරීමේ දී දැරීමට සිදුවන සියලු පිරිවැය, සපයනු ලබන සේවාවන් වෙනුවෙන් එම පළාත් පාලන ආයතනය විසින් අයකරගනු ලබන සියලු ගාස්තු එම පළාත් පාලන ආයතනය විසින් ලබා ගන්නා සියලු ණය සහ එබඳු ණය ආපසු ගෙවීමේ දී එම පළාත් පාලන ආයතනය වෙත ලැබෙන සියලු මුදල් ඇතුළු සියලු ආදායම් අදාළ

පළාත් පාලන ආයතනයේ පළාත් පාලන ආයතන අරමුදල ලෙස හැඳින්වෙන එක් අරමුදලක තිබිය යුතු ය.

iv. **අයවැය ක්‍රියාවලිය ව්‍යුහගත කිරීම:**

(8) ජාතික, පළාත් සභා සහ පළාත් පාලන මට්ටම්වලදී අය වැය සහ අයවැය ක්‍රියාවලි සඳහා ශක්තිමත් මූල්‍ය කළමනාකරණ මූලධර්ම මගින් මඟපෙන්වීම ලැබිය යුතු අතර නීතියට හෝ ප්‍රඥප්තියට අනුකූලව පූර්ණ විනිවිදභාවයෙන් සහ වගවීමෙන් යුක්ත විය යුතු ය.

v. **රාජ්‍ය වියදම් මත පාලනය:**

(9) ඒකාබද්ධ අරමුදලින්, පළාත් අරමුදලකින් හෝ පළාත් පාලන ආයතන අරමුදලකින් මුදල් ආපසු ගැනීම නීතියට හෝ ප්‍රඥප්තියට අනුකූලව සිදු කළ යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධි විධාන සලස්වා ඇති කාර්යයන් වෙනුවෙන් හා ආකාරයෙන් විය යුතු ය.

(i) ඒකාබද්ධ අරමුදලින් මුදල් ආපසු ගැනීම මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරන ලද අවසරයක අධිකාරත්වය යටතේ සිදු විය යුතු ය.

(ii) මුදල් ආපසු ගැනීම සිදු කෙරෙන වර්ෂය තුළ නිශ්චිත පොදු සේවාවන් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් හෝ වෙනත් නීතියක් මගින් එම මුදල ප්‍රදානය කර තිබේනම් හෝ වෙනත් ආකාරයකින් නීත්‍යානුකූලව ඒකාබද්ධ අරමුදලින් අය කෙරෙන්නේ නම් හැර එබඳු අවසරයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(iii) මුදල් වර්ෂය වෙනුවෙන් විසර්ජන පනත් කෙටුම්පත නීතිය බවට සම්මත වීමට පෙර ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවන අවස්ථාවක, ඒ වන විටත් පාර්ලිමේන්තුව ප්‍රතිපාදන සලස්වා නොමැතිව තිබුණොහොත් හැර, නව පාර්ලිමේන්තුවේ රැස්වීම කැඳවනු ලබන දින සිට මාස තුනක කාලයක් ඉකුත්වන තෙක් පොදු සේවාවන් වෙනුවෙන් අවශ්‍ය බවට එතුමන් විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණ ඒකාබද්ධ අරමුදලින් නිකුත් කිරීමට සහ එම මුදල් ප්‍රමාණ වියදම් කිරීමට ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබිය හැක්කේ ය.

(iv) ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණය වෙනුවෙන් දිනයක් හෝ දින නියම කරන අවස්ථාවක, ඒ වන විටත් පාර්ලිමේන්තුව ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලස්වා නොමැතිව තිබුණහොත් හැර, මැතිවරණ කොමසාරිස්වරයාගේ අදහස්ද විමසීමෙන් පසු එබඳු මැතිවරණ වෙනුවෙන් අවශ්‍ය බවට එතුමන් විසින් සලකනු ලබන මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලින් නිකුත් කිරීමට සහ එම මුදල් ප්‍රමාණය වියදම් කිරීමට ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබිය හැක්කේ ය.

(10) එවන් පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අවසර ලබා දෙන වෙනත් ක්‍රමයකින් අනුමැතිය ලබා දී ඇත්නම් මිස අමාත්‍යවරයකු හැරුණු විට වෙනත් පුද්ගලයකු විසින් ජනරජයේ අනෙකුත් අරමුදල් තාවකාලිකව බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දෙන, හෝ කවර හෝ බද්දක් පනවන, හෝ අවලංගු කරන වැඩි කරවන හෝ අඩු කරවන පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරනු ඇත.

i නියම කරනු ලබන ප්‍රධාන ගිණුම් නිලධාරියාගේ මඟ පෙන්වීම, පාලනය සහ අධීක්ෂණයට යටත්ව සහ ගිණුම් කිරීමේ වගකීම යටතේ අවසර සැලසීමේ බලපත්‍රයේ දක්වා ඇති පරිදි සියලුම අවශ්‍යතාවන් සඳහා අදාළ අවස්ථාවට අනුව එලෙස නැවත ලබා ගනු ලබන සියලුම මුදල් අදාළ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව හෝ අනෙකුත් ආයතන හෝ ව්‍යාපාර මගින් රඳවා තබා ගැනීම හෝ වැය කිරීම කළ යුත්තේ ය.

ii මෙහි කලින් සඳහන් කරන ලද පරිදි මෙම කටයුත්ත සඳහා ප්‍රධාන ගිණුම් නිලධාරියා වනුයේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර එවන් අරමුදල් වෙන් කිරීම් තුළින් අපේක්ෂා කරනු ලබන ඉලක්ක සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සහ අත්පත් කර ගැනීම සහතික කරමින් එවන් අරමුදල් රඳවා තබා ගැනීම හෝ වැය කිරීම පිළිබඳ වගකීම දරනුයේ ඔහු විසිනි.

(මෙම නිර්දේශය තුළින් දැනට පවත්නා 52(2) වගන්තියට පහත පිරිදි සංශෝධන සිදු කිරීම අවශ්‍ය වේ.)

43(2) සහ 44(2) වගන්ති අනුව අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්ය භාර්යයන් වශයෙන් අමාත්‍යවරයාට පැවරී ඇති රජයේ දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවල පොදු පරිපාලනමය පාලන කටයුතු පරීක්ෂා කිරීම් සහ

අධීක්ෂණය තම අමාත්‍යවරයාගේ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ක්‍රියාවෙහි යෙදවිය යුතු අතර එවන් අමාත්‍යාංශයක ප්‍රධාන ගිණුම් නිලධාරියා ලෙස පත් කර ගනු ලබන්නේ වන අතර, එම තනතුරේදී පැවරී ඇති විෂයයන් සහ වගකීම් සඳහා වගකීම සාධනීය අයුරින් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා ද සමඟින් වගකිව යුතු වන්නේ ය.

vi. **ණය ගැනීම සහ අසම්භාව්‍ය වගකීම් පිළිබඳ පාලනය**

(11) පාර්ලිමේන්තුව විසින් කලින් කලට නියම කරනු ලබන සීමාවන් තුළ සිට ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදල ඇපයට තබමින්, සෘජු සහ වක්‍ර ණය ගැනීම් සිදු කිරීම දක්වා ජනරජයේ විධායක බලය ව්‍යාප්ත වන අතර එලෙස නියම කරනු ලබන පරිදි එවන් ඇපයන් ලබාදීමද එයට අදාළ වේ.

(12) මෙම පරිච්ඡේදයේ විධි විධානයන් එසේ තිබියෙදී, හදිසි සහ බලාපොරොත්තු නොවූ වියදම් සඳහා ඉඩකඩ සැලසීමේ අරමුණින් පාර්ලිමේන්තුව විසින් නීතියට අනුව සම්භාව්‍යතා අරමුදලක් නිර්මාණය කළ හැක්කේ ය.

(i) මුදල් විෂය භාරව කැබිනට් මණ්ඩලය තුළ සිටින අමාත්‍යවරයා විසින්:

- එවන් කවර හෝ වියදම් සිදුකිරීම සඳහා අවශ්‍යතාව පවතින බවට, සහ
- එවන් වියදම් සිදු කිරීම සඳහා කවර හෝ විධිවිධානයක් නොපවතින බවට සෑහීමකට පත්වනුයේ නම්,
- පාර්ලිමේන්තුවේ අපර අනුමැතිය ලබා ගැනීමට නියමිතව සම්භාව්‍යතා අරමුදලෙන් අත්තිකාරමක් වශයෙන් ලබා දීමට බලය ලබාදිය හැක්කේ ය.
- එවන් සෑම අත්තිකාරම් ලබාදීමකින් ම පසුව මාස තුනක කාල පරිච්ඡේදයක් ඇතුළත, එලෙස අත්තිකාරම් ලෙස ලබා දෙන මුදල ස්ථාපනය කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුත්තේ ය.

(13) පළාත් සභාවක් විසින් අසම්භව්‍යතා අරමුදලක් වශයෙන් නම් කරනු ලබන අග්‍රිමය ස්වරූපයේ අසම්භාව්‍යතා අරමුදලක් ව්‍යවස්ථාව පිරිදි ස්ථාපිත කළ හැකි අතර, එවන් ව්‍යවස්ථාවක් මඟින් තීරණය කරනු ලබන පරිදි කලින් කලට එවන් මුදල් මෙම අරමුදලට ගෙවනු ලැබිය හැක්කේ ය, සහ බලාපොරොත්තු නොවූ වියදම් සිදු කිරීමේ කාර්යය සඳහා පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ කැමැත්ත සහිතව එවන් අරමුදලකින් පළාත් අමාත්‍ය මණ්ඩලයේ විෂය භාර අමාත්‍යවරයාගේ නියම කිරීම පරිදි අත්තිකාරම් ගෙවීම් සිදු කිරීම සඳහා යොදා ගත හැක්කේ ය. සහ එවන් තවත් අත්තිකාරම් ලබාදීමකින් පසුව මාසයක කාලසීමාවක් ඇතුළත එලෙස අත්තිකාරම් වශයෙන් ලබා දී ඇති මුදල් ප්‍රමාණ ප්‍රතිස්ථාපනය කිරීමේ කාර්යයන් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

vii. **පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය ආන්තීකරණයට ලක් කිරීම**

(14) රජයේ ක්ෂේත්‍රයන් වන පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති වියදම් වගකීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන පරිදි ජාතික වශයෙන් උපයා ගන්නා ලද ආදායමේ සමාන කොටස් පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයන් වෙත සපයනු ලැබිය යුත්තේ ය.

(15) ජාතික වශයෙන් උපයා ගන්නා ලද ආදායමේ එවන් කොටස් වෙන් කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන මූල්‍ය විමධ්‍යගත රාමුවක් පාර්ලිමේන්තුවේ සභාගතකොට අනුමත කරනු ලබන අතර එම රාමුව තුළ රජයේ වාර්ෂික අයවැයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයන් වෙත වාර්ෂික ප්‍රදාන වෙන් කිරීම් සිදු කරනු ලැබිය යුතු ය.

(i) පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා වන සාධාරණ මධ්‍ය කාලීන සහ වාර්ෂික කොටස් වෙන් කිරීම් තීරණය කිරීම තුළින් පහත ඉඩ කඩ සැලසෙන්නේ ය.

- ජාතික, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයන්ගේ අදාළ එක් එක් කොටස් තීරණය කිරීම
- පළාත් සභා සඳහා වෙන් කරන ලද කොටසින් එක් එක් පළාත් සභාවේ කොටස තීරණය කිරීම
- පළාත් පාලන ආයතන සඳහා වෙන් කරන ලද කොටසින් එක් එක් පළාත් පාලන ආයතන සඳහා වන කොටස තීරණය කිරීම
- විශේෂ කාර්යයන් සඳහා පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතන බල ප්‍රදේශකට, ජාතික වශයෙන් වෙන් කරන ලද කොටසෙන් සිදු කරනු ලබන වෙනත් කවර හෝ වෙන් කිරීම්

ජාතික වශයෙන් උපයා ගන්නා ලද ආදායමේ එවන් කොටස් වෙන් කිරීම සඳහා තුන් අවුරුදු මධ්‍යකාලීන මූල්‍ය විමධ්‍යගත රාමුවක් පාර්ලිමේනතුවේ සභාගතකොට අනුමත කරනු ලබන අතර එම රාමුව තුළ රජයේ වාර්ෂිනක අයවැයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයන් වෙත වාර්ෂික ප්‍රධාන වෙන් කිරීම් සිදු කරනු ලැබිය යුතු ය.

(ii) මධ්‍ය කාලීන සහ වාර්ෂික සාධාරණ කොටස් වෙන් කිරීම් පිළිබඳ එවන් තීරණය කීරිමක් පහත සඳහන් තත්ත්වයන් සැලැකිල්ලට ගනු ලබන්නේ ය.

- ජාතික රාජ්‍ය මූල්‍ය බැඳීම්.
- රජයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන කෂේත්‍රයන් වෙත පැවරී ඇති විෂයයන් සහ කාර්යභාරයන් සම්බන්ධයෙන් වන වගකීම් ඉටු කිරීම තුළ ස්වාධීනත්වය, සාධාරණත්වය, කාර්යක්ෂමභාවය සහ ප්‍රමාණවත් බව,
- රජයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති විෂයයන් සහ කාර්ය භාර්යයන් සම්බන්ධයෙන් වන වගකීම් ඉටු කිරීමේ දී එවන් පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල අවශ්‍යතා, නියමයන් සහ කාර්යසාධනය,
- ජාතික, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයන් අතර සංවර්ධන වැඩසටහන්වලදී රාජ්‍ය මුදල් භාවිතාවේ යෙදවීම සම්බන්ධයෙන් කාර්යක්ෂම සහ සාධාරණ සම්පත් බෙදා හදා ගැනීම.
- පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයන්ට අදාළ බල සීමාවන් තුළ පුරවැසියන් විසින් සිදු කරනු ලබන දියුණු මට්ටමේ සේවා සැපයීමේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා එම ක්ෂේත්‍රයන් වෙත හැකියාව නිර්මාණය කරමින් සම්පත් වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ප්‍රගාමී වැඩිදියුණුව.

(16) පළාත් සභා සඳහා වන සාධාරණ කොටස පළාත් අතර නිසි පරිදි බෙදා වෙන් කිරීම තුළ පළාත් තුළ වියදම් සිදු කිරීමේ වගකීම් සපුරාලීම සඳහා පළාත්වල මූල්‍ය ශක්‍යතාවයන් සමාන තත්ත්වයට පත්කිරීමේ පරමාර්ථය තිබිය යුතු අතර, රාජ්‍ය මූල්‍ය පිළිබඳ මූලධර්ම තුළින් එයට මඟ පෙන්වීම සැලසිය යුතු ය. මෙහිදී පහත තත්ත්වයන් සැලකිල්ලට ගැනීමද අවශ්‍ය වේ.

- එක් එක් පළාතේ ජනගහනය
- එක් එක් පළාතේ භූමි ප්‍රමාණය
- පළාත තුළ සිටින සියලු පුද්ගලයින් ඇතුළත් වන පිරිදි සේවාවන් වෙත සාධාරණ ප්‍රවේශය
- පළාත් අතර සමාජ සහ ආර්ථික විෂමතාවන් අඩු කිරීම ක්‍රමිකව සිදු කිරීමේ අවශ්‍යතාව ය.
- පළාත් සභා ක්ෂේත්‍රයට පැවරී ඇති විෂයයන් සහ කාර්යභාර්යයන් සම්බන්ධයෙන් එක් එක් පළාත තුළ සපයනු ලබන රාජ්‍ය සේවාවන්ගේ තත්ත්වය.
- පළාත් සභා කෂේත්‍රයට පැවරී ඇති විෂයයන් සහ කාර්යභාරයන් සම්බන්ධයෙන් ගත් කල අදාළ පළාත විසින් සේවා සැපයීම තුළ මුහුණ දෙනු ලබන කවර හෝ බාධාවන්.

(17) පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා වන සාධාරණ කොටස් සඳහා වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම් ජාතික භාණ්ඩාගාරය විසින් එක් එක් පළාත් භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබේ.

- පහත 11.6.1. යටතේ දක්වා ඇති පරිදි පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයන් සඳහා වන සාධාරණ කොටස් පළාත් භාණ්ඩාගාරය මඟින් ගෙවනු ලැබේ.

(18) රජයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන දක්ෂ වියදම් කිරීමේ නිසි බලධාරීන් වන්නේ ය.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහ පළාත් පාලන ක්ෂේත්‍රය පාලනය කරනු ලබන අදාළ නීතීන් තුළ දක්වා ඇති පරිදි රජයේ පළාත් සභා ක්ෂේත්‍රය වෙත බදු නියම කිරීමේ දී දක්වා ඇති පරිදි බදු, අයබදු සහ තීරුබදු පැනවීම.

- කෙසේ වුවද, පළාත් සභාවක් විසින් පළාතේ ජනතාවගේ සමාජ සහ ආර්ථික හිමිකම් ප්‍රගාමී අයුරින් සාක්ෂාත් කර ගැනීම සිදු කිරීම සඳහා පළාතේ සම්පත් ඉහළ නැංවීමට අවශ්‍ය වන සහ අනුයෝජිත්වය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල මූලධර්මයට අනුකූලව, සාධාරණ වන තත්ත්වයන් යටතේ ජාතික සහ පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයන්ගේ ආදායම් හිමිකම් හා නොගැටෙන මූලාශ්‍රයන්ගෙන් ආදායම් ඉහළ නංවාගත හැක්කේ ය.

- එවන් මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා ආදායම් සැලකීමේ දී, මුදල් කොමිෂන් සභාව මඟින් නියම කරනු ලබන පරිදි, අදාළ පළාත විසින් යම් කොටසක් වෙන් කරනු ලැබිය හැකි අතර, පහත 10.6.1. යටතේ දක්වා ඇති පළාත් මූල්‍ය අනු කමිටුව මඟින් සම්පාදනය කරනු ලබන මූලධර්මයන්ට අනුකූලව එම කොටස් වෙන් කිරීම් සිදු කරනු ලැබිය යුතුය.

- ආයෝජන සහ වර්ධන අවස්ථාවන් සඳහා තරග කිරීමෙන් පළාතේ යහපත වෙනුවෙන් ඉවහල් වන විට, එවන් ආදායම් ගෙවීම්වලින් නිදහස් කරන්නා වූ දිරි දීමනා ප්‍රදානය කිරීමට බලය පළාත් සභාවක් සතු විය යුතුය.

(ii) පාර්ලිමේන්තුව මගින් සකසනු ලබන කවර හෝ නීතියක් මඟින් හෝ නීතියක් යටතේ ඉඩකඩ සලසනු ලබන ප්‍රමාණයට දේශීය වශයෙන් මුදල් ණයට ගැනීම සහ ප්‍රදාන අරමුදල් වෙත ප්‍රවේශය.

- එවන් ණය ගැනීම් පළාතේ පළාත් අරමුදල ඇපයක් වශයෙන් සලකා සිදුකළ යුත්තේය.

(iii) පළාත් සභාවන් සහ පළාත් පාලන ආයතනයන් වෙත පැවරී ඇති විෂයයන් සහ කාර්ය භාරයන් සඳහා පළාත් අරමුදල සහ පළාත් පාලන ආයතන අරමුදල වෙත පළාත් සභාවක් සහ පළාත් පාලන ආයතනයක් විසින් ගෙවනු ලබන රාජ්‍ය මුදල් වියදම් කිරීම.

- පළාත් සභාවන් සහ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති විෂයයන් සහ කාර්ය භාරයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවාවන් සැලසීමේ දී අදාළ අරමුදල්වලින් මුදල් වෙන් කරනු ලබන අරමුණු තීරණය කිරීමේ බලය පළාත් සභාවන් සහ පළාත් පාලන ආයතනයන් සතු විය යුතුය.

- යම් විශේෂිත අරමුණු සඳහා මුදල් වෙන් කිරීම සපයා ඇති විටෙක, එවන් අරමුදල් එම අදාළ විශේෂිත අරමුණු සඳහා පමණක් වැය කළ යුත්තේය.

(19) ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන මූල්‍ය කොමිෂන් සභාවක් පවතිනු ලබන අතර, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් මෙම පරිච්ඡේදය තුළ දක්වා ඇති නිර්දේශයන් එම කොමිෂන් සභාවෙන් සිදු කරනු ලැබේ.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට පමණක් යටත්ව කොමිෂන් සභාව ස්වාධීනව කටයුතු කරනු ලබන අතර, එහි බලතල සහ ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් නීතිය මඟින් සලසනු ලබන විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක වනු ලබන්නේ ය.

(ii) කොමිෂන් සභාව පහත කාන්තාවන් සහ පුරුෂයින්ගෙන් සමන්විත වන්නේ ය.

- කොමිෂන් සභාව තුළ ප්‍රධාන ජනවර්ග ත්‍රිත්වය නියෝජනය වන බවට සහතික කරමින් මුදල්, නීතිය, පරිපාලනය, ව්‍යාපාර හෝ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් තුළ අග්‍රගණ්‍ය තත්ත්වයක් අත්පත් කරගෙන තිබෙන හෝ ඉහළ නිලතල දරා ඇති සාමාජිකයින් පස් දෙනෙකු
- නීතිය මගින් පනවා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව පළාත් නියෝජනය කිරීම සඳහා සාමාජිකයින් තිදෙනෙක්
- නීතිය මගින් පනවා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සඳහා එක් සාමාජිකයෙකු
  - ඉහත (i) යටතේ පත්කිරීමට නියමිත අය අතරින් එක් සාමාජිකයකු කොමිසමේ සභාපතිවරයා වශයෙන් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන්නේ ය.

(ii) ඉහත 3(අ) පරිදි පත් කරනු ලබන කොමිසමේ සෑම සාමාජිකයකුම, නියමිත කාලසීමාව ඉකුත් වීමට පෙර ඉල්ලා

පළාත් සභාවන් සහ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති විෂයයන් සහ කාර්ය භාරයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවාවන් සැලසීමේ දී අදාළ අරමුදල්වලින් මුදල් වෙන් කරනු ලබන අරමුණු තීරණය කිරීමේ බලය පළාත් සභාවන් සහ පළාත් පාලන ආයතනයන් සතු විය යුතුය.

අස්වනුයේ නම් හැරුණු විට, වසර පහක කාලසීමාවක් සඳහා එම තනතුර දරනු ලබන්නේය. 3(ii) සහ 3(iii) යටතේ පත්කරනු ලබන මන්ත්‍රීවරුන් නීතිය මගින් දක්වා ඇති පරිදි තනතුරු දරනු ලබන්නේ ය.

(iii) රජයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙතට ආදායම පිළිබඳ සමාන කොටස් වෙන් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් පරිච්ඡේදය යටතේ දක්වා ඇති කරුණු පිළිබඳව කොමිසම විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කරනු ලැබෙන අතර වියදම් කිරීමේ නිසි බලධාරීන් වශයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් එලෙස සිදුකිරීමේ දී අදාළ වගන්ති යටතේ දක්වා ඇති විධිවිධාන සැලකිල්ලට ගත යුත්තේය.

(iv) පළාත් අතර පළාත් පාලන ආයතන වෙත වෙන්කරන ලද ජාතික ආදායමේ සාධාරණ කොටස නිසි පරිදි බෙදා වෙන් කිරීම පිළිබඳව කොමිෂන් සභාව විසින් නිර්දේශ සිදුකරනු ලබන්නේය.

(v) නීතිය යටතේ පිහිටුවන ලද පළාත් මූල්‍ය උප කමිටු විසින් පළාත තුළ අදාළ පළාත් පාලන ආයතන අතර බෙදීමට පළාත් වශයෙන් වෙන් කරන ලද මුදල් ප්‍රමාණය නිසි පරිදි බෙදා වෙන් කරනු ලබන්නේය.

(vi) කොමිෂන් සභාව විසින් එය වෙත ජනාධිපතිවරයා විසින් යොමු කරන ලද පරිදි පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය හා සම්බන්ධ අන් කවර හෝ කරුණක් පිළිබඳව නිර්දේශ සිදු කරනු ලබන්නේය.

(vii) කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සෑම නිර්දේශයක්ම පාර්ලිමේන්තුව ඉදිරියට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා විසින් කටයුතු කරනු ලබන අතර ඉන්පසුව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලබන්නේය.

(viii) පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය සම්බන්ධයෙන් වන කරුණු අනුමත කිරීමේදී පාර්ලිමේන්තුව මූල්‍ය කොමිෂන් සභාවේ නිර්දේශයන් පිළිබඳව නිසි දැනුවත්භාවයක් ලබන්නේ ය.

(20) අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් මූලාසනය දරනු ලබන සහ පළාත් අමාත්‍ය මණ්ඩලයන්හි මුදල් විෂයභාර අමාත්‍යවරුන්ගෙන් සමන්විත වන මුදල් අමාත්‍යවරුන්ගේ සංසදයක්, පළාත් පාලන ආයතන සහ පළාත් සභාවන්ගේ මූල්‍ය කටයුතු ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් ජාතික, පළාත් සහ පළාත් පාලන ආයතන අංශයන් අතර ප්‍රමාණවත් සාකච්ඡා කිරීම් සඳහා ඉඩකඩ සලසනු වස් අර්ධ වාර්ෂික වශයෙන් රැස්විය යුතුය. භාණ්ඩාගාර ලේකම්වරයා සහ මූල්‍ය කොමිෂන් සභාවේ සභාපතිවරයා මෙම සංසදය සඳහා සම ලේකම්වරුන් වශයෙන් කටයුතු කළ යුතුය.

viii **රාජ්‍ය මුදල් පිළිබඳ පාලනය**

(21) ජාතික අය වැය පිළිබඳව පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම.

(22) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ගැනීම් සහ අසම්භාව්‍යතා වගකීම් තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම.

(23) පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පිළිබඳව මූල්‍ය කොමිෂන් සභාව විසින් වාර්ෂිකව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිතය.

ix **වෙනත්**

(24) සේවක සංඛ්‍යා, වැටුප් සහ නියමයන් සහ කොන්දේසි ආවරණය කරනු ලබන ව්‍යවස්ථානුකූල කාර්යාලවල වැය ශීර්ෂ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට යටත් විය යුත්තේ ය.

අධිකරණය පිළිබඳ අනුකාරක සභා වාර්තාවේ සාරාංශය:

අධිකරණය පිළිබඳ අනුකාරක සභාව පහත සඳහන් ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

- අධිකරණයේ ස්වාධීනත්වය
- අධිකරණ සංවිධාන ව්‍යුහය
- අධිකරණ සමාලෝචනය ඇතුළුව අධිකරණවල අධිකරණ බලය
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය හා එහි අධිකරණ බලය

1. අධිකරණයේ ස්වාධීනත්වය

අධිකරණ ක්ෂේත්‍රය තුළ රට මුහුණ පා ඇති අත්දැකීම් සැලකිල්ලට ගනිමින්, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ මූල ධර්මය තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා කිසියම් ප්‍රකාශිත විධි විධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට ඇතුළත් කිරීම සුදුසු බව අනුකාරක සභාව නිර්දේශ කරයි.

රජයේ විධායක සහ ව්‍යවස්ථාදායක යන ආයතනවලින් අධිකරණය ස්වාධීන බවට සහ අධිකරණයේ කටයුතු හා ක්‍රියාවලීන්ට මැදිහත්වීමට කිසිදු බලධාරියෙකුහට කිසිදු බලයක් නොමැති බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පැහැදිලි විධි විධාන සැලසිය හැකි ය.

විනිසුරුවන් විසින් සිය කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරීමේදී කිසියම් පුද්ගලයකු හෝ නිලධාරියෙකු විසින් සෘජුවම හෝ අනියම් ලෙස සිදු කරනු ලබන කිසියම් වූ සීමා කිරීම්, බලපෑම්, මැදිහත්වීම්, පෙළඹවීම්, බියගැන්වීම්වලින් තොරව ක්‍රියා කළ යුතු බවට සහ නීතිය හා කරුණු බවට තමා විසින් කල්පනා කරනු ලබන ආකාරයට අදාළ කරුණු කෙරෙහි නීතිය යොදවමින් අධිකරණමය හෘද සාක්ෂියට අනුකූලව කටයුතු කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් තවදුරටත් විධි විධාන සැලසිය හැකි ය.

මේ සම්බන්ධව දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කරුණුද උපුටා දක්වා ඇත.

165 වන වගන්තිය ප්‍රකාරව විධි විධාන සලසා දෙනු ලබන පරිදි,

- අධිකරණය ස්වාධීන ආයතනයක් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියට පමණක් යටත්ව ක්‍රියා කරනු ලබයි.
- ඒවා විසින් අපක්ෂපාතී ලෙස සහ කිසිදු බියකින්, අනුග්‍රහය දැක්වීමකින් හෝ අගතියකින් තොරව නීතිය ක්‍රියාත්මක කරනු ලැබේ.
- කිසිදු පුද්ගලයකු හෝ රජයේ ආයතනයක් අධිකරණයේ කටයුතුවලට මැදිහත් නොවිය යුතු ය.
- අධිකරණවල ස්වාධීනත්වය, අපක්ෂපාතී බව, ගරුත්වය, යුක්තිය කරා ප්‍රවේශවීමට ඇති ඉඩ කඩ සහ අධිකරණවල කාර්ය සාධකත්වය තහවුරු කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් නීති සම්පාදනය හා අනිකුත් පියවර මඟින් අධිකරණයට සහාය වීම සහ ආරක්ෂා කිරීම සිදු කළ යුතු වේ.
- ජනතාවගේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සෘජුවම අධිකරණ වෙත පැවරීම අත්‍යාවශ්‍ය හා යෝග්‍ය කටයුත්තක් වේ.

එකී අධිකරණ බලය පාර්ලිමේන්තුව මඟින් අධිකරණ හා විනිශ්චය සභා හරහා ක්‍රියාත්මක කරනු ලබන වර්තමාන ක්‍රමවේදය අසතුටුදායක වන අතර, එය වෙනස් කළ යුතු වේ. මෙමඟින් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ මූල ධර්මය තවදුරටත් ශක්තිමත් කිරීමද සිදු කරනු ඇත.

විශේෂිත විනිශ්චය කිරීමේ බලතල හා විකල්ප ආරවුල් නිරාකරණ බලතල හිමි ආයතන එනම් අර්ධ අධිකරණ ආයතන අධිකරණය වෙත පැවරී ඇති අධිකරණමය බලය අනුපූරණය කරනු පිණිස නියත කරුණු අරභයා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති ප්‍රකාරව පිහිටුවිය හැකි ය.

අධිකරණවල ස්වාධීනත්වය, අපක්ෂපාතී බව, ගරුත්වය, යුක්තිය කරා ප්‍රවේශවීමට ඇති ඉඩ කඩ සහ අධිකරණවල කාර්ය සාධකත්වය තහවුරු කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් නීති සම්පාදනය හා අනිකුත් පියවර මගින් අධිකරණයට සහාය වීම සහ ආරක්ෂා කිරීම සිදු කළ යුතු වේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයෙහි විනිසුරුවන් පත් කිරීම, සේවා කාලය, විශ්‍රාම යාම, සේවකයන් ඉවත් කිරීම, විනය පාලනය, වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ, විශ්‍රාම ලැබූ පසු රැකියා අවස්ථා ලබාදීම, වෙනත් සේවාවන් සඳහා ඔවුන් යෙදවීම පිළිබඳ ප්‍රතිඥාවන්ට අමතර ප්‍රාකාශිත ඒ5තිඥාවන් මෙහි අන්තර්ගත වේ.

පත්කිරීම:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගෙන් සැදුම් ලත් මණ්ඩලයක් වෙතින් ලද නාම යෝජනා අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත උපරිමාධිකරණවල විනිසුරුවරුන් ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු වේ.

එම හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මණ්ඩලයට හිටපු අගවිනිසුරුවරයෙකු ද ඇතුළත් වන අතර එකී මණ්ඩලය සඳහා දැනට ධුරයේ සිටින අගවිනිසුරුවරයා විසින් නීතිපතිවරයා සහ නීතිඥ සංගමයේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කොට සාමජිකයන් නම් කළ යුතු වේ.

හිටපු ශේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් මෙම මණ්ඩලයට පත් කිරීමේ දී ඔවුන් විශ්‍රාම ලැබූ දිනය හා ඔවුන් මෙම මණ්ඩලයට පත් කරනු ලබන දිනය අතර අවම වශයෙන් අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගත වී තිබිය යුතු වේ.

විශ්‍රාම ගැනීමේ වයස:

සියලුම උපරිමාධිකරණය විනිසුරුවරුන්ග් විශ්‍රාම ගැනීමේ වයස එකම වයසක් විය යුතු අතර එම වයස අවුරුදු 65 වේ නම් වඩාත් සුදුසු වේ.

සමහර විනිසුරුවරුන් විශ්‍රාම ලැබූ පසු ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත පහළ අධිකරණවල විනිසුරුවරුන්ගේ නිපුණතාවය සහ සේවා සැපයීම දියුණු කිරීම හා වැඩි දියුණු කිරීම උදෙසා එම විනිසුරුවරුන්හට උපදෙස් ලබා දීම සහ ඔවුන් අධීක්ෂණය කිරීම සඳහා සේවයේ යෙදවිය හැකි ය. මෙම විනිසුරුවරුන්ට වයස අවුරුදු 70 දක්වා සේවය කළ හැකි ය.

විනිසුරුවරුන්ගේ වැටුප්:

උපරිමාධිකරණවල විනිසුරුවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු අතර එම වැටුප් විනිසුරුවරු ධුරය දරන කාලය තුළදී අඩු නොකළ යුතු වේ.

සියලුම උපරිමාධිකරණවල විනිසුරුවරුන්ගේ වැටුප එක සමාන විය යුතු ය.

විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම:

උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සඳහා උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විනය පාලන කොමිෂන් සභාවක් තිබිය යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් එහි සාමාජිකයින් පත් කළ යුතු වේ. කිසියම් විෂමචාරයක් හෝ අබලතාවක් පිළිබඳ චෝදනා එම කොමිෂන් සභාව විසින් විමර්ශනය කර ඒ පිළිබඳ වාර්තාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කළ යුතු වේ.

එවැනි කිසියම් විනිසුරුවරයෙකු සේවයෙන් පහ කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සතු වන අතර ජනාධිපතිවරයා විසින් ඉන් අනතුරුව එකී විනිසුරුවරයා සේවයෙන් පහ කළ යුතු වේ.

කෙසේ වුවද එලෙස විනිසුරුවරයෙකු සේවයෙන් පහ කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කරනු ලබන නිර්දේශය ජනාධිපතිවරයා වෙත යැවීමට ප්‍රථම එකී

නිර්දේශය පාර්ලිමේනතුව විසින් අනුමත කළ යුතු වේ.

විශ්‍රාම ගැන්විමේදී ගෙවීම්:

උපරිමාධිකරණවල විනිසුරුන් හට ඔවුන් විශ්‍රාම ලබන අවස්ථාවේදී ලැබුණු ඒකාබද්ධ පාරිශ්‍රමික (වැටුප් සහ දීමනා) හෝ ප්‍රවර්තන කාලයෙහි විනිසුරුවරුන් හට ලැබෙන ඒකාබද්ධ පාරිශ්‍රමිකය (වැටුප හා දීමනාව) යන දෙකින් වැඩි පාරිශ්‍රමිකය විශ්‍රාම වැටුප ලෙස ලබා දිය යුතු බව කාරක සභාවේ මතය වේ.

දැනට සේවයේ නියුතු හෝ විශ්‍රාම ලැබූ විනිසුරුවරුන්හට වෙනත් කාර්යයක් සිදු කිරීම සඳහා ආරාධනා කිරීම:

වෙනත් කාර්යයක් ඉටු කිරීම සඳහා සේවයේ නිරත කරවීමට විනිසුරුවරුන් යෝග්‍ය වුවද, උපරිමාධිකරණවල විනිසුරුවරුන්ගේ ස්වාධීනත්වය සැබැවින්ම නැතිවී යන සහ එලෙස නැති වී යතැයි සිතිය හැකි තත්ත්වයක් උදාවීම වැළැක්වීම සඳහා වැටුප් ලබන හෝ වැටුප් නොලබන කිසියම් කාර්යයක් සිදු කිරීමට භාර ගැනීමට දැනට සේවයේ නියුතු හෝ විශ්‍රාමික විනිසුරුවරුන්හට අවසර ලබා නොදීම යෝග්‍ය බව අනුකාරක සභාවේ මතය වේ.

කෙසේ වුවද, උපරිමාධිකරණවල සහ අනිකුත් අධිකරණවල විනිසුරුවරුන්හට සීමිත කෙටි කාලසීමාවන් කීපයක් විදේශීය අධිකරණවල සේවය කිරීමට අවසර ලබාදී විදේශීය රටවල අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් අනුකාරක සභාවේ විරුද්ධත්වයක් නොමැත.

උපරිමාධිකරණවල විනිසුරුවරුන්හට ඔවුන්ගේ නිලය හා පුහුණුව සඳහා යෝග්‍ය තනතුරු භාර ගැනීමට අවසර දෙනු ලැබූ කල්හිම එම කාල පරිච්ඡේදය තුළ දී ඔවුන්හට වැටුප් රහිත නිවාඩු ලබා දිය යුතු වේ. මේ සඳහා අනුමැතිය ලබාදීමේ දී විදේශරටවල අධිකරණ පද්ධති සහ ප්‍රජාතාන්ත්‍රීය ස්වභාවය පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ.

එවැනි ඉල්ලීම් සඳහා අවසර ලබාදීමේ බලය ඇත්තේ ජනාධිපතිවරයාට වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඒ සඳහා තම නිර්දේශ ජනාධිපතිවරයයාට ලබා දීමට පෙර එකී ඉල්ලීම් ඇගයීමට ලක් කළ යුතු වේ.

මෙහිදී, මෙලෙස විනිසුරුවරුන් කෙටි කාලයක් සඳහා විදේශගතවීම නිසා ඇති වන පුරප්පාඩු පිරවීමට සහ රටෙහි අධිකරණයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ පෝෂණය කිරීම සඳහා උපරිමාධිකරණ සඳහා කෙටි කාලීනව විටින් විට සිදු කරනුලබන විනිසුරුවරුන්ගේ පත් කිරීම ප්‍රධාන පෙළේ නීතිඥවරුන් අතුරින් සිදු කළ හැකි බව අනුකාරක සභාවේ අදහස වේ.

2. අධිකරණ සංවිධාන ව්‍යුහයː

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිළිගත යුතු අධිකරණ සංවිධාන ව්‍යුහය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය

↓

අභියාචනාධිකරණය සහ පළාත් බද අභියාචනාධිකරණය

↓

ශ්‍රී ලංකාවේ මහාධිකරණය

අනිකුත් අධිකරණ සහ ඒවායේ ව්‍යුහය සම්බන්ධයෙන් පාර්ලිමේනතුව විසින් සම්මත කරනු ලබන නීති ප්‍රකාරව විධි විධාන සැලසිය යුතු වේ. දිසා අධිකරණය, පවුල් අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, ප්‍රාථමික අධිකරණය/සුළු හිමිකම් අධිකරණය අනිකුත් අධිකරණ විය යුතු බවට අනුකාරක සභාව විසින් පිළිගනියි.

3. අධිකරණවල සංයුතිය හා අධිකරණ බලය

ශ්‍රේෂ්ඨාධිකරණය විනිසුරුවන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත වේ. රටෙහි අවසාන අභියාචන අධිකරණ බලය ඇත්තේ මෙම අධිකරණය වෙතය. එම අධිකරණයට කිසිදු ප්‍රථමවර අධිකරණ බලයක් නොමැත.

අභියාචනාධිකරණය විනිසුරුවරුන් හතළිස් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. පළාත් බඳව අභියාචනාධිකරණ ස්ථාපිත කළ යුතු අතර , එම අධිකරණ අදාළ පළාත්බද අභියාචනාධිකරණයන් ලෙස හැඳින් වේ.

අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුවරයා විසින් පළාත් බද අභියාචනාධිකරණවල නඩු විභාග කරන විසුරුවරුන් අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් අතරින් නම් කළ යුතු ය.

අභියාචනාධිකරණයේ විවිධ අංශ ද තිබිය හැකි ය. උදාහණයක් ලෙස අභියාචනාධිකරණයෙහි අපරාධ අංශයක් සහ වාණිජ අංශයක් ඇත.

මූලික අයිතිවාසිකම් සහ රිට් ආඥා නිකුත් කිරීම සඳහා අධිකරණ බලය අභියාචනාධිකරණය සතු වනු ඇත.

මුල් අවස්ථා අධිකරණ එනම් මහාධිකරණය. දිසා අධිකරණය, පවුල් අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය සහ ප්‍රාථමික අධිකරණ/සුළු හිමිකම් අධිකරණ වෙතින් සිදු කරනු ලබන

අනිකුත් අධිකරණ සහ ඒවායේ ව්‍යුහය සම්බන්ධයෙන් පාර්ලිමේනතුව විසින් සම්මත කරනු ලබන නීති ප්‍රකාරව විධි විධාන සැලසිය යුතු වේ. දිසා අධිකරණය, පවුල් අධිකරණය, මහෙස්ත්‍රාත් අධිකරණය, ප්‍රාථමික අධිකරණය/සුළු හිමිකම් අධිකරණය අනිකුත් අධිකරණ විය යුතු බවට අනුකාරක සභාව විසින් පිළිගනියි.

අධිකරණ කටයුතු පිළිබඳව අභියාචනා අධිකරණ බලය මෙම අධිකරණය සතු වනු ඇත.

කම්කරු විනිශ්චය සභාව, ගොවිජන සේවා විනිශ්චය සභාවසහ ඒ හා සමාන අර්ධ අධිකරණ ආයතන වෙතින් යොමු වන අභභියාචනා ද අභියාචනාධිකරණය විසින් විභාග කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ මහාධිකරණය

බරපතල අපරාධ සම්බන්ධයෙන් අපරාධ අධිකරණ බල පැවරී ඇත්තේ මහාධිකරණය වෙත ය. මහාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දු හා සම්බන්ධ අභියාචනා අභියාචනාධිකරණයේ අපරාධ අංශය හෝ කොළඹ පිහිටි අභියාචනාධිකරණය විසින් විභාග කළ යුතු වේ. රිට් අඥා නිකුත් කිරීම හෝ අභියාචනා හා සම්බන්ධ කිසිදු අධිකරණ බලයක් මහාධිකරණය සතු නොවනු ඇත.

4. ආණ්ඩුක්‍රම ව්‍යස්ථා අධිකරණය හා එහි අධිකරණ බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සම්බන්ධයෙන් වැදගත්වන ගැටලු ක්ෂේත්‍රයෙහි විශේෂඥවරුන් විසින් විනිශ්චය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්/විනිසුරුවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිට විය යුතු බවට අනුකාරක සභාව නිර්දේශ කරයි.

අධිකරණ ක්ෂේත්‍රය තුළ කීර්තියක් ලබා ඇති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ විශේෂඥ දැනුමක් සහිතව නෛතික අධ්‍යාපනයක් හෝ පරිචයක් ලබා ඇති පුද්ගලයන් අතුරින් මෙහි සාමාජිකයන් තොරා ගත යුතු වේ.

අවුරුදු පහක කාල පිරිච්ඡේදයක් සඳහා ඔවුන් පත් කළ යුතු අතර, නැවත පත් කරනු ලැබීමට ඔවුහු සුදුසුකම් නොලබනු ඇත.

සමාජිකයන්/විනිසුරුවරුන් හත් දෙනාම අධිකරණයේ විනිශ්චයාසනාරූඪ වියයුතු ය. මෙම අධිකරණය අධිකරණ සංවිධාන ව්‍යුහය තුළට ඇතුලත් නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යස්තාව ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයෙහි අධිකරණ බලයට යටත් වන කිසියම් ගැටලුවක් රටෙහි කිසියම් අධිකරණයක් ඉදිරියෙහි විභාග වන නඩුවකදී පැන නගිනු ලබයි නම්, එකී ගැටලුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය වෙත යොමු කළ යුතු වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයෙහි බලතල:

කිසියම් කරුණක්/ගැටලුවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ විෂය පථයට ඇතුළත්වේද යන්න තීරණය කිරීමේ බලය ඇතුළුව ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය.

- පනත් කෙටුම්පත්වල අධිකරණමය සමාලෝචනය
- නීති හා ව්‍යවස්ථාවල අධිකරණමය සමාලෝචනය
- මධ්‍ය ආණ්ඩුව සහ/හෝ පළාත් අතර ඇති වන ගැටලු
- පාර්ලිමේන්තුවෙහි වරප්‍රසාද කඩ කිරීම
- තම අධිකරණය විසින් ම ලබාදෙන ලද තීන්දු සමාලෝචනය කිරීම.

ජාතික හා මහජන ආරක්ෂාව සහ පොලීසිය හා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව

පළමුවැනි කොටස

පොලිසිය සහ නීතිය බලාත්මක කිරීම

I. ශ්‍රී ලංකා පොලිසිය[2]

අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පිහිටුවනු ලබන පොලිසියක් සහ "ශ්‍රී ලංකා පොලිසිය" ලෙස හඳුන්වනු ලබන පනතක් ශ්‍රී ලංකාවේ තිබිය යුතුය.

ආ. ශ්‍රී ලංකා පොලිසිය ජනරජයේ අපරාධ නීති බලාත්මක කිරීමේ ප්‍රමුඛතම නියෝජිතායතනය විය යුතුය.

ඇ. ශ්‍රී ලංකා පොලිසිය පහත දැක්වෙන පරිදි සමන්විත විය යුතුය.

i. ශ්‍රී ලංකා ජාතික පොලිසිය
ii. ශ්‍රී ලංකා පළාත්බද පොලිසිය.

ඈ. පහත දැක්වෙන නිලයන් දරන නිලධාරියා ශ්‍රී ලංකා පොලිසියේ සිටිය යුතුය.

i. පොලිස්පති
ii. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
iii. නියෝජ්‍ය පොලිස්පති
iv. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
v. පොලිස් අධිකාරී
vi. සහකාර පොලිස් අධිකාරී
vii. ප්‍රධාන පොලිස් පරීක්ෂක
viii. පොලිස් පරීක්ෂක
ix. උප පොලිස් පරීක්ෂක
x. පොලිස් සැරයන්
xi. පොලිස් කොස්තාපල්

ඉ. ඉහත නිලයන් සම්මත වන නමුදු, පොලිස්පතිවරයාගේ නිර්දේශය මත ජාතික පොලිස් කොමිෂන් සභාව කලින් කලට එම නිලයන් සංශෝධනය කිරීම, ඉවත් කිරීම හෝ එකතු කිරීම කළ හැකිය.

ඊ. පොලිස් කොස්තාපල්ගේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක දක්වා නිලයන්ට පහත දැක්වෙන විශේෂායන තිබිය යුතුය.

i. අපරාධ විමර්ශනය
ii. රහස් පරීක්ෂණ කටයුතු
iii. අපරාධ වැළැක්වීම හා ප්‍රජා පොලිස් කටයුතු
iv. රථ වාහන නියාමනය
v. නඩු පැවරීම
vi. ආරක්ෂාව
vii. අපරාධ විසඳීම සඳහා උසාවියට අදාළ කටයුතු
viii. බුද්ධි තොරතුරු
ix. තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව
x. වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහායවීම හා ආරක්ෂාව
xi. කළමනාකරණය සහ පරිපාලනය
xii. මූල්‍ය
xiii. මානව සම්පත් සංවර්ධනය හා පුහුණුව
xiv. පොලිස්පතිවරයාගේ නිර්දේශය මත ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කලින් කලට පිළිගෙන ගැසට් කරනු ලබන වෙනත් යම් ක්ෂේත්‍ර

2 පොලිසිය " බලකාය" ක් ලෙස වත්මනෙහි කරන සඳහන් කිරීම ඉවත් කිරීමට අනු කමිටුව තීරණය කරන ලදී.

උ. පහත දැක්වෙන දෑ ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රමුඛ රාජකාරි විය යුතුය.

i. නීතියේ ආධිපත්‍යය පවත්වා ගැනීම

ii. සාමය සහ නීතිය හා විනය පවත්වා ගැනීම

iii. වැරදි සිදු කිරීම මගින් සිදුවන අනර්ථයන්ගෙන් මහජනතාව ආරක්ෂා කිරීම

iv. නීතිය මගින් විධි විධාන සලසා ඇති පරිදි අපරාධ නීතිය බලාත්මක කිරීම.

v. සිදු කළේ යැයි පැවසෙන පරිදි කඩිනමින්, අපක්ෂපාතීව, සාධාරණව හා පුළුල්ව විමර්ශනය කිරීම, වැරැදි සිදු කළ අය හඳුනා ගැනීම සහ අත් අඩංගුවට ගැනීම හා ඒ තැනැත්තන්ට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම.

vi. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම.

vii. වැරැදි පිළිබඳ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම.

viii. වැරැදි සිදු කළ බවට සැක කරනු ලබන සහ චෝදනා එල්ල වී ඇති තැනැත්තන් ඇතුළුව තැනැත්තන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

ඌ. පහත දැක්වෙන දෑ ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රමුඛ කර්තව්‍ය විය යුතුය.

i. ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සහ රාජ්‍ය ආරක්ෂාව ආරක්ෂා කිරීම.

ii. ශ්‍රී ලංකාවේ ජනතාවගේ ආරක්ෂාව ආරක්ෂා කිරීම

iii. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා සමග එක්ව ශ්‍රී ලංකාවේ ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම.

iv. ත්‍රස්තවාදයට එරෙහිවීම.

v. රාජ්‍ය දේපළ සහ ජාතික වැදගත්කමකින් යුතු ස්ථාන ආරක්ෂා කිරීම.

vi. වැරැදි සිදු කිරීම වැළැක්වීම.

vii. වැරැදි සිදු කිරීම සොයා ගැනීම.

viii. වැරැදිකරුවන් හඳුනා ගැනීම, අත් අඩංගුවට ගැනීම ඇතුළුව වැරැදි සිදු කිරීම පිළිබඳ විමර්ශනය කිරීම.

ix. නීතිය හා සාමය පවත්වා ගැනීම.

x. අයුතු ජනරාශි සහ අත්‍යවශ්‍ය සේවා හා සැපයුම් පවත්වා ගැනීම අවහිර කරන අනෙකුත් මහජන කණ්ඩායම් ගැසීම් විසුරුවා හැරීම.

xi. නීතිපතිවරයාගේ බලතල හා කර්තව්‍යයන්ට යටත්ව, වැරැදිකරුවන්ට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම හා වැරැදිකරුවන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම.

xii. මහජන කරදර වැළැක්වීම හා ඉවත් කිරීම.

xiii. නීතිය මගින් පොලිසියට පැවරීමට ඉඩ ඇති වෙනත් කර්තව්‍ය ඉටු කිරීම.

එ. පොලිස් පනතේ “අ” ඇමුණුමේ පෙන්නුම් කර ඇති පරිදි ධජයක් ශ්‍රී ලංකා පොලිසියට තිබිය යුතුය.

ඒ. පොලිස් පනතේ “ආ” ඇමුණුමේ පෙන්නුම් කර ඇති පරිදි ලාංඡනයක් ශ්‍රී ලංකා පොලිසියට තිබිය යුතුය.

ඔ. පොලිස්පතිවරයා විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව විමසා කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකා පොලිසියේ සියලු නිලධාරීන් (ඔවුන් අනුයුක්තව සිටින්නේ ජාතික පොලිසියටද නැතහොත් පළාත්බද පොලිසියටද යන්න නොතකා) එකම නිල ඇඳුම සහ පදවි ලාංඡනය පැළඳිය යුතුය. එම පදවි ලාංඡනය ඒ නිලධාරියාගේ නිලය, විශේෂායනය සහ ඔහු අනුයුක්තව සිටින්නේ ජාතික පොලිසියටද, නැතහොත් පළාත්බද පොලිසියටද යන්න පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. කෙසේ වෙතත්, පළාත් පොලිස් නිලධාරීන්ට, ඒ නිලධාරියා අනුයුක්ත වන්නේ කවර පළාත් පොලිසියටද යන්න පෙන්නුම් කිරීම සඳහා විශේෂක උරහිස් පළඳනාවක් පැළඳීමට පොලිස්පතිවරයා අවසර දිය යුතුය. එබඳු පළඳනාවක් නිර්මාණය කළ යුත්තේ ඒ පළාතේ ආණ්ඩුකාරවරයා, ප්‍රධාන අමාත්‍යවරයා, අදාළ පළාතේ පොලිස් කොමිෂන් සභාව සහ අදාළ පළාතේ පොලිස් කොමසාරිස්වරයා විමසාය. ශ්‍රී ලංකා පොලිස් ධජයට අමතරව, ජාතික පොලිස් කොමිෂන් සභාව සහ අදාළ පළාත් පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි, පළාත දක්වන ධජයන්ද පළාත් පොලිසියට තිබිය යුතුය.

ඕ. ශ්‍රී ලංකා පොලිසියට මූල්‍ය සම්පත් සැපයීම සිදු කළ යුත්තේ ශ්‍රී ලංකා රජය මගින් පමණි.

ක. ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය ආයුධ හා උණ්ඩ, වාහන හා උපකරණ ශ්‍රී ලංකා රජය විසින් පමණක් මිලයට ගෙන ශ්‍රී ලංකා පොලිසියට පැවරිය යුතුය.

2. ශ්‍රී ලංකා ජාතික පොලිසිය

අ. ශ්‍රී ලංකා ජාතික පොලිසිය පහත සඳහන් ඒවායින් සමන්විත විය යුතුය.

i. ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය

ii. කළමනාකරණ, මූල්‍ය, පරිපාලන, මානව සම්පත් සහ සුබසාධන කොට්ඨාස

iii. ජාතික පොලිස් කොමිෂන් සභාව සහ පොලිසිය විෂය භාර අමාත්‍යවරයා විමසා පොලිස්පතිවරයා විසින් නිශ්චය කරනු ලබන කෘතයාත්මක සහ ප්‍රායෝගික කොට්ඨාස

iv. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

v. මත්ද්‍රව්‍ය පාලන සහ විමර්ශන නියෝජිතායතනය

vi. ත්‍රස්තවාදයට එරෙහිවීමේ නියෝජිතායතනය

vii. පොලිස් සමුද්‍රිය කොට්ඨාසය

viii. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහායවීමේ සහ ආරක්ෂා කිරීමේ කොට්ඨාසය

ix. කොළඹ නාගරික පොලිසිය

x. අපරාධ බුද්ධි තොරතුරු නියෝජිතායතනය

xi. කාන්තා සහ ළමා කොට්ඨාසය

xii. විශේෂ කාර්ය බළකාය

xiii. බරපතළ මූල්‍ය සහ ආර්ථික විමර්ශන ආයතනය

xiv. අභ්‍යන්තර කටයුතු කොට්ඨාසය

xv. විශේෂ ශාඛාව

xvi. ජාත්‍යන්තර සබඳතා සහ සම්බන්ධීකරණ ආයතනය

xvii. පොලිස් මධ්‍යම අවි ගබඩාව සහ වෙඩි පිටි

xviii. ජාතික පොලිස් ඇකඩමිය

xix. ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය සහ එහි ඒකක

xx. ශ්‍රී ලංකා පොලිස් උප සේවය

ආ. ශ්‍රී ලංකා ජාතික පොලිසියේ සංවිධාන ව්‍යුහය ප්‍රදේශ, කොට්ඨාස, නියෝජිතායතන, කාර්යාංශ, ඒකක, පොලිස් ස්ථාන, පොලිස් මුර පොළ සහ පොලිස්පතිවරයා විසින් නිර්ණය කරනු ලබන සහ ජාතික පොලිස් කොමිෂන් සභා විසින් අනුමත කරනු ලබන වෙනත් ආකෘති ආකාරයයන් පැවතිය යුතුය.

ඇ. ජාතික පොලිසිය සහ පළාත් පොලිසිය අතර අන්තර් ක්‍රියා සහ සහයෝගීතාවට පහසුකම් සැපයීම පිණිස පොලිස්පතිවරයා තමාගේ සෘජු අධීක්ෂණය යටතේ ඒකකයක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතුය.

ඈ. පළාත් පොලිසියේ ඉල්ලීමක් මත, ජාතික පොලිස් කොමිෂන් සභාව පොලිස්පතිවරයා විමසා ජාතික පොලිසියේ නිශ්චිත පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් අදාළ පළාතේ පොලිසියට නිදහස් කළ යුතුය.

3. පළාත් පොලිසිය.

අ. එක් එක් පළාත සඳහා පළාත් පොලිසියක් තිබිය යුතුය.

ආ. පළාත් පොලිසිය " ....(පළාතේ නම).......... පළාත් පොලිසිය" (උදා: සබරගමුව පළාත් පොලිසිය) ලෙස හැඳින්විය යුතුය.

ඇ. සෑම පළාත් පොලිසියක්ම පහත දැක්වෙන ඒවායින් සමන්විත විය යුතුය.

i. පළාත් පොලිස් මූලස්ථාන කාර්යාංශය

ii. සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහාම දිස්ත්‍රික් කාර්යාංශයක් (ප්‍රායෝගික)

iii. ප්‍රධාන අමාත්‍යවරයා සහ අදාළ පළාත් පොලිස් කොමිෂන් සභාව විමසා පළාත් පොලිස් කොමසාරිස් විසින් නිශ්චය කරනු ලබන පරිදි කෘත්‍යත්මක කාර්යාංශ ගණනාවක්

iv. පළාත් පොලිස් පුහුණු ආයතනය

ඈ. පළාත් පොලිසියේ සංවිධාන ව්‍යුහය පළාත් පොලිස් මූලස්ථානය, කාර්යාංශ, ඒකක, පොලිස් ස්ථාන සහ පොලිස් මුරපොළ ආකෘතිය ගතයුතුය.

ඉ. අදාළ පළාත් පොලිස් කොමිෂන් සභාව සහ ප්‍රධාන අමාත්‍යවරයා විමසා පළාත් පොලිස් කොමසාරිස් විසින් නිශ්චය කරනු ලබන පරිදි පළාත් පොලිස් මූලස්ථානය, කාර්යාංශ, ඒකක, පොලිස් ස්ථාන සහ පොලිස් මුරයපාළ ස්ථාපිත කළ යුතුය.

ඊ. පළාත් පොලිසියේ පොලිස් නිලධාරීන් සාමාන්‍යයෙන් තව බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ අදාළ පළාත තුළ පමණි. කෙසේ වෙතත්, පළාත් පොලිස් කොමසාරිස්වරු විමසා පොලිස්පතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව, තමන් වෙත පවරන ලද නෛතික වගකීමක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා පළාත් පොලිස් නිලධාරීන්ට තම පළාතෙන් පිටත තම බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කළ හැකිය.

උ. පොලිස්පතිවරයා විමසා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත පදනම්ව පළාත් පොලිසිය ජාතික පොලිසිය සමග සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

ඌ. පළාත් පොලිසිය දෙකක් හෝ වැඩි ගණනක් හෝ ජාතික පොලිසිය හා පළාත් පොලිසියක් හෝ ජාතික පොලිසිය සහ පළාත් පොලිසිය දෙකක් හෝ වැඩි ගණනක් ඒකාබද්ධ විමර්ශන හෝ මෙහෙයුම් භාර ගැනීම සහ සිදු කිරීම නීත්‍යානුකූල විය යුතුය.

එ. ස්වාභාවික ආපදාවකට ප්‍රතිචාරයක් ලෙස හැර, හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර ඇති විටදී මුව ඇති තත්ත්වයට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේ අරමුණින් යුතුව පොලිස්පතිවරයා පළාත් පොලිසි එකක් හෝ ඊට වැඩි ගණනක් තමන්ගේ සෘජු අණ යටතට ගත හැකිය.

ඒ. ක්‍රමානුකූල සහ පුළුල්ව පැතිරුණු (අ) අකිංකරතාවක් හෝ (ආ)රාජකාරි සහ කර්තව්‍ය හිතාමතාව උල්ලංඝනය කිරීමක් හෝ පැහැර හැරීමක් (ඇ) කැරලි ගැසීමක් හෝ කළහකාරී හැසිරීමක් හෝ (ඈ) ශ්‍රී ලංකාවේ ඒකීය භාවය, භෞමික අඛණ්ඩතාවය හෝ ස්වෛරීත්වය කෙරෙහි තර්ජනයක් හෝ අත්‍යාසන්න තර්ජනයක් ඇතැයි යන මතය ජාතික පොලිස් කොමිෂන් සභාව සහ අදාළ පළාත් පොලිස් කොමිෂන් සභාව විමසා සහ අදාළ පළාත් පොලිස් කොමසාරිස්වරයාට අවස්ථාවක් ලබා දීමෙන් පසුව පොලිස්පතිවරයා ඇති කර ගත් විටදී, ජනාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව, ඔහු අදාළ පළාත් පොලිසියේ ක්‍රියාකාරිත්වය අත්හිටුවිය යුතු අතර, අදාළ පළාත් පොලිසියේ නිලධාරීන් නිරායුධ කිරීමට පියවර ගත යුතුය. ඉන් පසතුව ඔහු අදාළ පළාත් පොලිසියේ රාජකාරි සහ කර්තව්‍ය ජාතික පොලිසිය විසින් ඉටු කරනු ලැබීමට පැවරිය යුතුයි. විමර්ශනයකින් අනතුරුව, කිසියම් අවස්ථාවක, අදාළ පළාත් පොලිසියේ නිලධාරීන් තම රාජකාරි, බලතල හා කර්තව්‍ය නියමිත පරිදි ඉටු කරනු ඇතැයි යන මතය පොලිස්පතිවරයා ඇති කර ගන්නේ නම්, පැණවූ තහනම ඔහු ඉවත් කර ගත යුතු අතර, අදාළ පළාත් පොලිසිය සිය කර්තව්‍ය යළි ආරම්භ කරනු ඇත. තහනම ඉවත් කිරීම යෝග්‍ය නොවන බව පළාත් ආණ්ඩුකාරවරයා, ප්‍රධාන අමාත්‍යවරයා සහ පළාත් පොලිස් කොමසාරිස්වරයා විමසා පොලිස්පතිවරයා තීරණය කරන්නේ නම් ඔහු ජනාධිපතිවරයාගේ අවසරය ඇතිව අදාළ පළාත් පොලිසිය විසුරුවා හැරිය යුතුය. පළාත් පොලිසියක් විසුරුවා හැරීමෙන් පසුව එහි රාජකාරි, බලතල සහ කර්තව්‍ය ජාතික පොලිසිය විසින් ඉටු කරනු ලැබිය යුතුය. විසුරුවා හැරීමෙන් පසුව අදාළ පළාත් පොලිසිය පුනස්ථාපනය කිරීමට සහ සක්‍රිය කිරීමට පොලිස්පතිවරයා අදාළ පළාත් පොලිස් කොමිෂන් සභාවට සහාය විය යුතුය.

4. ජාතික පොලිස් කොමිෂන් සභාව.

අ. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ස්ථාපනය කරනු ලැබූ ජාතික පොලිසියක් තිබිය යුත්තේය.

ආ. ජාතික පොලිස් කොමිෂන් සභාව එහි සභාපතිවරයාගේ සහ තවත් සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

ඇ. ජනාධිපතිවරයාගේ අනුමැතිය ලබා යගන ව්‍යවස්ථාදායක සභාව විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුතුය.

ඈ. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ එහි සාමාජිකයන් පොලිස් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, අපරාධ යුක්තිය සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතුය.

ඉ. පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන්යගන් නිශ්චිත සංඛ්‍යාවකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තාවන් විය යුතුය.[3]

ඊ. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් පූර්ණ කාලීන පදනමකින් සේවය කළ යුතුය.

උ. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් වසර 05ක කාල සීමාවක් සඳහා ධුර දැරිය යුත්තේය.

ඌ. ජාතික පොලිස් කොමිෂන් සභාවට එහි ලේකම්වරයා විසින් (ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන) සහ එහි ලේකම් කාර්යාලය විසින් සහාය ලබා දෙනු ලැබිය යුතුය.

එ. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය පහත දැක්වෙන ඒවා විය යුතුය.

i. ජාතික පොලිසියේ නිලධාරීන්ගේ බඳවා ගැනීම්, පත් කිරීම්, ස්ථානමාරු කිරීම්, උසස් කිරීම්, විනය පාලන (සේවය අත්හිටුවීම ඇතුළුව) ක්‍රමයේද සකස් කිරීම සහ පිළිගැනීම.

ii. ජාතික පොලිසියේ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත සඳහන් යෝජනා ක්‍රම බලාත්මක කිරීම.

iii. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදන ලද, පළාත් පොලිස් නිලධාරීන්ගේ බඳවා ගැනීම්, පත් කිරීම්, ස්ථාන මාරු කිරීම්, උසස් කිරීම්, විනය පාලන ක්‍රමවේද අනුමත කිරීම.

3 මෙම සංඛ්‍යාව යථා කාලයේදී ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

iv. පළාත් පොලිස් කොමිෂන් සභා විසින් පළාත් පොලිසියට සිදු කරන පත්කිරීම් අපරානුමත කිරීම්.

v. පොලිස්පතිවරයාගේ නිර්දේශය මත (අ) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් (ආ) විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී (ඇ) ජාතික පොලිසියේ කෘත්‍යාත්මක සහ ප්‍රාදේශීය කොට්ඨාසවල ප්‍රධානීන් පත් කිරීම.

vi. අභ්‍යන්තර කටයුතු කොට්ඨාසයේ අධ්‍යක්ෂ පත් කිරීම.

vii. පොලිස්පතිවරයා විසින් සිදු කරන නිර්දේශ මත ජාතික පොලිසිය තුළ පොලිස් නිලධාරීන් මාරු කිරීම.

viii. අභ්‍යන්තර කටයුතු කොට්ඨාසය විසින් සිදු කරන පරීක්ෂණ සැලකිල්ලට ගනිමින්, වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් වග කිවයුතු බවට සොයා ගනු ලැබූ පොලිස් නිලධාරීන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම සලකා බැලීමට නීතිපතිවරයාට නිර්දේශ කිරීම.

ix. අදාළ පළාත් කොමිෂන් සභාවල අනුමැතිය සහිතව, පළාත් පොලිසියේ පොලිස් නිලධාරීන් ජාතික පොලිස් සේවයට අන්තර්ග්‍රහණය කිරීම

x. අදාළ පළාත් කොමිෂන් සභාවල අනුමැතිය සහිතව, අදාළ පළාත් පොලිසියට අන්තර්ග්‍රහණය කරනු පිණිස ජාතික පොලිසියේ පොලිස් නිලධාරීන් නිදහස් කිරීම.

ඒ. පළාත් පොලිසියට පොලිස් නිලධාරීන් තෝරා ගැනීම බඳවා ගැනීම, පත් කිරීම, පුහුණු කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳව, පළාත් පොලිස් කොමිෂන් සභා විමසා ජාතික පොලිස් කොමිෂන් සභාව මාර්ගෝපදේශ, නීති සහ රෙගුලාසි සම්පාදනය කළ යුතුය. (මෙය සිදු කරනුයේ තෝරා ගැනීම, බඳවා ගැනීම, පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම සහ විනය පාලනය ජාතික ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම පිණිසය.)

ඔ. ජාතික පොලිස් කොමිෂන් සභාව පළාත් පොලිස් කොමිෂන් සභාව විමසා ජාතික සහ පළාත් පොලිසියේ පොලිස් නිලධාරීන්ට ගෙවිය යුතු වැටුප් සහ අනෙකුත් දීමනා තීරණය කළ යුතුය.

ඕ. රජය මගින් වෙන් කරනු ලබන අරමුදල්, ජාතික පොලිස් කොමිෂන් සභාව ජාතික පොලිසියට සහ පළාත් පොලිසියවලට බෙදා වෙන් කළ යුතුය.

ක. තව කර්තව්‍ය එකක් හෝ වැඩි ගණනක් පොලිස්පතිවරයා වෙත පැවරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට හිමි කම ඇත්තේය.

ග. ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණ පරිපාලන අභියාචනා විනිශ්චය සභාවේදී අභියාචනා කළ හැකිය.

ජ. ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණ, ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් අධිකරණ බලයට සහ අභියාචනාධිකරණයේ රිට් අධිකරණ බලයට නඩු විය යුතුය.

5. පළාත් පොලිස් කොමිෂන් සභා.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ස්ථාපනය කරන ලද පළාත් පොලිස් කොමිෂන් සභාවක් සෑම පළාතකම තිබිය යුතුය.

(ආ) සෑම පළාත් පොලිස් කොමිෂන් සභාවක්ම එහි සභාපතිවරයාගෙන් සහ වෙනත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(ඇ) පළාතෙහි මහ ඇමතිවරයා සහ අදාළ පළාතෙහි විපක්ෂ නායකවරයා විසින් ඒකාබද්ධව ලබා දෙනු ලබන නාමයෝජනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් සලකා බැලීමෙන් අනතුරුව පළාත් පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයයක් පත් කරනු ලැබේ.

(ඈ) පළාත් පොලිස් කොමිෂන් සභාවෙහි යම් සාමාජිකයන් සංඛ්‍යාවකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තාවන් විය යුතුය.[4]

(ඉ) පළාත් පොලිස් කොමිෂන් සභාවෙහි සභාපතිවරයා සහ සාමාජිකයන් පූර්ණ කාලීන පදනම මත සේවය කළ යුතුය.

(ඊ) පළාත් පොලිස් කොමිෂන් සභාවෙහි සභාපතිවරයා සහ සාමාජිකයන් 5 අවුරුදු කාලසීමාවකට ධුර දැරිය යුතුය.

(උ) ලේකම්වරයා සහ මහලේකම් කාර්යාලය විසින් පළාත් පොලිස් කොමිෂන් සභාවට සහය ලබා දිය යුතුය. (අදාළ පළාත් කොමිෂන් සභාව මගින් පත් කරන ලද)

(ඌ) පළාත් පොලිස් කොමිෂන් සභාවෙහි සභාපතිවරයා සහ සාමාජිකයන් පොලිස් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, නීතිය ආරක්ෂා කිරීම සහ අපරාධ යුක්තියෙහි අත්දැකීම් ලත් පුද්ගලයන් විය යුතුය.

(එ) පළාත් පොලිස් කොමිෂන් සභාවෙහි කර්තව්‍යයන් පහත පරිදි වේ.

i. අදාළ පළාත් පොලිසියෙහි නිලධාරීන්ට අදාළ බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මරු සහ විනය පාලනය සම්බන්ධ පටිපාටි සම්මත කොට ගැනීම සහ වැඩිදියුණු කිරීම සහ ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් එකී පටිපාටි අනුමත කොට ගැනීම.

4 මෙම සංඛ්‍යාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් යථා කාලයේදී තීරණය කරනු ඇත.

ii. අදාළ පළාත් පොලිසියෙහි සේවය කිරීම පිණිස පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, පත් කිරීම, උසස්වීම් ලබා දීම සහ ජාතික පොලිස් කොමිසමෙන් එකී තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම, පළාත් පොලිසියෙහි සේවය කිරීම පිණිස නිලධාරීන් බඳවා ගන්නා අවස්ථාවෙහි දී, එකී පළාතෙහි පුරවැසියන් භාවිත කරන භාෂාව පිළිබඳව සලකමින්, තෝරා ගනු ලැබීමට සලකා බලනු ලබන පුද්ගලයන්ගේ භාෂා හැකියාව පිළිබඳව නිසි අවධානය යොමු කළ යුතුය.

iii. අදාළ පළාතෙහි පොලිස් කොමසාරිස්වරයා පත් කිරීම පිළිබඳව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

iv. අදාළ පළාතෙහි පොලිස් කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් ඉදිරිපත් කළ නිර්දේශ මත, පළාත් පොලිසිය තුළ පොලිස් නිලධාරීන් ස්ථාන මාරු කිරීම.

v. අදාළ පොලිස් කොමිෂන් සභාව හා සහයෝගයෙන් එක් පළාත් පොලිසියක සිට තවත් පළාත් පොලිසියකට නිලධාරීන් ස්ථාන මාරු කිරීම.

vi. අදාළ පළාත් පොලිසියෙහි නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමද ඇතුළුව විනය පාලනය.

vii. ජාතික පොලිස් කොමිෂන් සභාවෙහි එකඟතාවය ඇතිව, ජාතික පොලිස් හමුදාවෙන් නිදහස් කරනු ලබන පොලිස් නිලධාරීන්, ඒ ඒ පළාත් පොලිසියවල සේවය සඳහා අන්තර්ග්‍රහණය කරගැනීම

viii. ජාතික පොලිස් කොමිෂන් සභාවෙහි එකඟතාවය ඇතිව, ජාතික පොලිස් හමුදාවට අන්තර්ග්‍රහණය කර ගනු පිණිස, පළාත් පොලිසියයන් නිලධාරීන් නිදහස් කිරීම.

(ඒ) පළාත් පොලිසියට අනුබද්ධව සේවය කිරීම පිණිස පොලිස් නිලධාරීන් බඳවා ගන්නා විටදී, අදාළ පළාතෙහි, ජන සහ භාෂා අනුපාතය පිළිබඳව අදාළ පළාත් කොමිසම නිසි සැලකිල්ල දැක්විය යුතුය.

(ඔ) පළාත් පොලිසියට අනුබද්ධව සේවය කිරීම පිණිස පළාත් නිලධාරීන් බඳවා ගන්නා විටදී, සාමාන්‍යයෙන් අදාළ පළාත තුළ පදිංචි අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

(ඕ) විශේෂිත පළාත් පොලිසියකට අනුබද්ධව සේවය කිරීම පිණිස පොලිස් නිලධාරීන් බඳවා ගන්නා විටදී, අදාළ පළාතෙහි ජනතාව ප්‍රමුඛව කථා කරන භාෂාව පිළිබඳව එකී නිලධාරීන්ගේ ප්‍රවීණතාවය පිළිබඳව නිසි සැලකිල්ල යොමු කළ යුතුය.

(ක) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිලයට නොඅඩු ධුර දරණ අදාළ පොලිස් කොමසාරිස්වරයාට හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිලයට නොඅඩු ධුර දරණ අදාළ පළාත් පොලිසියෙහි වෙනත් යම් නිලධාරියයකුට සිය කාර්යයන්ගෙන් එකක් හෝ කිහිපයක් අභිනියෝජනය කිරීමට පළාත් පොලිස් කොමිසමට හැකිය.

(ග) පළාත් පොලිස් කොමිෂන් සභාවෙහි තීරණයකින් අගතියට පත් වන ඕනෑම පොලිස් නිලධාරියකුට පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියට අභියාචනා කළ හැකිය.

6. පොලිස්පති

(අ) ශ්‍රී ලංකා පොලිසියෙහි ප්‍රධානියා පොලිස්පතිවරයා විය යුතුය.

(ආ) පළාත් පොලිසියෙහි කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ සමස්ත කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් පළාත් පොලිස් කොමසාරිස්වරුන්ට නියයෝග නිකුත් කිරීමට පොලිස්පතිවරයාට බලය තිබේ. කෙසේ වෙතත්, පළාත් පොලිසියකට විශේෂිත පාලනය පවරා දෙනු ලැබූ කරුණු සම්බන්ධයෙන් නියෝග ලබාදීමට පොලිස්පතිවරයාට බලය නොමැත්තේ ය.

(ඇ) ජාතික පොලීසියෙහි පරිපාලනයට සහ කළමනාකරණයට පොලිස්පතිවරයා වගකිව යුතුය.

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඒ පිළිබඳව කරනු ලබන නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පොලිස්පතිවරයා පත් කරනු ලැබේ.

(ඉ) ඕනෑම (සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු පමණක්) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු පොලිස්පතිවරයා ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් ලබයි. පළාත් පොලිස් කොමසාරිස්වරුන් එම ගණයට අයත් වේ.

(ඊ) පොලිස්පතිවරයා ලෙස පත් කරනු ලැබීමෙන් අනතුරුව, ඔහු වයස අවුරුදු 63 දක්වා එම තනතුරෙහි සේවය කිරීමට හිමිකම් ලබන අතර, එකී වයස් සීමාවෙන් අනතුරුව ඔහුගේ සේවය දීර්ඝ නොකළ යුතුය.

(උ) පොලිස්පතිවරයකුගේ උපරිම සේවා කාලය අවුරුදු 4ක් විය යුතුය.

(ඌ) පොලිස්පතිවරයා සම්බන්ධයෙන් විනය පාලනය කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ලබාදිය යුතුය.

(එ) (අ) නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම (ආ) අල්ලස, දූෂණය හෝ වංචාව (ඇ) බලය අනිසි ලෙස යෙදීම (ඈ) පොලිස්පතිවරයාගේ නිලය අපකීර්තියට පත් කිරීම හෝ (ඉ) අයහපත් සෞඛ්‍යය යන හේතු මත මිස පොලිස්පතිවරයාගේ

සේවය අවසන් නොකළ යුතුය. පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, ඉහත කී හේතු එකක් හෝ වැඩි ගණනක් මත පොලිස්පතිවරයා වරදකරුවකු වන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තීරණය කිරීමෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුව වෙත සංදේශයක් යොමු කළ යුතු වන අතර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයක් පොලිස්පතිවරයාගේ සේවය අවසන් කිරීම පිළිබඳ යෝජනාවට පක්ෂව ඡන්දය භාවිත කරන්නේ නම් පමණක් පොලිස්පතිවරයාගේ සේවය අවසන් කළ යුතු වන්නේය.

(ඒ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ උපදෙස් ක්‍රියාත්මක කිරීමට පොලිස්පතිවරයා බැඳී සිටිය යුතුය.

(ඔ) පරීක්ෂණ පැවැත්වීමද ඇතුළුව සිය කාර්යන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී පළාත් පොලිසිය විසින් අනුගමනය කළ යුතු ප්‍රමිතීන් හා උපදෙස් නියම කිරීමට පොලිස්පතිවරයාට බලය තිබිය යුයත්ය.

(ඕ) අපරාධ කාරණාවලදී අන්‍යොන්‍ය සහාය ලබාදීම පිළිබඳ පනතෙහි කාර්යන් සඳහා පොලිස්පතිවරයා "ප්‍රධාන බලධරයා" විය යුත්තේය

(ක) ජාත්‍යන්තර සමුළුවලදී ශ්‍රී ලංකා පොලිසිය නියයෝජනය කිරීමටත්, විදේශීය නීති බලාත්මක කිරීමේ ඒජන්සි සමග එකනතාවලට එළැඹීමටත් පොලිස්පතිවරයාට බලය තිබිය යුත්තේය.

(ග) අපරාධ විමර්ශන සිදුකිරීමේ කාරණා සම්බන්ධයෙන් නිශ්චිත සිද්ධිවලට විශේෂිත උපදෙස් නිකුත් කිරීමේ බලය අමාත්‍යවරයාට නොතිබිය යුතුය.

7. පළාත් පොලිස් කොමසාරිස්වරුන්

අ. සෑම පළාතකටම පළාත් පොලිස් කොමසාරිස්වරයකු සිටිය යුත්තේය.

ආ. පළාත් පොලිස් කොමසාරිස්වරුන් අදාළ පළාත් පොලිස් හමුදාවෙහි ප්‍රධානියා විය යුතුය.

ඇ. අදාළ පළාත් පොලිසියෙහි නිලධාරීන් වෙත නියයෝග නිකුත් කිරීමට පළාත් පොලිස් කොමසාරිස්වරුන්ට බලය ඇත්තේය.

ඈ. අදාළ පළාත් පොලිසියෙහි සමස්ත කළමනාකාරිත්වය සහ පරිපාලනය සඳහා පළාත් පොලිස් කොමසාරිස්වරුන් වගකිය යුත්තේය

ඉ. අදාළ පළාත් පොලිස් කොමිසම මගින් නිකුත් කරනු ලබන නිර්දේශ මත ජාතික පොලිස් කොමිසම මගින් පළාත් පොලිස් කොමසාරිස්වරුන් පත් කළ යුතුය.

ඊ. පළාත් පොලිස් කොමසාරිස්වරයකු ලෙස පත්කිරීම සඳහා සලකා බලනු ලැබීමට ඕනෑම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකුට හිමිකම තිබිය යුතුය.

උ. පළාත් පොලිස් කොමසාරිස්වරයකු ලෙස පත් කරනු ලැබීමෙන් අනතුරුව ඔහු වයස අවුරුදු 61 දක්වා එම තනතුරෙහි සේවය කිරීමට හිමිකම් ලබන අතර එකී වයස් සීමාවෙන් අනතුරුව ඔහුගේ සේවය දීර්ඝ කරනු නොලැබේ.

ඌ. පළාත් පොලිස් කොමසාරිස්වරයකුයගේ උපරිම සේවා කාලය අවුරුදු 3කි. ඉන් අනතුරුව, එම පළාතෙහිම, පළාත් පොලිස් කොමසාරිස්වරයා ලෙස නැවත පත් කරනු ලැබීමට ඔහු හිමිකම් නොලැබිය යුත්තේය.

එ. පළාත් පොලිස් කොමසාරිස්වරුන් සම්බන්ධ විනය පාලනය ක්‍රියාත්මක කිරීමට ජාතික පොලිස් කොමිසමට බලය ලබාදිය යුත්තේය.

ඒ. එක් පළාතක පොලිස් කොමසාරිස්වරයකු, පසුව වෙනත් පළාතක පළාත් පොලිස් කොමසාරිස්වරයකු ලෙස පත්කරනු ලැබීමට හිමිකම් තිබිය යුත්තේය.

ඔ. ජාතික පොලිස් හමුදාව හා සම්බන්ධ වීමට පළාත් පොලිස් කොමසාරිස්වරයකුට හිමිකම් තිබිය යුත්තේය.

ඕ. පොලිස්පතිවරයා ලෙස පත්කරනු ලැබීමට පළාත් පොලිස් කොමසාරිස්වරයකුට හිමිකම් තිබිය යුත්තේය.

ක. (අ) නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම (ආ) අල්ලස, දූෂණය හෝ වංචාව (ඇ) බලය අනිසි ලෙස යෙදීම (ඈ) පොලිස්පතිවරයාගේ නිලය අපකීර්තියට පත් කිරීම හෝ (ඉ) අයහපත් සෞඛ්‍යය යන හේතු මත මිස පළාත් පොලිස් කොමසාරිස්වරයාගේ සේවය අවසන් නොකළ යුතුය. පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, ඉහත කී හේතු එකක් හෝ වැඩි ගණනක් මත පළාත් පොලිස් කොමසාරිස්වරයා වරදකරුවකු වන බවට ජාතික පොලිස් කොමිසම තීරණය කිරීමෙන් අනතුරුව, ජාතික පොලිස් කොමිසම පාර්ලිමේන්තුව වෙත සංදේශයක් යොමු කළ යුතු වන අතර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයක් පළාත් පොලිස් කොමසාරිස්වරයාගේ සේවය අවසන් කිරීම පිළිබඳ යෝජනාවට පක්ෂව ඡන්දය භාවිත කරන්නේ නම් පමණක් අදාළ පොලිස් කොමසාරිස්වරයාගේ සේවය අවසන් කළ යුතුය.

ග. අදාළ පළාත් පොලිස් කොමිෂන් සභාවේ උපදෙස් ක්‍රියාත්මක කිරීමට පළාත් පොලිස් කොමසාරිස්වරයා බැඳී සිටිය යුතුය.

ජ. නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තිය, නීතිය හා සාමය, නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතා යන කරුණු සම්බන්ධයෙන් පළාත් පොලිස් කොමසාරිස්වරුන්, අදාළ පළාත් සභාවෙහි

අමාතය මණ්ඩලයයහි "නීතිය හා සාමය" විෂය භාර අමාත්‍යවරයා වෙත වගකිව යුතුය. කෙසේ වෙතත්, අපරාධ පරීක්ෂණය සම්බන්ධයෙන් එක් එක් කාරණයට විශේෂිතව උපදෙස් නිකුත් කිරීමට එකී පළාත් අමාත්‍යවරයාට බලය නොතිබිය යුතුය.

8. ජාතික පොලිසියෙහි බලතල හා කර්තව්‍යයන්

අ. පහත දැක්වෙන වරද සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට ජාතික පොලිසියට බලය හිමිවිය යුතුය.

i. දණ්ඩනීති සංග්‍රහයෙහි 114, 116 සිට 126 දක්වා සහ 128 සිට 137 දක්වා වගන්ති යටතේ දඬුවම් ලබාදිය යුතු වරද ඇතුළුව ජනරජයට එරෙහි ඕනෑම වරදක්;

ii. ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාවට සහ ස්වෛරීභාවයට හානිකර වන වැරදි;

iii. ත්‍රස්තවාදය සහ ඒ හා ආශ්‍රිත වැරදි;

iv. ජනාධිපතිවරයාට, අමාත්‍යවරයාට, පාර්ලිමේන්තුවේ කථානායකවරයාට, කැබිනට් මණ්ඩලයයහි අමාත්‍යවරයකුට, නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට එරෙහි යම් වරදක්;

v. ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, අභියාචනාධිකරණයෙහි විනිශ්චයකාරවරයකු හෝ නීතිපති දෙපාර්තමේන්තුවෙහි නිලධාරීවරයකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි සාමාජිකයකු, ඕනෑම කොමිෂන් සභාවක් සාමාජිකයකු, ජාතික පොලිස් කොමිසමෙහි සාමාජිකයකු හෝ පළාත් පොලිස් කොමිසමක සාමාජිකයකු, පාර්ලිමේන්තු ලේකම්වරයා, ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි නිලධාරියකු හෝ ශ්‍රී ලංකා විදේශ සේවයෙහි නිලධාරියකුට එරෙහිව සිදු කරනු ලැබූ යම් වරදක්;

vi. ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව හෝ ඒවායේ සාමාජිකයකුට සම්බන්ධ ඕනෑම වරදක්;

vii. මැතිවරණ සම්බන්ධ ඕනෑම වරදක්;

viii. ඕනෑම විදේශ රාජ්‍යයක රාජ්‍ය තාන්ත්‍රික හෝ කොන්සල් නියෝජිතවරයකුට හෝ සංචාරයෙහි නියුතු විදේශ රටක රාජ්‍ය නායකවරයකුට හෝ රජයේ ප්‍රධානියකුට එරෙහි වරදක්;

ix. අන්තර් රාජ්‍ය සංවිධානයක ඕනෑම නිලධාරියකුට එරෙහි වරදක්;

x. කාසි, මුදල් නෝට්ටු සහ රජයේ මුද්දරවලට සම්බන්ධ වරදක්;

xi. ජනරජයේ හෝ රාජ්‍ය සංස්ථාවකට සම්බන්ධ දේපළක් හෝ ජනරජය මගින් මුළුමනින්ම හෝ කොටසක් ප්‍රාග්ධනය යොදා ස්ථාපනය කරන ලද සමාගමක් සම්බන්ධ දේපළක් සම්බන්ධ වරදක්;

xii. ඕනෑම ජාත්‍යන්තර හෝ දේශ සීමා ඉක්ම වූ අපරාධයක්;

xiii. සංවෘත ලැයිස්තුවෙහි සඳහන්, ඕනෑම නීතියක් යටතේ ගැනෙන ඕනෑම කරුණක් සම්බන්ධ වරදක් (පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක බලය ඇති කරුණු සම්බන්ධයෙන්)

xiv. කොළඹ මහානගර සභා සීමාව තුළ සහ අපනගර භූමි ප්‍රදේශය තුළ සම්පූර්ණයයන්ම හෝ කොටසක් වශයෙන් කරන ලද ඕනෑම වරදක්;

xv. (අ) පරීක්ෂණය පැවැත්වීම පිණිස අවශ්‍ය වාර්තාව ඉහළ මට්ටමේ විශේෂඥභාවය අදාළ පළාත් පොලිසිය සතුව නොතිබෙන නිසා හෝ (ආ) අදාළ පළාත් පොලිසියට අදාළ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි වන්නා වූ හෝ නොකැමති හෝ අදාළ පරීක්ෂණය නොපවත්වන්නා වූ අවස්ථාවක හෝ (ඇ) අදාළ පරීක්ෂණය ජාතික පොලිසිය මගින් පැවැත්වීම අවශ්‍ය වන්නේ යැයි අදාළ පළාත් පොලිස් කොමසාරිස්වරයා / කොමිසම ඉල්ලා සිටින අවස්ථාවක, අදාළ පළාත් පොලිස් කොමසාරිස්වරයාගේ අදහස් විමසා පොලිස්පතිවරයා තීරණය කරන ඕනෑම වරදක්;

ආ. ජාතික පොලිසිය පහත කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය.

i. ශ්‍රී ලංකාවෙහි ජාතික ආරක්ෂාව සහ රාජ්‍යාරක්ෂාව සුරැකීම.

ii. ශ්‍රී ලංකාවේ මහජනතාවගේ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම.

iii. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවෙහි සහයෝගයද ඇතිව, ශ්‍රී ලංකාවෙහි ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරී භාවය ආරක්ෂා කිරීම.

iv. පොලිස්පතිවරයාගේ අදහස් විමසා "පොලිස්" විෂය භාර අමාත්‍යවරයා විසින් කලින්, කලට නියම කරනු ලබන ජාතික වැදගත්කමකින් යුතු රජයේ සම්පත් සහ මහජන ආයතන ආරක්ෂා කිරීම.

v. ජාතික පොලිසියට පරීක්ෂා කිරීමට බලය තිබෙන වරද සිදු කිරීම් වැළැක්වීම.

vi. ජාතික පොලිසියට පරීක්ෂා කිරීමට බලය තිබෙන වරද සිදු කිරීම් හසු කර ගැනීම.

vii. කෝලාහල, කැරලි, සිවිල් විරෝධතා ව්‍යාපාර සහ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් බිඳවැටෙන අත්‍යවශ්‍ය සේවා සහ නීතිය හා සාමය පවත්වාගෙන යාම.

viii. නීතිපතිවරයාගේ බලතල සහ කාර්යන්ට යටත්ව වරදකරුවන්ට එරෙහිව අපරාධ නීති පටිපාටි ආරම්භ කිරීම සහ වරදකරුවන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයක්හි නඩු පැවරීම.

ix. අපරාධ නඩු කටයුතු ඇරඹීම පිණිස පරීක්ෂණ සටහන් නීතිපතිවරයා වෙත ලබා දීම.

ඇ. ජාතික පොලිසිය විසින් අයිතිව සිටිය යුතු සහ භාවිත කළ යුතු අවි සහ උණ්ඩ ප්‍රමාණයෙහි ස්වභාවය කලින් කලට පොලිස්පතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය. එකී විස්තරයන්ට ඕනෑම පොලිස් නිලධාරියකු, සාමාන්‍යයෙන් සහ විශේෂිත අවස්ථාවන්වලදී සතුව සිටිය යුතු අවි සහ උණ්ඩවල ප්‍රමාණයෙහි ස්වභාවයද, නියම කරන ලද කාලයක් තුළ ජාතික පොලිසිය සතුව පැවතිය යුතු මුළු ප්‍රමාණයද, ඇතුළත් විය යුතුය.

9. පළාත් පොලිසියෙහි බලතල සහ කාර්යයන්

අ. පළාත් පොලිසියට පහත වරද සිදු කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමට හැකිය.

i. ජාතික පොලිසියට විමර්ශනය කිරීමට නීතියයන් බලය දී ඇති හෝ නිතිය ප්‍රකාරව අධිකාරී බලය පැවරී ඇති වැරදි හැර අන් වැරදි, සහ

ii. අදාළ පළාත් සභාව මගින් පනවා ඇති ව්‍යවස්ථාපිතයක අඩංගුවන කවර හෝ වරදක්

ආ. පළාත් පොලිසිය පහත සඳහන් කර්තව්‍යයන් ක්‍රියාවේ දෙවිය යුතුය.

i. අදාළ පළාතෙහි පළාත් ආරක්ෂාව සුරැකීම

ii. අදාළ පළාතෙහි ජනතාවගේ ආරක්ෂාව සුරැකීම

iii. ජාතික පොලිසිය විසින් ආරක්ෂා කරනු ලබන දේපළ හා ආයතන හැර පළාත තුළ පවත්නා රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම

iv. පළාත් පොලිසියට පරීක්ෂණ කිරීමේ බලය ඇති වරද සිදු කිරීම වැළැක්වීම

v. ප්‍රජාව තුළ නීතිය හා සාමය සුරැකීම

vi. පොලිස්පතිවරයා විසින් නිකුත්කරනු ලැබූ මාර්ගෝපදේශයන් මත පදනම්ව පළාත් මායිමෙන් එපිට සිදු වන අපරාධ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම

vii. පළාත් පොලිසියට පරීක්ෂා කිරීමට බලය ඇති වරද හසුකර ගැනීම

viii. පළාත් තුළ නීතිය හා සාමය පවත්වායනෙ යාම

ix. අපරාධ නඩු පටිපාටි ආරම්භ කිරීම පිණිස පරීක්ෂණ පමණක් නීතිපතිවරයා වෙත යොමු කිරීම

x. නීතිපතිවරයාගේ බලතල සහ කාර්යයන්ට යටත්ව, පළාත් පොලිස් හමුදාවට පරීක්ෂා කිරීමට බලතල ඇති වරද සිදු කළා යැයි චෝදනා ලත් වරදකරුවන් සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයයහි නඩු කටයුතු ආරම්භ කිරීම

xi. මහජන හිරිහැරය වැළැක්වීම සහ ඉවත් කිරීම

ඇ. පොලිස්පතිවරයා විසින් කලින් කලට අදාළ ප්‍රමාණයද සමග නිර්දේශ කරනු ලබන අවි, භාණ්ඩ සහ දැරීමට පළාත් පොලිසියට හැකිවිය යුතුය. එවැනි කරුණු පිළිබඳව තීරණය කිරීමේදී පොලිස්පතිවරයා අදාළ පළාත් පොලිස් කොමසාරිස්වරයා විමසනු ලැබිය යුතුය. එම විස්තරයට ඕනෑම පොලිස් නිලධාරියකු සාමාන්‍යයෙන් සහ විශේෂිත අවස්ථාවන්වලදී සතුව තිබිය යුතු අවි, උණ්ඩ සහ උපකරණ ප්‍රමාණයයහි ස්වභාවය සහ මුලු අවි, උණ්ඩ සහ උපකරණ ප්‍රමාණයද ඇතුළත් විය යුතුය.

10. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

අ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සංකීර්ණ අපරාධ පිළිබඳව පරීක්ෂා කිරීමට බලය ලත්, ශ්‍රී ලංකා පොලිසියෙහි ප්‍රමුඛතම ආයතනය විය යුතුය.

ආ. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර ට නොඅඩු තනතුරක් දරණ පොලිස් නිලධාරියයකු, කොමසාරිස්වරයකු ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානත්වය දැරිය යුතුය.

ඇ. පොලිස්පතිවරයාගේ නිර්දේශ මත ජාතික පොලිස් කොමිසම මගින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස්වරයා පත් කරනු ලැයබි.

ඈ. පහත සඳහන් අවස්ථායේදී බරපතළ සහ සංකීර්ණ වරද සිදු කිරීම පිළිබඳව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණ පැවැත්විය යුතුය.

i. පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් මත

ii. ජාතික පොලිස් කොමිසමෙහි උපදෙස් මත

iii. නීතිපතිවරයායාගේ උපදෙස් මත

iv. පළාත් පොලිස් කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත

11. කොළඹ මහ නගර පොලීසිය

අ. කොළඹ මහානගර සභා බල ප්‍රදේශයට අදාළව, ජාතික පොලිසියෙහි සහ බස්නාහිර පළාත් පළාත් පොලිසියෙහි බලතල හා කාර්යන්, කොළඹ මහානගර පොලිසිය මගින් ක්‍රියාත්මක කළ යුතුය.

ආ. කොළඹ මහානගර සභා බල ප්‍රදේශයට[5] නියම කරනු ලබන භූගෝලීය ප්‍රදේශය අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය. එම තිරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

ඇ. කොළඹ මහානගර ප්‍රදේශයෙහි ආරක්ෂාව පිළිබඳව කොළඹ මහානගර පොලිසිය වග කිව යුතු වේ.

ඈ. කොළඹ මහානගර බල ප්‍රදේශය තුළ අපරාධ වැළැක්වීම සහ හසුකර ගැනීම සම්බන්ධයෙන් කොළඹ මහානගර පොලිසිය වගකිව යුතු යුතුය.

ඉ. කොළඹ මහානගර බල ප්‍රදේශය තුළ සම්පූර්ණයයන්ම හෝ කොටසක් ලෙස සිදු කරන ලද වරදක් පිළිබඳව පරීක්ෂණ කිරීම පිළිබඳව බලය කොළඹ මහානගර පොලිසිය වෙත තිබිය යුතුය.

ඊ. කොළඹ මහානගර බල ප්‍රදේශය සම්බන්ධයෙන් පළාත් පොලිස් බලතල ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාත් පළාත් පොලිසියට නොහැකි විය යුතුය.

එ. "කොළඹ මහානගර පොලිස් කොමසාරිස්" ලෙසින් තනතුරු ලද පොලිස් කොමසාරිස්වරයකු කොළඹ මහානගර පොලිසියෙහි ප්‍රධානියා විය යුතුය.

ඒ. පොලිස්පතිවරයාගේ නිර්දේශය මත ජාතික පොලිස් කොමිසම මගින් කොළඹ මහානගර පොලිස් කොමසාරිස්වරයා පත් කරනු ලබන අතර නියෝජ්‍ය පොලිස්පතිවරයකුට නොඅඩු ධුර දරණ පොලිස් නිලධාරියකු විසින් එම තනතුර දැරිය යුතුය.

12. විශේෂ කාර්ය බලකාය

අ. විශේෂ කාර්ය බලකාය ශ්‍රී ලංකා පොලිසිය තුළ පවතින අතුරු හමුදා ඒකකයකි.

ආ. "විශේෂ කාර්ය බලකායයහි අණදෙන නිලධාරී" ලෙසින් තනතුරු ලද අණ දෙන නිලධාරීවරයකු විශේෂ කාර්ය බලකායේ ප්‍රධානත්වය දරයි.

ඇ. පොලිස්පතිවරයාගේ නිර්දේශය මත ජාතික පොලිස් කොමිසම මගින් විශේෂ කාර්ය බලකායයහි අණ දෙන නිලධාරීවරයා පත් කරනු ලබන අතර නියෝජ්‍ය පොලිස්පතිවරයකුට නොඅඩු ධුර දරණ පොලිස් නිලධාරියකු විසින් එම තනතුර දැරිය යුතුය.

ඈ. ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමෙහිදීත් ජනරජයෙහි භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය රැකීමේදීත් විශේෂ කාර්ය බලකාය සන්නද්ධ හමුදාවන්ට සහාය ලබා දිය යුතුය.

ඉ. ශ්‍රී ලංකා පොලිසියෙහි සියලුම පොලිස් නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතල හා කාර්යන් ක්‍රියාත්මක කිරීමට විශේෂ කාර්ය බලකායෙහි නිලධාරීන්ට හැකි විය යුතුය.

13. අභ්‍යන්තර කටයුතු අංශය

අ. ජාතික සහ පළාති පොලිසියට අනුයුක්ත පොලිස් නිලධාරීන් සම්බන්ධ පහත සඳහන් චෝදනා සහ තොරතුරු පරීක්ෂා කිරීම පිණිස කොමසාරිස්වරයකුගේ ප්‍රධානත්වයෙන් යුතු අභ්‍යන්තර කටයුතු අංශයන් තිබිය යුතුය.

1. දූෂණයද ඇතුළුව, වරදකාරී ක්‍රියා සිදු කිරීම.
2. අභ්‍යන්තර නීති සහ රෙගුලාසි උල්ලංඝනය.
3. බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම
4. විනය කඩ කිරීම සහ ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කිරීම.

ආ. ජාතික පොලිස් කොමිසම මගින් කොමසාරිස්වරයා පත් කරනු ලබන අතර සෘජුවම ජාතික පොලිස් කොමිසම වෙත වාර්තා කරනු ලබයි.

ඇ. ජාතික පොලිස් කොමිසම විසින් පවත්වන්නට නියෝග කරනු ලබන පරීක්ෂණ සහ විමසා බැලීම් අභ්‍යන්තර කටයුතු අංශය විසින් භාරගත යුතුය.

5. කොළඹ මහානගර පොලිසිය බලතල ක්‍රියාත්මක කරනු ලබන භූගෝලීය ප්‍රදේශය යෝජිත ව්‍යවස්ථාවේ අග නගරය ට අයත් නගර සීමාවට සිමාවිය යුතු බවට අනු කාරක සභාවේ ඇතැම් සාමාජිකයන් අදහස් කළහ

14. විශේෂ ශාඛාව

අ. බුද්ධි තොරතුරු එකතු කිරීමට, සැකසීමට සහ ව්‍යාප්ත කිරීමට විශේෂ ශාඛාවක් තිබිය යුතුය.

ආ. කොමසාරිස්වරයකු විශේෂ ශාඛාවෙහි ප්‍රධානත්වය දැරිය යුතුය.

ඇ. පොලිස්පතිවරයාගේ නිර්දේශය මත ජාතික පොලිස් කොමිසම මගින් විශේෂ ශාඛාවෙහි කොමසාරිස්වරයා පත් කරනු ලැබිය යුතුය.

ඈ. පොලිස්පතිවරයාගේ නිර්දේශය මත ජාතික පොලිස් කොමිසම මගින් පත් කරනු ලබන පොලිස් නිලධාරීන්ගෙන් විශේෂ ශාඛාව සමන්විත විය යුතුය.

ඉ. විශේෂ ශාඛාවෙහි කොමසාරිස්වරයා සෘජුවම පොලිස්පතිවරයා වෙත වගකිව යුතුය.

15. විවිධ සහ සංක්‍රාන්ත්‍රතික විධි විධාන

අ. නව නීතියක් සම්මත කිරීමට නියමිතව තිබෙන විට පොලිස් ආඥා පනත මගින් ස්ථාපනය කොට වර්තමානයෙහි ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලිසිය, අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

ආ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකව තෙමසක් ඇතුළත ජාතික පොලිස් කොමිසම ස්ථාපනය කළ යුතුය.

ඇ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකව මාස 06 ක් ඇතුළත පළාත් පොලිස් කොමිෂන් සභා ස්ථාපනය කළ යුතුය.

ඈ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකව එක් අවුරුද්දක් ඇතුළත ජාතික සහ පළාත් පොලිසිය ස්ථාපනය කොට ක්‍රියාත්මකභාවයට පැමිණිය යුතුය.

ඉ. ජාතික සහ පළාත් පොලිසිය ස්ථාපනය කරන තුරු , ව්‍යවස්ථාව ක්‍රියාත්මකකිරීමට පෙරාතුව ස්ථාපනය කොට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා පොලිස් හමුදාව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

දෙවන කොටස

ජාතික සහ රාජ්‍ය ආරක්ෂාව සහ මහජන සාමය[6]

(1) හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කළ හැකි සහ හදිසි අවස්ථා රෙගුලාසි සෑදිය හැකි අවස්ථා[7]

i. පහත දැක්වෙන අවස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් පැහැදිලිවම පැවතීම හෝ පැහැදිලිවම පැවතීමට ආසන්න වීම මත පදනම්ව පහතින් දක්වා ඇති තත්ත්වයන් එකක් හෝ වැඩි ගණනක් යටතේ හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ හැකිය.

අ. ශ්‍රී ලංකාවෙහි ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවයට පහර එල්ල වීම.

ආ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සන්නද්ධ ආක්‍රමණ ඇතිවීම.

ඇ. ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් තර්ජන සහ පහර එල්ලවීම.

ඈ. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තර්ජන සහ පහර එල්ලවීම.

ඉ. ශ්‍රී ලංකාවේ මහජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් තර්ජන සහ පහර එල්ලවීම.

ඊ. මහජන සාමයට බරපතළ ලෙස සහ පුළුල්ව පැතිරුණු ආකාරයයන් ඇතිවන කඩාකප්පල්කාරී ක්‍රියා.

උ. විශාල ස්වාභාවික සහ හදිසි ආපදා තත්ත්වයන් ඇතිවීම.

ඌ. මහජන හෝ වෙනත් අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් පවත්වායගන යාමට බලපාන තත්ත්වයන්.

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පහත දැක්වෙන විධි විධානයන් යටතේ ප්‍රකාශනයක් මගින් හදිසි නීතිය ප්‍රකාශයට පත් කළ හැකිය.

iii. හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ක්‍රියාකාරීත්වයට බලපෑමක් ඇති නොවිය යුතුය. කෙසේ වෙතත්, හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට පසුව ඒ නඩුව සාදනු ලබන හදිසි අවස්ථා රෙගුලාසි මගින්, සමහරක් මූලික අයිතිවාසිකම් ක්‍රියාකාරීත්වය සහ ඒවායින් සලසා දෙන රැකවරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉඩ සලසන ප්‍රමාණයට සීමා කරනු ලැබීමට හෝ හීන කරනු ලැබීමට හැකි විය යුතුය.

---

6 වාර්තාවෙහි මෙම කොටසෙහි හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමට අදාළව පවත්නා ක්‍රමවේදය, ජනාධිපතිවරයා රාජ්‍යයෙහි විධායකයෙහි ප්‍රධානියා වන බවත්, ඔහු සතුව විධායක බලය පවතින බවත් යන පදනම මත සකස් කොට දක්වා ඇත.

7 මෙය, විධායකය මගින් කඩිනම් පියවර ගැනීමට ඉඩසලසාලන, පැන නැගිය හැකි ජාතික වශයෙන් වැදගත් වන විශේෂ අවස්ථාවන් පිළිබඳ යොමුවකි. එකී පියවරයන් මූලික වශයෙන් ආන්ඩු නීති සහ විශේෂ නීති සෑදීම ලෙස ගත හැකිය. සාමාන්‍ය පාර්ලිමේන්තු නීති පැනීම් ක්‍රියා පටිපාටිය කඩිනම් නොවන බැවින්, විධායකය වෙත එවැනි පියවර ගැනීමට බලය ලබා දීම අවශ්‍ය වේ. එසේ වුවත්, අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටීන් සහ එසේ සාදන ලද නීති, අවසාන වශයෙන් අත්‍යවශ්‍යයෙන්ම පාර්ලිමේන්තු පිරික්සුමට සහ පාලනයට යටත් විය යුතුය.

(2) හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරමින්, ප්‍රකාශයක් නිකුත් කිරීමෙන් අනතුරුව, හදිසි නීති රෙගුලාසි සෑදීමෙහි අරමුණ

i. පහත දැක්වෙන අරමුණු එකක් පමණක් හෝ කිහිපයක් ඉටුකර ගැනීම පිණිස හදිසි අවස්ථා රෙගුලාසි සාදන ලැබේ :

අ. ශ්‍රී ලංකාවෙහි ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම.

ආ. ශ්‍රී ලංකාවෙහි ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

ඇ. ජාතික ආරක්ෂාව ආරක්ෂා කිරීම.

ඈ. ශ්‍රී ලංකාවේ ජනතාවගේ ආරක්ෂාව සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම.

ඉ. ශ්‍රී ලංකාවේ ඒකීයත්වය, භෞමික අඛණ්ඩතාව, සහ ස්වෛරීභාවය සහ ආරක්ෂාවට එල්ලවන ප්‍රහාර වැළැක්වීම.

ඊ. මහජන සාමය සහ සාමානත්වය නැවත ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර.

උ. මහජන සාමය පවත්වාගෙන යාම, ආරක්ෂා කිරීම සහ නියාමනය කිරීම.

ඌ. අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් නැවත ක්‍රියාකාරී කිරීම, නියාමනය කිරීම, කළමනාකරණය සහ පාලනය

එ. විශාල ස්වාභාවික හෝ හදිසි ව්‍යසනයකින් පසුව ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සහ (i)හානි අවම කිරීම (ii) පීඩාවට පත් ජනතාවගේ යහපැවැත්ම ආරක්ෂා කිරීම (iii) අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් පවත්වායගන යාම සහ නැවත ප්‍රතිස්ථාපනය ආදියත් ඇතුළත්ව එම තත්ත්වයන්ට ඵලදායිව ප්‍රතිචාර දැක්වීම.

ඒ. (i) ශ්‍රී ලංකාවේ ඒකීයත්වය, භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීභාවය (ii) ජාතික ආරක්ෂාව (iii) ශ්‍රී ලංකාවේ ආරක්ෂාව (iv) ජනාතාවගේ ආරක්ෂාව (v) මහජන සාමය (vi) ජනතාවගේ යහපත සහ (vii) අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් පවත්වාගෙන යාම ආදියට අහිතකර බලපෑමක් ඇතිවන හැසිරීම් (වැරදි බවට පත්කිරීමෙන්) නීති විරෝධී කිරීම.

ඔ. එවන් වැරදි කිරීම සම්බන්ධයෙන් හදිසි නීති රෙගුලාසි යටතේ දඬුවම් දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ඕ. හදිසි නීති රෙගුලාසි යටතේ එවන් වැරදි කිරීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම.

ක. හදිසි නීති රෙගුලාසි යටතේ පුද්ගලයන් මෙවන් වැරදි කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ග. හදිසි නීති රෙගුලාසි අනුව වැරදි කළ හැකි පුද්ගලයන් ඇතුළුවීම හෝ පිටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම.

ජ. හදිසි නීති රෙගුලාසි යටතේ වරදකරුවන් හඳුනාගැනීම, අනාවරණය, අත්අඩංගුවට ගැනීම, රක්ෂිත බන්ධනාගාරගත කිරීම, පරීක්ෂණ පැවැත්වීම සඳහා ස්ථාන පරීක්ෂාව සහ පරීක්ෂණ පැවැත්වීම සඳහා චංචල දේපල අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.

ට. හදිසි නීති රෙගුලාසි යටතේ වැරදි කරන ලද අයට අපරාධ නඩු කටයුතු, නඩු විභාග සහ අධිචෝදනා ඉදිරිපත් කිරීම ආදිය ස්ථාපිත කිරීම.

ඩ. එවන් වරද කරන ලද පුද්ගලයන් මත පනවන ලද දණ්ඩන නියමයන් කළමනාකරණය කිරීමේ දඬුවම්.

ණ. හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කර ඇති තත්ත්වයන්ට අහිතකර හෝ බරපතල තත්ත්වයක් ඇතිකරන රෙගුලාසි (පාර්ලිමේන්තුව විසින් සම්මත කරන නීති සහ පළාත් සභාවින් සම්මත කරන ප්‍රඥප්ති ද ඇතුළත්ව) හෝ නීති ප්‍රතිපාදන අත්හිටුවීම, සංශෝධනය කිරීම සහ නවීකරණය කිරීම. (හදිසි තත්ත්වය ප්‍රකාශයට පත්කර ඇති තත්ත්වයට අදාළ නොවන ඕනෑම නීතියක් අත්හිටවීම, සංශෝධනය කිරීම හෝ නවීකරණය කිරීම සම්බන්ධයෙන් විශේෂිත සීමාවක් තිබිය යුතුය.)

ත. හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කර ඇති තත්ත්වයන්ට අහිතකර බලපෑමක් සිදු යකයරන මෙහෙයුම්, නීති සහ රෙගුලාසි භාවිතය සහ බලාත්මක කිරීම අත්හිටුවීම.

ද. හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කර ඇති හේතුව ශක්තිමත් කිරීම සඳහා යම් කිසි නීතියක් හෝ රෙගුලාසියක් සංසෝධන හෝ නවීකරණය කිරීම් සහිතව යොදාගැනීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.

න. ජාතික හෝ මහජන ආරක්ෂාව, ජනතාවගේ යහපත හෝ අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් පවත්වාගෙන යාම සඳහා යම් කිසි දේපළක් හෝ සේවාවක් අයත්කර ගැනීම, පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම හෝ භාවිතා කිරීම.

ප. ජාතික හෝ මහජන ආරක්ෂාව, ජනතාවගේ යහපත හෝ අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් පවත්වාගෙන යාම සඳහා යම් කිසි සේවාවක් අත්‍යවශ්‍යය බවට ප්‍රකාශයට පත් කිරීම.

බ. යම් යම් ස්ථාන තහනම් හෝ සීමාකරන ලද බවට ප්‍රකාශයට පත්කිරීම සහ ඒ ස්ථාන වලට අදාළව කොන්දේසි පැනවීම.

ම. නිශ්චය කරන ලද ස්ථානවලට හෝ ඉන් පිටතට ජනතාව ගමන් කිරීම සීමා කිරීම.

ය. පොදු ජනතාවගේ සාමාජිකයන් පොදු ස්ථානවලට ඇතුළත්වීම හෝ පිටවීම සම්බන්ධයෙන් රෙගුලාසි.

ර. ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීම

ල. හදිසි නීති රෙගුලාසි බලාත්මක කිරීම සඳහා ඒවා අධීක්ෂණය කිරීම සහ පරීක්ෂාවට ලක් කිරීම සඳහා 'නිසි බලධාරීන්' පත් කිරීම.

ව. අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් සැපයීම කළමනාකරණය සහ පරිපාලනයට 'නිසි බලධාරීන්' පත් කිරීම.

ස. සිවිල් පරිපාලනය සම්බන්ධීකරණය සඳහා 'නිසි බලධාරීන්' පත්කිරීම.

හ. හදිසි නීති රෙගුලාසි සම්මත කිරීම නිසා පීඩාවට පත්වන පුද්ගලයන්ට සහන සැපයීම සඳහා සමාලෝචන මණ්ඩල පත් කිරීම.

ළ. හදිසි නීති රෙගුලාසිවල ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හමුදාව කැඳවීම.

(අ) හදිසි තත්ත්වය ප්‍රකාශයට පත්කිරීමට හේතුවූ තත්ත්වය නිසා ඇතිවූ තත්ත්වයන් තුළ පීඩාවට පත්වූ හෝ ඉන් බලපෑමට ලක්වූ ඕනෑම පුද්ගලයෙකුට සහන සැලසීම.

(ආ)හදිසි නීති රෙගුලාසි බලාත්මක කිරීමේදී පීඩාවට පත්වන පුද්ගලයන්ට වන්දි ගෙවීම සඳහා සහන සැපයීම .

(ඇ)හදිසි නීති රෙගුලාසි මෙහෙයුම් හෝ බලාත්මක කිරීම සඳහා සේවා සපයන පුද්ගලයන්ට ගාස්තු ගෙවීම.

ii. ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු

iii. හදිසි නීති රෙගුලාසි සකස් කළ හැකි වන්නේ රටෙහි ඇතිවී තිබෙන හදිසි තත්ත්වයකට ප්‍රතිචාර දැක්වීම සඳහා පමණි.

iv. හදිසි තත්ත්වයක් ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව ඇති වී තිබෙන තත්ත්වය එක් පළාතකට පමණක් සීමා වන්නේ නම් හදිසි තත්ත්වය ප්‍රකාශයට පත්කිරීම එම විශේෂිත පළාතට පමණක් සීමා කළ යුතුය.

v. වෙනත් කිසිම හේතුවක් සඳහා හදිසි අවස්ථා රෙගුලාසි සකස් නොකළ යුතුය.

vi. හදිසි නීති රෙගුලාසි සහ එම රෙගුලාසි බලගැන්වීම හෝ ක්‍රියාත්මක කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පනවා ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට කිසිදු අහිතකර බලපෑමක් හෝ කඩකිරීමකට ලක්වීමක් සිදු නොවිය යුතුය. කෙසේ වෙතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් යම් කිසි වෙනස්කිරීමක් කිරීමට අවසර ලබා දී ඇති සීමාව තුළ යම් යම් අයිතිවාසිකම් භුක්ති විඳීම මත යම් බලපෑමක් ඇතීම හදිසි අවස්ථා නීතිය නිසා සිදුවිය හැකිය.

3. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට සහ හදිසි තත්ත්ව රෙගුලාසි හා හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනයෙහි අන්තර්ගතය සෑදීමට බලය පැවරිය යුත්තේ කවුරුන් හටද? :

i. හැකි සෑම අවස්ථාවකම අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසමින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමටත් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම අනුව හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීමටත් ජනාධිපතිවරයාට බලය පැවරිය යුත්තේය.[8]

ii. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනයක් සෑදීමට පෙර ප්‍රායෝගික වන්නේ නම්, ජනාධිපතිවරයා දේශපාලන පක්ෂ නායකයන්ගේ අදහස් විමසිය යුතුය.[9]

iii. ජනාධිපතිවරයා මිය ගොස් නම්, අශක්නුකෘත නම් හෝ සිය පාලනයයන් ඔබ්බෙහි වූ හේතු මත වෙනත් ආකාරයකින් සිය බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයේ පසුවන්නේ නම් හා වැඩබලන ජනාධිපතිවරයකු පත් කරනු ලැබ නොමැත්තේ නම්, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට සහ හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීමට අග්‍රාමාත්‍යවරයාට (ඔහුගේ පාර්ශවයෙන් යම් අනීතික හැසිරීමක් ජනාධිපතිවරයාගේ මරණයට හෝ ජනාධිපතිවරයාට සිය බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට නොහැකි අශක්නුකෘත තත්ත්වයට හෝ නොහැකියාවට මඟ පාදා නොමැති නම්) බලය පැවරිය යුත්තේය.

8 ජනාධිපතිවරයා රාජ්‍යයෙහි විධායක අංශයෙහි ප්‍රධානියා ලෙස තවදුරටත් සිටිනු ඇත යන පදනමින් මෙම විධිවිධානය සකස් කරන ලදී. කෙසේ වෙතත් මෙහෙයුම් කමිටුව විසින් තීරණය කර ඇතැයි කියයවන පරිදි අග්‍රාමාතවරයා රටේ විධායකයෙහි ප්‍රධානියා වුවහොත්, මෙම විධිවිධානය පහත සඳහන් පරිදි කියවිය යුතුය: අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට සහ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීමට ජනාධිපතිවරයාට බලය පැවරිය යුත්තේය. ඉන් අනතුරුව යෙදන විධිවිධාන ද අවශ්‍ය වෙනස්කම් සහිතව යෙදිය යුතු වනු ඇත.

9 ගරු මාවෙ සේනාදිරාසා මහතා විසින් කරන ලද යෝජනාවකට අනුව මෙම අවශ්‍යතාව එකතු කරන ලදී -2016 ජුනි 24 වැනි දින රැස්වීමේ කාර්ය සටහන් බලන්න.

iv. ජනාධිපතිවරයා සහ අග්‍රාරාමාතයවරයා යන දෙදෙනාම මිය ගොස් නම්, අශක්නුකෘත නම් හෝ සිය පාලනයෙන් ඔබ්බෙහි වූ හේතු මත වෙනත් ආකාරයකින් සිය බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයද පසුවන්නේ නම් හා වැඩබලන ජනාධිපතිවරයකු සහ වැඩබලන අග්‍රාමාතවරයකු පත් කරනු ලැබ නොමැත්තේ නම්, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට සහ හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීමට නීතිය සහ සාමය යන විෂය භාර අමාත්‍යවරයාට (ඔහුගේ පාර්ශවයන් යම් අනීතික හැසිරීමක් ජනාධිපතිවරයාගේ සහ අග්‍රාමාත්‍යවරයාගේ මරණවලට හෝ ජනාධිපතිවරයාට සහ අමාත්‍යවරයාට සිය බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට නොහැකි අශක්නුකෘත තත්ත්වයට හෝ නොහැකියාවට මගපාදා නොමැති නම්) බලය පැවරිය යුත්තේය.

v. ජනාධිපතිවරයා හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට තමන් වෙත පැවරී ඇති බලය ක්‍රියාත්මක කර, ජාතික ආරක්ෂක මණ්ඩලයේ උපදෙස් මත හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීම කළ යුත්තේය.

vi. නිවේදනයක් සාදා එම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කිරීම මගින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම කළ යුත්තේය.

vii. හදිසි තත්ත්වය වහාම බලාත්මක වන්නේද යන්න හෝ එසේ නොමැති නම් එය බලාත්මක වන දිනය සහ වේලාව එම නිවේදනයෙහි අඩංගු විය යුතුය. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හේතු සහ එම තත්ත්වය බලපවත්වන ප්‍රදේශය සහ කාල පරිච්ඡේද එම නිවේදනයෙහි සඳහන් විය යුතුය.

4. නිවේදනය නිකුත් කිරීමෙන් පසු හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීම:

i. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනයක් කිරීමෙන් අනතුරුව හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හේතුවූ කරුණුවලට සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීම පිණිස හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීම සඳහා අදාළ වන පරිදි ජනාධිපතිවරයාට හෝ අග්‍රාමාත්‍යවරයාට හෝ නීතිය සහ සාමය යන විෂය භාර අමාත්‍යවරයාට බලය පැවරිය යුත්තේය.

ii. ජාතික ආරක්ෂක මණ්ඩලයේ උපදෙස් මත හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීම කළ යුත්තේය.

iii. එම හදිසි තත්ත්ව රෙගුලාසි වහාම ගැසට් පත්‍රයෙහි පළ කළ යුත්තේය.

5. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනයක් කිරීමේදී හා ඒ යටතේ හදිසි තත්ත්ව රෙගුලාසි සෑදීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය:

i. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනයක් කිරීමෙන් පසු අදාළ වන පරිදි ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ නීතිය සහ සාමය යන විෂය භාර අමාත්‍යවරයා හැකිතාක් ඉක්මනින් අමාත්‍ය මණ්ඩලය අමතා නිකුත් කරන ලද නිවේදනයට අමාත්‍ය මණ්ඩල එකඟතාව ලබා ගත යුතුය. නිකුත් කරන ලද නිවේදනයට අමාත්‍ය මණ්ඩලය එකඟතාව නොවුවොත් අදාළ වන පරිදි ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ නීතිය සහ සාමය යන විෂය භාර අමාත්‍යවරයා එම නිවේදනය පිරිසුන් කළ යුතුය.

ii. නිවේදනය නිකුත් කිරීමට සහ රෙගුලාසි සෑදීමට හේතු වූ කරුණු අඩංගු නිල නිවේදනයක්ද සමග හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනය සහ හදිසි තත්ත්ව රෙගුලාසි වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

iii. නිවෙදනය සහ රෙගුලාසි ලැබීමේ සිට දින 7ක් ඇතුළත හැකි තාක් ඉක්මනින් පාර්ලිමෙන්තුව රැස්වී එකී නිවේදනය සහ රෙගුලාසි සලකා බැලීම සඳහා ගත යුතුය.

iv. පාර්ලිමේන්තුව යෝජනාවක් බහුතර ඡන්දයෙන් සම්මත කිරීම මගින් නිවේදනය හෝ රෙගුලාසි සෑදීම අනුමත කිරීම හෝ නොකිරීම සිදු කළ යුතුය. එකී රෙගුලාසි වලට සම්පූර්ණයෙන්ම හෝ ඒවායින් කොටසකට විරුද්ධ වීමට හෝ එකී රෙගුලාසි සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුවට හිමිකම තිබිය යුත්තේය.

v. පාර්ලිමෙන්තුව විසින් නිවේදනය අනුමත කෙරෙනුයේ නම්, පාර්ලිමෙන්තුව විසින් වෙනයම් ආකාරයකට තීරණය කරනු ලබන්නේ නම් (නිවේදනය අඩු කාලසීමක් සඳහා බල පැවැත්විය යුතු බවට), එවන් නිවේදනයක් සිදු කිරීමේ සිට දින 30 ක කාලසීමාවක් සඳහා හදිසි අවස්ථාව බලාත්මක වන්නේය. සංශෝධන සහිතව හෝ රහිතව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන රෙගුලාසි ද, ඒවා සම්බන්ධයෙන් සැලකීමේ දී එම රෙගුලාසි සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් අඩු කාලසීමාවක් සඳහා බලාත්මකවීම අවසන් විය යුතු බවට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන්නේ නම් හැර දින 30 ක කාලයක් සඳහා බලාත්මකව පවතින්නේය. පාර්ලිවෙන්තුව විසින්

රෙගුලාසි එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සංශෝධනය කරනු ලබන්නේ, එම සංශෝධිත පිටපත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නේය.

vi. පාර්ලිමේන්තුව නිවේදනය සහ රෙගුලාසි සම්බන්ධයෙන් එම රෙගුලාසි සහ ඒවායින් කොටසක් අනුමත නොකරනුයේ නම් නිවේදනය සහ රෙගුලාසි සම්පූර්ණ වශයෙන් හෝ එහි එක් කොටසක් බලාත්මකවීම අවසන් වන්නේය.

vii. හදිසි රෙගුලාසි සම්පූර්ණයෙන්ම හෝ ඉන් එකක් හෝ කිහිපයක් ගත් කළ ඒවායේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීමටත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් ලබාදීමේ බලය ලබා ගැනීමටත් පාර්ලිමේන්තුවට හිමිකම ඇත්තේය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එවන් මතයක් විමසීමේදී, පැවැත්වීමට නියමිත විභාග කිරීම සම්බන්ධයෙන් අධිකරණය විසින් ප්‍රසිද්ධ දැනුම් දීමක් නිකුත් කළ යුතු අතර විභාග කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලබන නීතිපතිවරයා හෝ එවන් වෙනත් පාර්ශවයක් විභාග කිරීමට ලක් කොට, ශ්‍රේෂ්ඨාධිකරණ මතය ඉල්ලීමේ සිට දින 10ක් ඇතුළත, එම මතය ලබාදිය යුත්තේය. ශ්‍රේෂ්ඨාධිකරණ පූර්ණ විනිසුරු මඬුල්ලක් විසින් එවන් කාරණාවක් විභාග කොට අධිකරණ මතය පිළියෙළ කළ යුත්තේය.

viii. ජාතික ආරක්ෂක සභාවේ සමාජිකයන් එක් අයකු හෝ වැඩි දෙනෙකු (ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා හැර) කැඳවීමට සහ අදහස් ලබා ගැනීමට පාර්ලිමේන්තුවේ ආරක්ෂක සහ නීතිය හා සාමය පිළිබඳ උපදේශක කාරක සභාවන්ට හිමිකම තිබෙන අතර හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හේතු විමසීමට ද හිමිකම ඇත්තේය. ආරක්ෂක උපදේශක කාරක සභාවේ වැඩ කටයුතු රහසේ සිදු කළ යුත්තේය.

6. හදිසි තත්ත්වය සහ හදිසි රෙගුලාසි බලාත්මකව පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය.

i. අඩු කාලසීමාවක් තුළදී නිවේදනය සහ රෙගුලාසි අලුත් කිරීමට සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුව තීරණය කරනුයේ නම් හැරුණු විට, පාර්ලිමේන්තුව විසින් සෑම දින 30 කට වරක්ම හදිසි තත්ත්වය සහ රෙගුලාසි දීර්ඝ කිරීම සඳහා සලකා බැලිය හැක්කේය. පාර්ලිමේන්තුව සුළු බහුතරයක් මගින් හදිසි අවස්ථා තත්ත්වය සහ හෝ හදිසි රෙගුලාසි වලින් එකක් හෝ කිහිපයක් අත්හිටුවීමට තීරණය කරනුයේ නම්, අදාළ අවස්ථාව පරිදි නිවේදනය හෝ රෙගුලාසි හෝ එවන් රෙගුලාසි එකක් හෝ කිහිපයක් බලපැවැත්වීම එයින් වහාම අවසන් වන්නේය.

ii. දින 180 ක කාලසීමාවක් තුළ දී මාස 03 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා හෝ දින 90 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා අඛණ්ඩව හදිසි තත්ත්වය ක්‍රියාත්මකව පවතිනුයේ නම්, ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා හෝ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා විසින් අදාළ අවස්ථාව පරිදි පාර්ලිමේන්තුව අමතා හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කිරීමට සිදු වූයේ මන්ද යන්න පිළිබඳව හේතු දක්වනු ලබන්නේය.

iii. දින 180 ක කාලසීමාවක් තුළදී මාස 03 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා හෝ දින 90 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා අඛණ්ඩව හදිසි තත්ත්වය ක්‍රියාත්මකව පවතිනුයේ නම් එවන් හදිසි තත්ත්වය දීර්ඝ කිරීමක් සඳහා එම දීර්ඝ කිරීමට පක්ෂව විශේෂ බහුතර[10] ඡන්දයක් අවශ්‍ය වන්නේය.

7. (අ) හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරමින් නිවේදනයක් සිදු කිරීමේ සහ (ආ) හදිසි රෙගුලාසි පිළිබඳ අධිකරණ සමායලෝචනය.

i. හදිසි තත්ත්වයක් නිවේදනය කිරීමෙන් අනතුරුව ඕනෑම වෙලාවක ඕනෑම පුද්ගලයකු විසින් පහත සඳහන් තත්ත්වයන්ගෙන් එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් චෝදනා කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කළ හැකි අතර එවන් කාරණාවන් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රකාශයක් ඉල්ලා සිටිය හැකිය:

අ. හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමේ යෝග්‍යතාවයක් නොමැති බව, ප්‍රමාණවත් හේතුවක් නොමැති බව හෝ එය අසාධාරණ බව

ආ. හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම සිදුකොට ඇත්තේ අසද්භාවයකින් හෝ සමපාර්ශ්වීය අරමුණු සඳහා බව

ඇ. හදිසි රෙගුලාසි වලින් එකක් හෝ කිහිපයක් අදාළ අවස්ථාව පරිදි, ජනාධිපතිවරයාගේ, අග්‍රාමාත්‍යවරයාගේ හෝ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාගේ බලතල ඉක්මවා යන බව

ඈ. හදිසි රෙගුලාසිවලින් එකක් හෝ කිහිපයක් සකස් කොට ඇත්තේ අසද්භාවයකින් හෝ සමපාර්ශවීය අරමුණු සඳහා බව.

ඉ. හදිසි රෙගුලාසි වලින් එකක් හෝ කිහිපයක් ව්‍යවස්ථාවේ විධි විධානයන්ට අනුකූල නොවන බව.

ii. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවවලින් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් ඉදිරියේ පවත්වනු ලබන ක්‍රියා පටිපාටියේදී ශ්‍රේෂ්ඨාධිකරණය

10. මෙම විශේෂ බහුතර ඡන්දයේ ස්වභාවය (එනම් 2/3ක්ද යන්න) නිශ්චය නොකිරීමටත්, එය මෙහෙයුම් කමිටුව මගින් තීරනය කිරීම පිණිස විවෘතව තැබීමටත් ආණ්ඩුකාරක සභාව තීරණය කළාය.

විසින් පෙත්සම්කරු සහ නීතිපතිවරයා විභාගයට ලක් කරනු ලැබේ. පෙත්සම පිරවීමේ සිට දින 07 ක් ඇතුළත නඩු විභාගය පවත්වනු ලබන්නේය. නඩු විභාගය පවත්වා අවසාන කිරීමේ සිට සතියක කාලයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව දැනුම්දිය යුත්තේය.

iii. හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනය යෝග්‍යතාවයක් නොමැති වූවක් බව හෝ අසද්භාව යකින් සිදුකොට ඇති බව හෝ ව්‍යවස්ථාවට පටහැනි බව හෝ ජනාධිපතිවරයා විසින් සකසන ලද රෙගුලාසි සියල්ලම හෝ එකක් හෝ කිහිපයක් අසද්භාවය කලින් සිදුකොට ඇති බව හෝ ව්‍යවස්ථාවට අනුකූල නොවන බව හෝ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් තීන්දු කොට ප්‍රකාශ කළ හැක්කේය.

iv. හදිසි රෙගුලාසිවලින් එකක් හෝ කිහිපයක් ජනාධිපතිවරයාගේ බලතල ඉක්මවා යන ආකාරයේ නම් හෝ ව්‍යවස්ථාවට පටහැනි බවට හෝ තීන්දුවක් ලබා දෙනු ලැබේ නම්, එවන් රෙගුලාසිවල නෛතික බලපෑම ඉන් අවසන් වන්නේය.

v. ශ්‍රේෂ්ඨාධිකයෙහි මතය සැලකිල්ලට ගත යුතු වේ.

8. ජාතික ආරක්ෂක මණ්ඩලය

i. පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ආරක්ෂක මණ්ඩලයක් තිබිය යුත්තේය :

අ. ජාතික ආරක්ෂාවට, ශ්‍රී ලංකාවේ ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවයට සහ ස්වෛරීභාවයට එල්ල වන තර්ජනයන්ට සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක උපායමාර්ගවලට අදාළ රහස් තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට.

ආ. එම රහස් තොරතුරු ක්‍රියාවලිගත කිරීමට සහ විශ්ලේෂණය කිරීමට.

ඇ. ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව, ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාව්‍ය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සකස් කිරීමට.

ඈ. මහජන සාමයට බාධාකිරීමට අදාළ සහ අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් සපයා දීම අදාළ කරුණු පිළිබඳව අධීක්ෂණය කිරීමට.

ඉ. ජනාධිපතිවරයාට යුද්ධ ප්‍රකාශ කිරීම නිර්දේශ කිරීමට.

ඊ. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව සහ පැනවිය යුතු හදිසි අවස්ථා නියමයන් පිළිබඳව ජනාධිපතිවරයාට උපදෙස් දීමට.

උ. හදිසි අවස්ථා නියමයන් බලාත්මක කිරීම සහ යොදා ගැනීම පාලනය කිරීමට.

ii. හදිසි අවස්ථා නියමයන් බලාත්මක කිරීම සහ යොදා ගැනීම අධීක්ෂණය කිරීම ජාතික ආරක්ෂක මණ්ඩලයේ වගකීම විය යුත්තේය.

iii. සාමාන්‍ය තත්ත්වය ස්ථාපනය කර අවසන් වූ විගස, හදිසි තත්ත්වය ඉවත් කිරීමට පියවර ගන්නා ලෙසට ජාතික ආරක්ෂක මණ්ඩලය විසින් ජනාධිපතිවරයාට උපදෙස් දිය යුත්තේය. ඒ අනුව, ජනාධිපතිවරයා විසින් හදිසි තත්ත්වය ඉවත් කළ යුත්තේය.

iv. රටෙහි පවතින තත්ත්වය සැලකිල්ලට ගැනීයම්දී, කිසියම් හදිසි අවස්ථා නියමයන් එකක් හෝ වැඩි ගණනක් අවශ්‍ය නොවන බව ජාතික ආරක්ෂක මණ්ඩලයෙහි මතය වන්නේ නම්, එවැනි නියමයන් ඉවත් කරන ලෙසට මණ්ඩලය විසින් ජනාධිපතිවරයාට උපදෙස් දිය යුත්තේය. ඒ අනුව, ජනාධිපතිවරයා විසින් එම හදිසි අවස්ථා නියමයන් ඉවත් කළ යුත්තේයඃ

v. ජාතික ආරක්ෂක මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුත්තේයඃ

අ. ජනාධිපතිවරයා (සභාපති)

ආ. අග්‍රාමාත්‍යවරයා

ඇ. නීතිය හා සාමය විෂය භාර අමාත්‍යවරයා හෝ එම අමාත්‍යවරයා නොමැති අවස්ථාවලදී එම අමාත්‍යංශයේ ලේකම්වරයා

ඈ. විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයා හෝ එම අමාත්‍යවරයා නොමැති අවස්ථාවලදී එම අමාත්‍යංශයේ ලේකම්වරයා

ඉ. නීතිපතිවරයා

ඊ. ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා

උ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී

ඌ. යුද හමුදාපති

එ. නාවික හමුදාපති

ඒ. ගුවන් හමුදාපති

ඔ. පොලිස්පති

ඕ. ජාතික බුද්ධි අංශයේ ප්‍රධානී

ක. රාජ්‍ය රහස් තොරතුරු සේවයේ ප්‍රධානී

ග. ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා සමග සාකච්ඡා කර පත්කරනු ලබන පුද්ගලයින් දෙදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්.

9. විවිධ

i. මෙම පරිච්ඡේදය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අයුතු ලෙස යොදා ගැනීම ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට හේතුවක් විය යුත්තේය.

ආචාර්ය. එන්.ඩී. උඩගම
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලිය පිළිබඳ මහජන මත විමසුම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලිය පිළිබඳ මහජන මත විමසුමක් සිදුකරන ලදි. එම වාර්තාවේ සංක්ෂිප්ත සටහනක් මෙහි දැක්වේ.

Making Social Research Count

- දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියක් සිදුවන බව හොඳින්ම දන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 1% පමණි.

- 21.9%කට කිසියම් දැනුමක් පවතින අතර 34.1%ක් එය සිදුවෙමින් පවතින බව දන්නා නමුත් එහි විස්තර හා දැනට පවතින තත්වය ගැන නොදනී.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් 25%ක් දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියක් සිදුවෙන බව දන්නේම නැත.

- උතුරු සහ නැගෙනහිර පළාත්වල එම ක්‍රියාවලිය පිළිබඳ ඉහළම මට්ටමේ දැනුවත් භාවයක් පවතින අතර උතුරු පළාතේ 2.8%ක් හොඳින්ම දනිති. 42.3%කට කිසියම් දැනුමක් පවතී. නැගෙනහිර පළාතේ 4%ක් හොඳින්ම දන්නා අතර 34.7%කට කිසියම් දැනුමක් පවතී.

- සබරගමුව පළාතේ 60%ක් දැනට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියක් සිදුවෙමින් පවතින බව දන්නේම නැත. බස්නාහිර පළාතේ 50% වැනි

සංඛ්‍යාවක් දැනට එවැනි ක්‍රියාවලියක් සිදුවන බව දන්නා නමුත් එහි විස්තර සහ දැනට පවතින තත්වය කිසිත් දන්නේ නැත.

■ මෙම සමීක්ෂණය අනුව ශ්‍රී ලාංකිකයන්ගෙන් 70%ක් පමණ ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව (PRC) හා එහි වැඩ කටයුතු ගැන ගැන අසා නැත. 0.7%ක් තමන් හොඳින්ම ඒ ගැන දන්නා බව පැවසූ අතර 8.7%ක් තමන්ට කිසියම් දැනුමක් ඇති බව පැවසූහ. 21%ක් මහජන අදහස් විමසීමේ කමිටුව ගැන දැන සිටි නමුත් එහි ක්‍රියාකාරිවය ගැන දන්නේ නැත.

■ පළාත් මට්ටමේ ඌව (83.6%) සහ වයඹ (76.8%) මහජන අදහස් විමසීමේ කමිටුව ගැන අඩුවෙන්ම දැන සිටි පළාත් ය. බටහිර සහ වයඹ පළාත්වල 30%ක්ම මහජන අදහස් විමසීමේ කමිටුව ගැන අසා තිබූ නමුත් එහි ක්‍රියාකාරිත්වය ගැන දැනුවත්ව නැත. මහජන අදහස් විමසීමේ කමිටුව හා එහි ක්‍රියාකාරකම් ගැන ඉහළම දැනුවත් භාවයක් දැක් වූයේ උතුරු පළාතේය. එම අනුපාතය 30%කි.

■ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය ගැන ද එවැනිම දැනුවත් භාවයේ අඩුවක් පවතී. ශ්‍රී ලාංකිකයන්ගෙන් 76.8%ක් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය ගැන අසා දැන සිටියේ නැති අතර 14%ක් ඒ ගැන අසා සිටි නමුත් එහි ක්‍රියාකාරකම් ගැන දැනුවත්ව නැත.

■ ශ්‍රී ලාංකිකයන්ගෙන් 60%ක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ එහි වැදගත්කම සහ වටිනාකම වැනි කරුණු මහ ජනතාවට සන්නිවේදනය කිරීමට ආණ්ඩුව අපොහොසත් වූයේයැයි පැවසූහ. 4.8%ක් ආණ්ඩුව සාර්ථක වූයේයැයි පැවසූ අතර 21.5%ක් ආණ්ඩුව කිසියම් සාර්ථකත්වයක් අත් කර ගත් නමුත් ඊට වැඩි දෙයක් කළ යුතුව තිබුණේයැයි පැවසූහ.

■ අපට නව ව්‍යවස්ථාවක් අවශ්‍යදැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් ඇසූ විට විවිධ මත තිබිණ. 33.9%ක් නව ව්‍යවස්ථාවක් අවශ්‍යයැයි පැවසූ අතර 33.6%ක් නව ව්‍යවස්ථාව සමහර වෙනස්කම් සහිතව දිගටම පවත්වා ගත යුතුයැයි විශ්වාස කරයි. සැලකිය යුතු කාරණය වන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 20%ක්ම අපට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය ද යන්න හෝ පවතින ව්‍යවස්ථාව දිගටම පවත්වා ගත යුතුද යන්න නොදැන සිටීමය.

■ යහ පාලන ආණ්ඩුවේ මූලික මැතිවරණ පොරොන්දුවක් වූ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතුද යන ප්‍රශ්නය ගැන ද නැවතත් බෙදීමක් පවතී. 35.7%ක් විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතුයැයි පවසති. 40.3%ක් ඊට සහාය නොදක්වන අතර 24%කට ඊට සහාය දක්වන්නේද නැද්ද යන්න ගැන දැනුවත් භාවයක් නැත.

■ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමට වැඩිම සහාය ඇත්තේ වයඹ (48.6%) හා සබරගමුව (44%)

www.dailymail.co.uk

ජනාධිපති ක්‍රමය අහෝසි කළයුතු යැයි ඒකමතික ස්ථාවරයේ ඉන්නවා. ඒ වෙනුවට ගේන්නෙ මොකක්ද කියල තවම තීරණයක් අරන් නෑ. එකක් තමයි වෙස්මිනිස්ටර් ක්‍රමය, පාර්ලිමේන්තුවේ වැඩිම සහයෝගය තිබෙන මන්ත්‍රී අගමැති ලෙස පත්කිරීම. ස්ථාවර ආණ්ඩුවක් පත් කර ගැනීමට ඒ ඒ පක්ෂවලට තමන්ගේ අගමැති අපේක්ෂකයා නම් කරන්න පුලුවන්. ඒ අනුව පත්වෙන ආණ්ඩුව අවු 2 ක කාලයකට පෙරලන්න බැරි ක්‍රමයක් ඉදිරිපත් වෙලා තියෙනවා.

පළාත්වල වන අතර දකුණු සහ නැගෙනහිර පළාත්වල 50% ක් වැනි ප්‍රමාණයක් තමන් ඊට සහාය නොදක්වන බව පැවසූහ. මධ්‍යම පළාතේ 50%කටම ඒ ගැන තීරණයක් නැත.

■ දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2 වගන්තියේ ''ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයකි'' යනුවෙන් සඳහන් වේ. ශ්‍රී ලාංකිකයන්ගෙන් 63.6%ක් නව ව්‍යවස්ථාවේ ද එම වගන්තිය පවත්වා ගත යුතුයැයි විශ්වාස කරති. මෙම මතය වැඩි වශයෙන්ම (77.7% ක්) සිංහල ප්‍රජාව අතර පවතින අතර දෙමළ 14.3%ක් ද, 18.1%ක් උඩරට දෙමළ ප්‍රජාව ද, 28.8%ක් මුස්ලිම් ප්‍රජාවද ඒ ආකාරයෙන්ම පවසති.

■ බුද්ධාගමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ ස්ථානයක් හිමි විය යුතු ද යන ප්‍රශ්නයට සිංහල ප්‍රජාවගෙන් 77%ක්ම එසේ විය යුතුයැයි තදින්ම කියන අතර සන්සන්දනාත්මකව දෙමළ 73.3%ක්, උඩරට දෙමළ 89.2%ක් මුස්ලිම් ප්‍රජාවගෙන් 71.4%ක් බුද්ධාගමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ තැනක් දිය යුතුය යන්නට තදින් විරුද්ධ වෙති.

■ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවගෙන් 90%ක්ම සහ උඩරට දෙමළ ප්‍රජාවගෙන් 96.4%ක් ද,සිංහල ප්‍රජාවගෙන් 63.7%ක් සියලුම ආගම්වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමාන තත්වයක් ලබා දිය යුතුයැයි දැඩිව එකඟ වෙති.

■ පළාත් සභාවල බලතල වැඩි කළ යුතුදැයි විමසූ විට ශ්‍රී ලාංකිකයන්ගෙන් 44%ක් එය වැඩි කළ යුතුයැයි පැවසූ අතර 31.6%ක් බලතල වැඩි කළ යුතු නැතැයි කියති. 24.4%ක් තමන් ඒ ගැන නොදන්නා බව කියති.

■ පළාත් දැක්මක් අනුව පළාත් සභාවල බලතල වැඩි කිරීමට වැඩිම සහාය ඇත්තේ උතුරු (77.8%) නැගෙනහිර (60%) හා සබරගමුව (59.2%) පළාත්වලය. දකුණු පළාතේ 50%ක් බලතල වැඩි නොකළ යුතුයැයි කියති.

■ පළාත් සභාවල බලතල වැඩි කළ යුතුයැයි පැවසූ අයට ලැයිස්තුවක් ලබා දී ඔවුන් වැඩි කිරීමට එකඟ වන්නේ කුමන බලතලදැයි ඇසූ විට, සියලුම පළාත්වල පිළිතුරු දුන් අයගෙන් 80%කට වැඩි ප්‍රමාණයක් ලැයිස්තුවේ සඳහන් සියලුම බලතල පාහේ වැඩි කළ යුතුයැයි එකඟ වූ අතර (i) ආයෝජන සහ විදේශ ආධාර ලබා ගැනීම, (ii) නීතිය සහ සාමය පවත්වා ගැනීම සහ (iii) රජයේ ඉඩම් බෙදා දීම සහ නැවත පදිංචි කිරීම යන කරුණු ගැන එකඟතාවයේ වෙනස්කම් පවතී. කෙසේ වුවත් පළාත් සභාවල බලතල වැඩි කිරීම පිළිබඳව උතුරු සහ නැගෙනහිර පළාත්වල 85%කට වඩා වැඩි ප්‍රමාණයක ගේ සහාය පවතී.

■ පළාත් සභාවල බලතල වැඩි නොකළ යුතුයැයි පැවසූ අයගෙන් පළාත් සභා අහෝසි කළ යුතුද නැතිනම් දැනට පවතින ආකාරයට පවත්වා ගෙන යා යුතුදැයි ඇසූ විට බහුතරයකගේ අදහස වූයේ පවතින ආකාරයටම පවත්වා ගෙන යෑම වුවත් වයඹ පළාතේ පිළිතුරු දුන් අයගෙන් හරි අඩක්ම තමන් නොදන්නා බව පැවසූහ.

■ පළාත් සභා බලතල වැඩි කරන්නේ නම් විධායක ජනාධිපති තනතුර පවත්වා ගත යුතුදැයි ඇසූ විට ශ්‍රී ලාංකිකයන්ගෙන් 43.6%ක් ඔව් කී අතර 15.2%ක් එම තනතුරු පවත්වා ගත යුතු නොවන බව කීහ. 41.2%ක සැලකිය යුතු ප්‍රමාණයක් තමන් නොදන්නා බව පැවසූහ.

■ පළාත් සභාවල බලතල වැඩි කළ ද විධායක ජනාධිපති ක්‍රමය පවත්වා ගැනීමට වැඩිම සහායක් ලැබෙන්නේ වයඹ (60.3%) සහ සබරගමුව (58%) පළාත්වලිනි. පළාත් සභා බලතල වැඩි කරන්නේ නම් විධායක ජනාධිපති ක්‍රමය පවත්වා ගැනීම අනවශ්‍ය බව උතුරු පළාතේ 43.8% කීහ.

මේ සම්බන්ධ ප්‍රස්ථාර කවරයේ ඇතුළු පිටුවේ සහ පිට කවරයේ පළවේ.

1.1 දැනුවත් වීම :
ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය

C P A



- ඉතා හොඳින් දැනුවත්
- යම්තාක් දුරට දැනුවත්
- ක්‍රියාවලිය ගැන දැනුවත්, එහෙත් වැඩි තොරතුරු සහ වර්තමාන තත්ත්වය ගැන නොදනී.
- වර්තමානයේ සමස්ථ සම්පාදන ක්‍රියාවලියක් පිළිබඳව නොදනී.
- නොදනී / ප්‍රතිචාරයක් නොමැත.

3.0 දැනුවත් වීම :
ව්‍යවස්ථාදායක සභාව

C P A

- ඉතා හොඳින් දැනුවත්
- යම්තාක් දුරට දැනුවත්
- ව්‍යවස්ථාදායක සභාව පිළිබඳව අසා ඇති නමුත් එහි ක්‍රියාකාරකම් පිළිබඳව නොදනී.
- ව්‍යවස්ථාදායක සභාව ගැන අසා නැත.
- ප්‍රතිචාරයක් නොමැත.



2.1 දැනුවත් වීම :
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව

C P A



- ඉතා හොඳින් දැනුවත්
- යම්තාක් දුරට දැනුවත්
- කමිටුව ගැන අසා ඇති නමුත් එහි ක්‍රියාකාරකම් පිළිබඳව නොදනී.
- කමිටුව ගැන නොදනී.
- ප්‍රතිචාරයක් නොමැත.

2.0 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව :
විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම.

C P A

- ඔව්
- නැත
- නොදනී



යහපාලන ආණ්ඩුවේ ප්‍රධාන ඡන්ද පොරොන්දුවක් වූ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කිරීම යන ප්‍රශ්නයේදී, ලාංකිකයන් නැවත වෙනස් ස්ථාවරයන්හි සිටින බව පෙනී ඇත. 35.7% ලාංකිකය විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතු ස්ථාවරයේ සිටිය අතර, 40.3%ක් එයට එකඟ නොවූහ. 24%ක් මෙය පිළිබඳව අදහසක් තිබුණේ නැත.









ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් - නො. 5A, ස්ටෝර්ක් පෙදෙස, කොළඹ 10 - දුරකථන : 0777-315971

ISSN 955-1800-0061